WMC
කාන්තාව සහ මාධ්‍ය සාමූහිකය
பெண்கள் மற்றும் ஊடகக் கூட்டமைப்பு
Women and Media Collective
Established 1984





# දිරියක අදිසි මෙහෙවර

ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක තුනක ස්ත්‍රීන්ගේ වැටුප් රහිත සුරැකුම් වැඩ සහ දේශගුණික විපර්යාස අතර අන්තර් සම්බන්ධය ගවේෂණය කිරීමේ නියමු අධ්‍යයනයකි.

කර්තෘ හිමිකම © කාන්තාව සහ මාධ්‍ය සාමූහිකය
පළමු ප්‍රකාශිත වර්ෂය: 2026 පෙබරවාරි

ISBN: 978-624-5868-20-9

**ප්‍රකාශනය:**
කාන්තාව සහ මාධ්‍ය සාමූහිකය
56/1, සරසවි පටුමග, කාසල් වීදිය,
කොළඹ 08,
ශ්‍රී ලංකාව.

දුරකතන අංක: +94-11-2690201/2690192
විද්‍යුත් ලිපිනය: wmcsrilanka@womenandmedia.org
වෙබ් අඩවිය: www.womenandmedia.org
Facebook: facebook.com/womenandmediacollective
Instagram: wmc_srilanka

**අරමුදල් සැපයීම:**
ROSA LUXEMBURG STIFTUNG SOUTH ASIA

ක්ෂේත්‍ර පර්යේෂණ සහ විශ්ලේෂණය: ප්‍රධාන පර්යේෂිකා ඩෘවින්කා සැමුවෙල්

සහාය: අනුෂ්කා ඕපාත

මගපෙන්වීම: තරංගා ද සිල්වා සහ ආචාර්ය සේපාලි කොට්ටේගොඩ, දුලානි හන්නැදිගේගේ දායකත්වය සහිතයි.

අන්තර්ගත විශ්ලේෂණය සහ සෝදුපත් කියවීම: රෂ්මිනි ද සිල්වා

දත්ත සංගණනය: සුරේෂ් අමුහේන

මෙම නියමු අධ්‍යයනය, ජර්මානු සමූහාණ්ඩුවේ ආර්ථික සහයෝගිතාව සහ සංවර්ධනය පිළිබඳ ෆෙඩරල් අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත රෝසා ලක්සම්බර්ග් පදනම (RLS) විසින් අනුග්‍රහය දක්වන ලදී. මෙම ප්‍රකාශනයේ අන්තර්ගතය පිළිබඳ පූර්ණ වගකීම කාන්තාව සහ මාධ්‍ය සාමූහිකය සතු වන අතර, එයින් රෝසා ලක්සම්බර්ග් පදනමේ ස්ථාවරය අනිවාර්යයෙන්ම නිරූපණය නොවේ.

9 786245 868209

# පෙරවදන

කාන්තාව සහ මාධ්‍ය සාමූහිකයේ මෙම පර්යේෂණ ප්‍රකාශනය ශ්‍රී ලංකාව තුළ දේශගුණික විපර්යාස සහ වැටුප් රහිත සුරැකුම් වැඩ අතර පවතින අන්තර් සම්බන්ධය හඳුනා ගැනීම සහ ඒ වෙනුවෙන් ප්‍රතිපත්තිමය මැදිහත්වීමක් සිදු කිරීම සඳහා කෙරෙන වැදගත් දායකත්වයකි.

වැටුප් රහිත සුරැකුම් වැඩ යනු පවුලේ සාමාජිකයන්ගේ යහපැවැත්ම වෙනුවෙන් ප්‍රධාන වශයෙන් ස්ත්‍රීන් විසින් දිනපතා සිදු කරනු ලබන එහෙත් ඒ සඳහා කිසිදු මූල්‍යමය ගෙවීමක් නොලැබෙන සියලුම කාර්යයන් වේ. ස්ත්‍රීන්ගේ ලිංගික සමාජභාවීය භූමිකාවන් පිළිබඳ පවතින සමාජීය සහ මතවාදී ආකල්ප නිසා මෙම කාර්යයන් අවතක්සේරුවට ලක්ව ඇති අතරල රටක දළ දේශීය නිෂ්පාදිතය ගණනය කිරීමේදී පවා මෙම කාලය සහ ශ්‍රමය සලකා බලනු නොලැබේ.

දිවයින පුරා දේශගුණික ආපදා දැඩි වෙමින් පවතින පසුබිමක ශ්‍රී ලංකාව කඩිනමින් අවධානය යොමු කළ යුතු සංසිද්ධියක් ලෙස දේශගුණික විපර්යාස හැඳින්විය හැකිය. මෙවැනි දේශගුණික ආපදා විවිධ ස්වරූපවලින් පැමිණිය හැකියත ප්‍රජාවන් කඩිනමින් ඉවත් කිරීමට සිදුවන ගංවතුර තත්ත්වයන්ල සෞඛ්‍ය අනතුරු ඇඟවීම් නිකුත් කෙරෙන අධික උෂ්ණත්වය සහ දීර්ඝ කාලයක් පවතින නියඟය මීට උදාහරණ වේ. මේවා හුදෙක් ස්වාභාවික ආපදා පමණක් නොවල දිගුකාලීන පාරිසරික බලපෑම් තක්සේරු කිරීම් නිසි පරිදි ඇතුළත් නොකරන ලද සංවර්ධන සැලසුම්වල ප්‍රතිඵල ද වේ.

කොළඹ, මොණරාගල සහ ගම්පහ යන දිස්ත්‍රික්ක තුනේ ස්ත්‍රීන්ගේ සැබෑ අත්දැකීම් පාදක කරගනිමින් සිදු කළ මෙම පර්යේෂණය මගින් ගංවතුර නියඟය සහ නාගරික උෂ්නත්වය ස්ත්‍රීන්ට බලපාන ආකාරය ලේඛනගත කර විශ්ලේෂණය කරයි. පර්යේෂණයට ස්ත්‍රීන්ගේ දෛනික ක්‍රියාකාරකම් පිළිබඳ කාලය භාවිතය පිළිබඳ සමීක්ෂණයක් ප්‍රජා මට්ටමින් ඔවුන් ගොඩනගා ගන්නා සමාජ ආධාරක ජාලයන් සහ සහන ලබා ගැනීම සඳහා ඇති විධිමත් ක්‍රියාවලීන් මෙන්මල දේශගුණික විපර්යාස තමන්ගේ ජීවිතවලට බලපාන ආකාරය පිළිබඳ කාන්තාවන්ගේම අවබෝධය ද ඇතුළත් කර ඇත.

ශ්‍රී ලංකාව තුළ වැටුප් රහිත සුරැකුම් සේවය හඳුනා ගැනීම සම්බන්ධයෙන් කාන්තාව හා මාධ්‍ය සාමූහිකය විසින් සිදු කරන ලද පර්යේෂණ සහ උපදේශන කටයුතු මෙම අධ්‍යයනය මගින් සැලකිය යුතු ලෙස තවදුරටත් පුළුල් කරයි. ඩෑවින්කා සැමුවෙල්ගේ මූලිකත්වයෙන් යුතුව තරංගා ද සිල්වා, අනුෂ්කා ඕපාත සහ දුලානි හන්නැදිගේ යන මහත්මීන්ගේ සමීප සහයෝගය ඇතිව මෙම අධ්‍යයනය සිදු කළ කාන්තාව සහ මාධ්‍ය සාමූහිකයේ කණ්ඩායමට මම බෙහෙවින්ම ස්තූතිවන්ත වෙමි.

**ආචාර්ය සේපාලි කෝට්ටේගොඩ,**
වැඩසටහන් අධ්‍යක්ෂිකා - ස්ත්‍රී-පුරුෂ සමාජභාවය සහ දේශපාලන ආර්ථික විද්‍යාව සම්බන්ධ,

කාන්තා සහ මාධ්‍ය සාමූහිකය,
ජනවාරි 2026.

# පිදුම

මෙම වාර්තාවේ අන්තර්ගත සොයාගැනීම් සඳහා තම අත්දැකීම් සහ කථා බෙදාගත් ස්ත්‍රීන් 60 දෙනා වෙත කාන්තා සහ මාධ්‍ය සාමූහිකය සිය කෘතඥතාව පළ කරයි. ද්වේශගුණික යුක්තිය උදෙසා ඔවුන් කැප කළ කාලය සහ කැමැත්ත මෙම කාර්යයේ හදිසි අවශ්‍යතාවය තවදුරටත් තහවුරු කරයි.

දත්ත රැස් කිරීමේ ක්‍රියාවලියේදී සහය වූ පුද්ගලයින් සහ සංවිධාන වෙත ද අපගේ ස්තූතිය හිමිවේ.

- කේ. පී. සෝමලතා - ඌව වෙල්ලස්ස කාන්තා සංවිධානය
- නෙළුම්මාලි දේවසිංහ - නොදුටු ලෝකය සංවිධානය
- රසංජලී පතිරගේ - ආබාධ සහිත ස්ත්‍රීන් සඳහා වන ජාතික සංසදය
- චාමර විජේසිංහ - ආබාධ සහිත ස්ත්‍රීන් සඳහා වන ජාතික සංසදය
- ෆාතිමා නසීරා රිස්වි - කොළොන්නාව සුවශක්ති සංවිධානය

දත්ත වගුගත කිරීම වෙනුවෙන් සුරේෂ් අමුහේනටත්, අන්තර්ගත විශ්ලේෂණය වෙනුවෙන් රශ්මිණී ද සිල්වාටත් අපගේ ස්තූතිය හිමිවේ.

අවසාන වශයෙන්, මෙම පර්යේෂණය සිදු කිරීම සඳහා මූල්‍ය අනුග්‍රහය දැක්වූ රෝසා ලක්සම්බර්ග් පදනමට ද  අපගේ විශේෂ කෘතඥතාව පළ කර සිටිමු.

# වගු සටහන


| | | |
|---|---|---|
| වගුව 1: | පවුලේ සිටින ආබාධිත පුද්ගලයින් | 11 |
| වගුව 2: | නිවසේ පදිංචිව සිටින සමීපතම නොවන ඥාතීන | 12 |
| වගුව 3: | නිවෙස් ආසන්නයේ ළමා සුරැකුම් මධ්‍යස්ථාන පවතින බව | 12 |
| වගුව 4: | සාමාන්‍ය දිනයක සුරැකුම් කටයුතු සඳහා ස්ත්‍රීන්  ගත කරන කාලය | 14 |
| වගුව 5: | පසුගිය වසර 2 තුළ අත්විඳින ලද දරුණු කාලගුණික තත්ත්වයන | 18 |
| වගුව 6: | දරුණු කාලගුණික තත්ත්වයන් පිළිබඳ අත්දැකීම් :දිස්ත්‍රික්ක අනුව | 19 |
| වගුව 7: | වර්ෂාපතනයේ කාලසීමාව පිළිබඳ නිරීක්ෂණ | 22 |
| වගුව 8: | නියඟය සහ වියළි කාලගුණය පිළිබඳ නිරීක්ෂණ | 23 |
| වගුව 9: | දේශගුණික ආපදා පිළිබඳ නිරීක්ෂණ :වයස අනුව වර්ගීකරණය | 23 |
| වගුව 10: | දේශගුණික ආපදා පිළිබඳ නිරීක්ෂණ :අධ්‍යාපන මට්ටම අනුව වර්ගීකරණය | 24 |
| වගුව 11: | කාලගුණික ආපදා හමුවේ සුරැකුම් බර කළමනාකරණය කිරීමට අනුගමනය කළනව ක්‍රම | 37 |
| වගුව 12: | කාලගුණික ආපදාවකට පසු සහය ලබාගත් ආයතනික සහ රාජ්‍ය නොවන මූලාශ්‍ර | 41 |
| වගුව 13: | කාලගුණික ආපදා කාලවලදී වැඩිපුරම රෝගාතුර වූ පුද්ගලයින් | 47 |
| වගුව 14: | ආපදා අවස්ථාවල සෞඛ්‍ය සේවා ලබා ගැනීමට බාධා වූ සාධක | 49 |
| වගුව 15: | සෞඛ්‍ය සේවාවල පවතින බව සහ ඒවා භාවිතය | 50 |
| වගුව 16: | දේශගුණික ආපදා කාලවලදී සිදු වූ වියදම් දිස්ත්‍රික්ක මට්ටමින් | 52 |

# රූපසටහන්


රූපසටහන 1: ආබාධිත පවුලේ සාමාජිකයන් සමඟ ඇති සබඳතාවය 11

රූපසටහන 2: උෂ්ණත්ව රටාවන්හි සිදුවී ඇති වෙනස්කම් ප්‍රතිශතයක් ලෙස 20

රූපසටහන 3: වර්ෂාපතන කාලසීමාවේ සිදුවී ඇති වෙනස්කම් ප්‍රතිශතයක් ලෙස 20

රූපසටහන 4: වර්ෂාපතනයේ දරුණු බවෙහි සිදුවී ඇති වෙනස්කම් ප්‍රතිශතයක් ලෙස 20

රූපසටහන 5: සුළං රටාවල සිදුවී ඇති වෙනස්කම් ප්‍රතිශතයක් ලෙස 20

රූපසටහන 6: ගංවතුර තත්ත්වයන්හි සිදුවී ඇති වෙනස්කම් 21

රූපසටහන 7: නියඟය සහ වියළි කාලගුණ තත්ත්වයන්හි සිදුවී ඇති වෙනස්කම් ප්‍රතිශතයක් ලෙස 21

රූපසටහන 8: දේශගුණික ආපදාවකදී වඩාත් අපහසු වන කාර්යයන් පිළිබඳ නිරීක්ෂණයන් 27

රූපසටහන 9: දේශගුණික ආපදාවකදී සම්පූර්ණ කිරීමට වඩාත් අපහසු වන කාර්යයන් දිස්ත්‍රික්ක අනුව වර්ගීකරණය 27

රූපසටහන 10: ආදායම් මාර්ග ස්ත්‍රීන් 60 දෙනෙකු සඳහා දිස්ත්‍රික්ක අනුව වර්ගීකරණය 31

රූපසටහන 11: ආදායම් මාර්ග ස්ත්‍රීන් 60 දෙනෙකු ඇසුරින්. 32

රූපසටහන 12: දේශගුණික ආපදා මගින් දෛනික සුරැකුම් වැඩවලට බලපෑම් ඇතිවන ආකාරය පිළිබඳ ස්ත්‍රීන් 57 දෙනෙකුගේ ප්‍රතිචාර 34

රූපසටහන 13: නිවසේ වැඩකටයුතු සහ සුරැකුම් වැඩ කළමනාකරණය කර ගැනීම සඳහා තමන් වෙනස් යමක් කළේද යන්න පිළිබඳව ස්ත්‍රීන් දැක්වූ ප්‍රතිචාර 36

රූපසටහන 14: ආධාර ලැබුණු මාර්ග - ස්ත්‍රීන් 40 දෙනෙකුගෙන් ලැබුණු ප්‍රතිචාර 40

රූප සටහන 15: ලැබුණු ආධාර වර්ග 42

රූප සටහන 16: සහන සේවා මගින් තම සුරැකුම් වගකීම් කළමනාකරණය කිරීමට හෝ අඩු කිරීමට සහයක් ලැබුණේද යන්න පිළිබඳව ස්ත්‍රීන් 51 දෙනෙකුගෙන් ලැබුණු ප්‍රතිචාර 44

රූප සටහන 17: කාලගුණික සිදුවීම් හේතුවෙන් තමන්ට හෝ තම නිවසේ කිසිවෙකුට සෞඛ්‍ය ගැටලු ඇති වූයේද නැතහොත් පවතින තත්ත්වයන් උත්සන්න වූයේද යන්න පිළිබඳව ස්ත්‍රීන් 59 දෙනෙකුගෙන් ලැබුණු ප්‍රතිචාර 47

රූප සටහන 18: අත්විඳින ලද සෞඛ්‍ය ගැටළු වර්ග 48

රූප සටහන 19: අත්විඳින ලද සෞඛ්‍ය ගැටලු වර්ග (දිස්ත්‍රික්ක අනුව වගුගත කිරීම) 48

රූප සටහන 20: සෞඛ්‍ය සේවා සඳහා ඇති ප්‍රවේශය (දිස්ත්‍රික්ක අනුව වගුගත කිරීම) 49

# පටුන


පිටුව v
පෙරවදන

පිටුව vi
පිදුම

පිටුව vii
වගු සටහන්

පිටුව viii
රූප සටහන්

පිටුව 1
හැඳින්වීම

පිටුව 4
රටේ පසුබිම

පිටුව 7
ක්‍රමවේද විද්‍යා

පිටුව 9
දිස්ත්‍රික්ක පැතිකඩ

පිටුව 11
ජනවිකාශන තොරතුරු

පිටුව 13
1 වන කොටස
කාලය භාවිතය පිළිබඳ සමීක්ෂණය සහ දේශගුණික විපර්යාස පිළිබඳ ආකල්ප

පිටුව 26
2 වන කොටස
සුරැකුම් වැඩ භාරයෙහි සිදුවන වෙනස්වීම්

පිටුව 35
3 වන කොටස
සුරැකුම් වැඩ වල බරට මුහුණ දීම සහ එය කළමනාකරණය කිරීම

පිටුව 39
4 වන කොටස
ආයතනික ආධාරක සේවාවන්

පිටුව 46
5 වන කොටස
සෞඛ්‍ය බලපෑම් සහ සෞඛ්‍ය සේවා සඳහා ඇති ප්‍රවේශය

පිටුව 51
6 වන කොටස
දේශගුණික විපර්යාස හමුවේ පවුලේ වියදම්

පිටුව 53
පළාත් පාලන ආයතන නියෝජිතයන් සමඟ සම්මුඛ සාකච්ඡා

පිටුව 55
නිගමනය

පිටුව 57
සාමාන්‍ය නිර්දේශ

පිටුව 59
ප්‍රතිපත්තිමය නිර්දේශ

පිටුව 60
තොරතුරු මූලාශ්‍ර



**Monaragala, Sri Lanka**
**Drought-affected dried-up water body**

# හැඳින්වීම

වැටුප් රහිත සුරැකුම් වැඩ යනු පවුල් ප්‍රජාවන් සහ සමස්ත පෘථිවියම පවත්වාගෙන යනු ලබන අත්‍යවශ්‍ය එහෙත් බොහෝ විට ඇසට නොපෙනෙන ශ්‍රමයකි. ලොව පුරා ස්ත්‍රීන් සහ ගැහැණු ළමයින් විසින් මෙය අසමානුපාතික ලෙස ඉටු කරනු ලබයි. සෘජු වැටුප් රහිත සුරැකුම් කටයුතු යනු “තම පවුලේ හෝ නිවසේ සිටින දරුවන් වැඩිහිටියන් සහ රෝගී ඥාතීන් මෙන්ම ස්වේච්ඡා සේවය හරහා තම ප්‍රජාවෙහි සිටින ඥාතීන් නොවන පුද්ගලයින්ගේ යහපැවැත්ම සඳහා සපයනු ලබන සෘජු සුරැකුම් වැඩ ලෙස අපි නිර්වචනය කරමු” (මැක්ග්‍රෙගර්, අරෝරා-ජොන්සන් සහ කොහෙන්,  2022). පිරිසිදු කිරීමල රෙදි සේදීමල ආහාර පිසීම සහ ආහාර පාන සැපයීම ඇතුළුව යහපැවැත්ම සඳහා අවශ්‍ය කොන්දේසි නිර්මාණය කරන ගෘහස්ථ කාර්යයන් ද මෙම සුරැකුම් සේවයට ඇතුළත් වේ. (මැක්ග්‍රෙගර්, අරෝරා-ජොන්සන් සහ කොහෙන්, 2022) ගෘහස්ථ සාත්තු සේවය බොහෝ විට යැපුම් කෘෂිකර්මාන්තය හෝ ගෙවතු වගාව වැනි ස්වරූපයන් හරහා පාරිසරික වැඩකටයුතු සමඟ ද සම්බන්ධ වේග එබැවින් දේශගුණික විපර්යාසවල පාරිසරික බලපෑම් මෙම සාත්තු සේවා බර කෙරෙහි ද බලපායි. දේශගුණික විපර්යාස හමුවේ සාත්තු සේවය යනු පැවැත්මේ පදනමයි - එනම් අර්බුදකාරී අවස්ථාවල දැඩි පීඩනය දරා ගනිමින් යථා තත්ත්වයට පත්වීමේ සහ ඔරොත්තු දීමේ හැකියාවේ වගකීම කරට ගැනීමයි.

එසේ වුවද, වැටුප් රහිත සුරැකුම් වැඩවල කේන්ද්‍රීය වැදගත්කම නොතකාල එය ක්‍රමවේදයක් ලෙස අවතක්සේරුවට ලක්ව ඇති අතර දේශගුණික හා ආර්ථික ප්‍රතිපත්ති මෙන්ම සැලසුම්කරණයන්ගෙන් ද බොහෝ දුරට බැහැරව පවතී (කෝට්ටේගොඩ සහ පීරිස්, 2023; ජාත්‍යන්තර කම්කරු සංවිධානය, 2024). මෙම නොසලකා හැරීම ස්ත්‍රී-පුරුෂ සමාජභාවය මත පදනම් වූ කාල දරිද්‍රතාවය නැමති සංසිද්ධිය තවදුරටත් වර්ධනය වීමට දායක වේග කාල දරිද්‍රතාවය යනු “පුද්ගලයෙකුගේ යහපැවැත්ම උපරිම කරගැනීම සඳහා ස්වකීය කාලය නිදහස්ව කළමනාකරණය කරගැනීමට ඇති අයිතිය සීමා කරන එකිනෙකට පටහැනි කාලීන ඉල්ලීම්” ලෙස පුළුල් ලෙස වටහා ගැනේ”  (රොජර්ස්, 2023, පිටුව 80). ගෝලීය වශයෙන් පිරිමින්ට සාපේක්ෂව ස්ත්‍රීන් තම කාලය සඳහා වන අසමාන සහ ඉහළ යන ඉල්ලීම්වලට මුහුණ දෙන අතර දිනකට පැය බිලියන 16ක සමුච්චිත කාලයක් වැය කරමින් සමස්ත වැටුප් රහිත සුරැකුම් වැඩවලින් 76%ක් පමණ ඉටු කරති (කොනලි සහ කොන්ගාර්, 2017; ලෝක සෞඛ්‍ය සංවිධානය, 2024; අද්දාති සහ පිරිස, 2018). කාලය සඳහා වන මෙවැනි ඉල්ලීම් හේතුවෙන් ස්ත්‍රීන්ගේ ආදායම් මාර්ග සීමා වන අතර අධ්‍යාපනය විවේකය සහ දේශපාලන ක්‍රියාකාරකම් සඳහා ඔවුන්ට ඇති කාලය ද අවම වේ (රොස්ට් සහ පිරිස, 2015).

අයහපත් කාලගුණික තත්ත්වයන් නිතර සිදුවන අතරම එම ව්‍යසනයන් මගින් සිදුවන විනාශයේ සහ බාධාවන්ගේ පරිමාණය පෙර නොවූ විරූ ලෙස වර්ධනය වෙමින් පවතී. එවන් දේශගුණික ව්‍යසනයකට පෙර අතරතුර සහ පසුව අවශ්‍ය වන ප්‍රකෘතිමත් කිරීමේ සහ නැවත ගොඩනැගීමේ කාර්යයන්ගෙන් වැඩි කොටසක් තම දෛනික වැටුප් රහිත සුරැකුම් වැඩවලට අමතරව ඉටු කරනු ලබන්නේ ස්ත්‍රීන් සහ ගැහැණු ළමයින් විසිනි (UN Women, 2023; Bradshaw & Linneker, 2014). ඔවුහු ජලය රැගෙන ඒම සඳහා වැඩි දුරක් පයින් ගමන් කරති. හරිතාගාර වායු විමෝචනය ඉහළ මට්ටමක පවතින තත්ත්වයක් යටතේ නිවෙස් තුළ ජල පහසුකම් නොමැති ස්ත්‍රීන්ගේ දෛනික ජලය රැස් කිරීමේ කාලය 2050 වන විට 30% කින් වැඩි විය හැකි බව ඇස්තමේන්තු කර ඇත (Carr et al., 2024). මීට අමතරව ගංවතුර තත්ත්වයන්ගෙන් පසු තම නිවාස සහ ජීවනෝපායන් නැවත ගොඩනැගීමට සහ යථා තත්ත්වයට පත් කිරීමට ස්ත්‍රීන් වැඩි කාලයක් වැය කරන අතරල මූලික සම්පත් හිඟ වන විට ආහාර සහ ජලය සොයා ගැනීමට වැඩි ශක්තියක් වැය කරති. එමෙන්ම මෙම අයහපත් කාලගුණික තත්ත්වයන් තුළ පවුලේ සාමාජිකයන් හෝ ප්‍රජා සාමාජිකයන් රෝගාතුර වූ විට හෝ තුවාල ලැබූ විට ඔවුන් රැකබලා ගැනීම සඳහා ද ස්ත්‍රීන් වැඩි සුරැකුම් වැඩ මෙහෙවරක නිරත වෙති. (UN Women, 2017).

කාල දරිද්‍රතාවය තවදුරටත් උග්‍ර වීම මගින් තීරණ ගැනීමේ වැදගත් අවස්ථාවන්ට ප්‍රවේශ වීමට ස්ත්‍රීන්ට ඇති ඉඩකඩ සීමා වන අතර වැටුප් සහිත රැකියා සහ ආදායම් උත්පාදන කටයුතුවල නිරත වීමට ඇති හැකියාවද අඩාල වේ  (Sarker & Puskur, 2022; IDRC” 2024. දේශගුණික විපර්යාස හමුවේ කාලය නොමැතිකම සහ ඒ ආශ්‍රිතව ඇති වන පීඩනය ග්‍රාමීය කාන්තා මූලික පවුල් ඒකක තුළ තවදුරටත් සංකීර්ණ වේ. ගෝලීය වශයෙන් ගත්කල ගංවතුර සහ අධික තාප පීඩනය හේතුවෙන් මෙවැනි නිවාස ඒකකවල වාර්ෂික ආදායම සාමාන්‍යයෙන් 8% කින් අහිමි වන බව ඇස්තමේන්තු කර ඇත (sitko et al., 2024).

මෙම ඉහළ යන සහ අතිච්ඡාදනය වන බරපතලකම් මධ්‍යයේ වුවද දේශගුණික පාලනයට අදාළ සමස්ත ක්‍රියාවලීන්ගෙන් ස්ත්‍රීන් ක්‍රමානුකූලව බැහැර කරනු ලබන අතර ඔවුන් කොන් කිරීමට ලක්ව ඇත. දේශගුණික බලපෑම් පිළිබඳ දත්ත වාර්තා කිරීම, තීරණ ගන්නා මට්ටමේ අවකාශයන්, අනුවර්තනය සහ අවම කිරීමේ අවශ්‍යතා, ප්‍රජා ප්‍රමුඛතා සහ සාධාරණ සංක්‍රාන්ති ක්‍රියාවලීන්ගෙන් ඔවුන් මෙලෙස බැහැර කරනු ලැබේ. මෙම බැහැර කිරීමේ බලපෑම පහළ මට්ටම දක්වා ගලා යන අතර එමඟින් ස්ත්‍රීන්ගේ අනුවර්තන හැකියාව සහ අත්‍යවශ්‍ය සම්පත් වෙත ප්‍රවේශ වීමට ඇති අවස්ථාවන් සෘජුවම සීමා වේ. විශේෂයෙන්ම, විධිමත් ශ්‍රම බලකායෙන් බැහැරව වැඩ

කරන ස්ත්‍රීන් ව්‍යාප්ති සේවාවල ඉලක්කගත ප්‍රතිලාභීන් ලෙස සැලකීමේදී බොහෝ විට පසෙකට කරනු ලැබේ. එමෙන්ම ප්‍රජා නායකයින් ලෙස දේශීය ස්වාභාවික සම්පත් සහ පරිසර පද්ධතිවල ආරක්ෂකයින් ලෙස සහ වඩාත්ම වැදගත් ලෙස දේශගුණික විපර්යාස අවම කිරීමේ ප්‍රතිපත්ති සහ ක්‍රියාවලින්හි ප්‍රතිලාභීන් ලෙස ඔවුන්ව හඳුනා ගැනීම හෝ පිළිගැනීම සිදු නොවේ. ඔවුන්ගේ දැනුම සහ ජීවන අත්දැකීම් නිසි ලෙස නියෝජනය නොවන අතර මෙය ගෘහස්ථ, ප්‍රජා සහ ජාතික යන සෑම මට්ටමකම අනුවර්තනය ශක්තිමත් කිරීම සඳහා සැලසුම් කර ඇති මැදිහත්වීම්වල ඵලදායීතාවය සැලකිය යුතු ලෙස අවම කිරීමට හේතු වේ.

සාධාරණ ප්‍රතිපත්ති සම්පාදනයේදී සහ මැදිහත්වීම් සැලසුම් කිරීමේදී ස්ත්‍රීන්ගේ අත්දැකීම් හඳුනාගැනීම අත්‍යවශ්‍ය මෙන්ම තීරණාත්මක පියවරකි. එසේ වුවද පවතින අසමානතාවයන් තීව්‍ර කරන මෙම දරුණු දේශගුණික අර්බුදය හමුවේ හුදෙක් 'හඳුනාගැනීම' පමණක් ප්‍රමාණවත් නොවන බව අපි මෙම වාර්තාව මගින් අවධාරණය කරන්නෙමු. ස්ත්‍රීන්ගේ වැටුප් රහිත සුරැකුම් වැඩ පිළිබඳ පුළුල් පර්යේෂණ සහ ඒ වෙනුවෙන් පෙනී සිටීමේ ක්‍රියාවලීන්හිදී සුරැකුම් වැඩ සහ දේශගුණික යුක්තිය අතර අන්තර් සම්බන්ධතාව තුළ '5R' රාමුව භාවිතා කිරීමට යෝජනා කෙරේ. එනම්, **හඳුනාගැනීම, ප්‍රතිව්‍යාප්තිය, අවම කිරීම, නියෝජනය, ප්‍රතිචාර දැක්වීම** වේ. මෙම අංගයන් එකිනෙකින් වෙන් කළ නොහැකි බවත් ඒවා හුදකලාව සංකල්පගත කිරීමට හෝ විසඳීමට නොහැකි බවත් අපි තර්ක කරමු. වැටුප් රහිත සුරැකුම් වැඩ පිළිබඳ ඇති ගැටළු අර්ථවත් ලෙස විසඳීම සඳහා අවශ්‍ය වන සමාජ-සංස්කෘතික වෙනස්කම් සහ ප්‍රතිපත්තිමය වර්ධනයන් මෙම '5R' රාමුව තුළ අන්තර්ගත වේ.

**හඳුනා ගැනීම:** වැටුප් රහිත සුරැකුම් වැඩල ආර්ථික හා සමාජීය වශයෙන් වටිනා සහ අත්‍යවශ්‍ය දායකත්වයක් ලෙස පිළිගත යුතුයි. මෙයට ජාතික සංඛ්‍යාලේඛන සහ ආර්ථික ප්‍රගතිය මැනීමේ දර්ශකයන්ට වැටුප් සහිත සහ වැටුප් රහිත සුරැකුම් වැඩ ඇතුළත් කිරීම, කාලය භාවිත කරන ආකාරය මැනීම සහ පවුල් හා ප්‍රජාවන් තුළ එම කාර්යභාරයන් බෙදී යන ආකාරය අධ්‍යයනය කිරීම මෙන්ම, ස්ත්‍රීන්ගේ ජීවිත කාලය පුරාම ඔවුන් දරන සුරැකුම් වගකීම් සහ ශ්‍රමය ඇගයීමට ලක් කිරීම ඇතුළත් වේ. තවද ආහාර සුරක්ෂිතතාව තහවුරු කිරීමේදී මුල් පෙළේ ක්‍රියාකාරිනියන් ලෙස ස්ත්‍රීන් සතු භූමිකාව විධිමත් ලෙස පිළිගත යුතුය. විශේෂයෙන්ම කාලගුණික විපර්යාස හේතුවෙන් වාණිජ බෝග අසාර්ථක වන අවස්ථාවලදී ආහාර නිෂ්පාදනය සහ බීජ සංරක්ෂණය සම්බන්ධයෙන් ඔවුන් ඉටුකරන සුවිශේෂී මෙහෙවර මෙහිදී ඇගයීමට ලක්විය යුතුය.

**ප්‍රතිව්‍යාප්තිය:** ස්වභාවික විපත් හෝ දේශගුණික බලපෑම් හේතුවෙන් පවුල් අවතැන් වූ විට තාවකාලික කඳවුරු තුළ වැටුප් රහිත සුරැකුම් වැඩහි වැඩි බරක් කරට ගන්නේ ස්ත්‍රීන් ය. මේ හේතුවෙන් සහන මුදල් ලබාගැනීම ආහාර බෙදාහැරීමේ මධ්‍යස්ථාන වෙත යාම, ජීවනෝපාය සහාය ලබාගැනීම සහ ලියාපදිංචි වීමේ ක්‍රියාවලීන්ට සහභාගී වීමට ඔවුන්ට අවස්ථාව අහිමි වේ. එබැවින් ගුණාත්මක සහ දැරිය හැකි මිලකට ලබාගත හැකි සුරැකුම් වැඩ වෙනුවෙන් ආයෝජනය කරමින් ස්ත්‍රීන් සහ පිරිමින් අතර මෙන්ම රජය සහ ප්‍රජාව අතර ද මෙම වගකීම් සාධාරණව බෙදී යන ක්‍රමවේදයක් සැකසිය යුතුයග මෙයට ස්ත්‍රී-පුරුෂ සමාජභාවය සැලකිල්ලට ගත් මාතෘ සහ පීතෘ නිවාඩු පවුල් හිතකාමී සේවා ස්ථාන ප්‍රතිපත්ති සහ වැටුප් රහිත සුරැකුම් වැඩ පිළිබඳ පවතින සමාජ මතවාදයන් වෙනස් කිරීම ඇතුළත් වේ.

**අවම කිරීම:** පොදු සේවා, යටිතල පහසුකම් සහ තාක්ෂණය වෙනුවෙන් ආයෝජනය කිරීම මගින් විශේෂයෙන්ම ස්ත්‍රීන් සහ ගැහැණු ළමුන් මත පැටවී ඇති වැටුප් රහිත සුරැකුම් වැඩයන්හි බර ලිහිල් කළ යුතුය. ජල පහසුකම් විශ්වාසදායී ප්‍රවාහනය සහ විදුලිය ලබා දීම වැනි ක්‍රියාමාර්ග හරහා කාලය වැය වන කාර්යයන් සරල කළ හැකිය. මෙහි මූලික අවධානය යොමු විය යුත්තේ පරිසර පද්ධති පිරිහීම සහ දේශගුණික විපර්යාස හේතුවෙන් තීව්‍ර වන ශාරීරික වෙහෙසකර බව ඉවත් කිරීම කෙරෙහි ය.

**ප්‍රතිචාර දැක්වීම:** ශ්‍රී ලංකාවේ ස්ත්‍රීන්ගෙන් සැලකිය යුතු පිරිසක් දේශගුණික බලපෑම්වලට ගොදුරු විය හැකි කෘෂිකාර්මික හෝ සොබාදහම මත පදනම් වූ ජීවනෝපායන්හි නිරත වෙතිග ඔවුන් පරිසරය රැකගැනීම වෙනුවෙන් කරන කැපවීම සඳහා බොහෝ විට ගෙවීමක් නොලැබේ. දෛනික වැටුප් ලබන්නන්ල වාරික සේවකයින් සහ අවිධිමත් ආර්ථිකයේ නියුතු වූවන් ඇතුළු සියලුම  වැටුප් සහිත සුරැකුම් වැඩ කරන සේවකයින්ගේ ආර්ථික හා සමාජීය තත්ත්වය ඉහළ නැංවීම සඳහා සාධාරණ වැටුප්ල සමාජ ආරක්ෂණය සහ යහපත් සේවා කොන්දේසි ප්‍රවර්ධනය කළ යුතුය.

**නියෝජනය:** ගෘහස්ථ සේවය සහ සුරැකුම් වැඩ විධිමත් කිරීම මගින් ගෙවීමක් සහිතව හෝ ගෙවීමක් රහිතව සුරැකුම් වැඩ සිදුකරන පිරිසට තීරණ ගැනීමේ ක්‍රියාවලීන්හිදී හඬක්, අයිතිවාසිකම් සහ නියෝජනයක් ඇති බව තහවුරු කළ යුතුයග දේශගුණික විපර්යාස පිළිබඳ තීරණ ගන්නා මණ්ඩලවලට ග්‍රාමීය ස්ත්‍රී, සමුපකාර හෝ වතු කම්කරු වෘත්තීය සමිති නියෝජනය කරන ස්ත්‍රීන් ඇතුළත් කරගැනීම සඳහා අනිවාර්ය කෝටා ක්‍රම  ක්‍රියාත්මක කළ යුතුය.

එමගින් අනාගතයේදී ජාත්‍යන්තර දේශගුණික මූල්‍ය ආධාර කාර්මිකව නැවත ගොඩනැඟීම්වලට පමණක් නොව සුරැකුම් යටිතල පහසුකම් වෙනුවෙන් ද වෙන් කරන ලෙස බලපෑම් කිරීමට ඔවුන්ට අවස්ථාව ලැබේ.

දේශගුණික විපර්යාසයන්ට අනුවර්තනය වීමේ සහ ඒවා අවම කිරීමේ පියවරයන් ඵලදායී ලෙස ස්ත්‍රී-පුරුෂ සමාජභාවය කෙරෙහි සංවේදී වීමට නම් ඒවා මගින් 'පිරිපුන් සුරැකුම් වැඩ' පිළිබඳව අවධානය යොමු කළ යුතුය. මන්දයත් දේශගුණික විපර්යාසය යනු හුදෙක් පාරිසරික තර්ජනයක් පමණක් නොව එය 'කාල දරිද්‍රතාවය' පිළිබඳ අර්බුදයක් ද වන බැවිනි. පර්යේෂණවලට අනුව රජයන් සහ අනෙකුත් පාර්ශවකරුවන් මූලික වශයෙන් අවධානය යොමු කර ඇත්තේ ස්ත්‍රීන්ගේ ආර්ථික ක්‍රියාකාරකම් පිළිබඳව පමණි. එහිදී වැටුප් සහිත සහ වැටුප් රහිත සුරැකුම් වැඩ එකිනෙකට සම්බන්ධ වී ඇති ආකාරය හෝ දේශගුණික ප්‍රතිචාර පියවර සැලසුම් කිරීමේදී ගෘහස්ථ සුරැකුම් සේවය බෙදී යන ආකාරය පිළිබඳව අවධානය යොමු කර නොමැත (Westholm and Arora-Jonsson, 2015).

මෙම නියමු අධ්‍යයනය තුළ දේශගුණය සහ සුරැකුම් වැඩ අතර පවතින සබැඳියාව සලකා බැලීමේදී එම අංශ දෙකම එකිනෙකට සෘජුව සහ ගතිකව සමානුපාතික වන බව උපකල්පනය කරයි. එනම් දේශගුණික විපත් උත්සන්න වන විට ස්ත්‍රීන්ගේ වැටුප් රහිත සුරැකුම් වැඩ පරිමාණය සහ සංකීර්ණත්වය ද ඉහළ යයි.

විවිධ දේශගුණික අවදානම් සහිත දිස්ත්‍රික්කවල (කොළඹ, ගම්පහ සහ මොණරාගල) වෙසෙන ස්ත්‍රීන්ගේ සැබෑ අත්දැකීම් සහ නාගරීකරණයේ මට්ටම වැනි තවත් බොහෝ විචල්‍යයන් මත පදනම්ව මෙම අධ්‍යයනය සිදු කර ඇත. මෙම ප්‍රවේශය හරහා සුරැකුම් වැඩ සේවය යනු හුදෙකලාව සිදුවන්නක් නොව දේශගුණික තත්ත්වයන් මත හැඩගැසෙන සහ සංකීර්ණ වන බරක් බව වටහා ගැනීමට අපට ඉඩ සලසයි.

තවද මෙම සබැඳියාව සෘජුව සමානුපාතික ලෙස සැලකීම යනු දේශගුණික විපර්යාස සන්දර්භය තුළ සුරැකුම් වැඩවල විවිධ පැතිකඩයන් ගැන සලකා බැලීමයි. මෙයට පවුල් සහ ප්‍රජාවන්ගේ සෘජු හා වක්‍ර සුරැකුම් සේවය පමණක් නොව පරිසරය වෙනුවෙන් ඉටු කරන වැටුප් රහිත සුරැකුම් ශ්‍රමය සහ දේශගුණික අර්බුදයට අනුවර්තනය වීමට හා එය අවම කිරීමට දරන උත්සාහයන් ද ඇතුළත් වේ. මෙම ශ්‍රම ව්‍යාප්තිය කාලීන දරිද්‍රතාවය තවත් දරුණු කරයි. දේශගුණික විපර්යාස උත්සන්න වන විට පිරිසිදු ජලය සහ දර වැනි සම්පත් කරා ඇති භෞතික දුර ප්‍රමාණය වැඩි වන අතර එමගින් පාරිසරික විනාශයේ "පිරිවැය" ස්ත්‍රීන්ගේ කාලය සහ ශාරීරික සෞඛ්‍යය මත පැටවේ. (Ho et al., 2021). මීට අමතරව මෙම සබැඳියාව තුළ දේශගුණික කාංසාව හේතුවෙන් ඇතිවන මානසික සහ චිත්තවේගීය ශ්‍රමය පිළිබඳව ද අවධානය යොමු කළ යුතුය. ගෘහයක සාම්ප්‍රදායික "පීඩන අවශෝෂකයන්" ලෙස ස්ත්‍රීන් දරුණු දේශගුණික තත්ත්වයන් පවතින අවස්ථාවලදී ආහාර සලාක කළමනාකරණය කිරීමේ සහ දරුවන් හා වැඩිහිටියන් වැනි අවදානමට ලක්විය හැකි අයගේ ආරක්ෂාව සහතික කිරීමේ මනෝවිද්‍යාත්මක බර උසුලයි (Macgregor et al., 2022). එබැවින් ස්ත්‍රීන්ගේ ශ්‍රමය නිසි ලෙස ඇගයීමල ප්‍රතිව්‍යාප්තිය සහ අවම කිරීමකින් තොරව අර්ථවත් දේශගුණික අනුවර්තනයක් හෝ ඔරොත්තු දීමේ හැකියාවක් සැලසුම් කළ නොහැක. මෙම පියවර මඟ හැරීම යනු ස්ත්‍රීන්ගේ ශ්‍රමය මත ගොඩනැගුණු සාධාරණ හෝ යුක්ති සහගත නොවන සංක්‍රාන්ති සමයකට මගපෑදීමකි.

# රටේ පසුබිම

ශ්‍රී ලංකාව දේශගුණික විපර්යාසවල බලපෑමට දැඩි ලෙස ගොදුරු විය හැකි රටකි. 1993 සිට 2022 දක්වා වූ දිගුකාලීන දත්ත මඟින් ශ්‍රී ලංකාවේ පවතින මෙම අවදානම ඉස්මතු කරන අතර ගෝලීය දේශගුණික අවදානම් දර්ශකයට අනුව රටවල් 171ක් අතරින් ශ්‍රී ලංකාව 59 වන ස්ථානයට පත්ව ඇත (Germanwatch, 2025). දේශගුණික විපර්යාස හමුවේ ඇති මෙම බිඳෙනසුලු බව බරපතල ආර්ථික බලපෑම් ඇති කරයි; ක්‍රියාකාරී අනුහුරුවීම් සහ අවම කිරීමේ පියවර නොගතහොත් 2050 වන විට ශ්‍රී ලංකාවේ වාර්ෂික දළ දේශීය නිෂ්පාදිතය (GDP) 12% කින් හැකිලෙනු ඇතැයි ආසියානු සංවර්ධන බැංකුව පුරෝකථනය කරයි (ADB, 2023). නියඟයල ගංවතුර සහ නායයෑම් වැනි ආන්තික කාලගුණික රටාවන් සහ ස්වාභාවික විපත්වලට ශ්‍රී ලංකාව නිතර මුහුණ දෙයි. දේශගුණික විපර්යාසවලින් ඇති වන බලපෑම් අවම කිරීමේ සහ අනුවර්තනය වීමේ ක්‍රමවේදවල හිඟකම, ඵලදායී පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධති නොමැතිකම සහ දේශගුණික ප්‍රත්‍යස්ථතාව (Resilience) සඳහා අවශ්‍ය සම්පත් හිඟකම හේතුවෙන් මෙම ව්‍යසනවල බලපෑම තවදුරටත් දරුණු වේ. 2050 වන විට මිලියන 19ක ජනගහනයක් මධ්‍යම හෝ දැඩි දේශගුණික අවදානම් සහිත කලාපවල ජීවත් වනු ඇතැයි ගණන් බලා ඇති බැවින් ශ්‍රී ලංකාව ඉහළ මට්ටමේ දේශගුණික අවදානමකට නිරාවරණය වී ඇත (එක්සත් ජාතීන්ගේ සංවිධානය - ශ්‍රී ලංකාව, 2023).

එදිනෙදා ජීවිතයේ විවිධ අංශ කෙරෙහි බලපාන අන්තර්ඡේදනය වන බලපෑම් හේතුවෙන් ශ්‍රී ලාංකිකයන් දස දෙනෙකුගෙන් හය දෙනෙකුම දේශගුණික බලපෑම් හමුවේ බහුවිධ අවදානමට ලක්ව ඇත (UNDP, ශ්‍රී ලංකාව, 2023). දේශගුණික විපර්යාස බොහෝ විට පවතින සමාජ-දේශපාලන සහ ආර්ථික අසමානතාවයන් තීව්‍ර කරන අතර ප්‍රතිපත්ති මට්ටමේ පවතින අන්ධ ස්ථාන ඉස්මතු කිරීමට සමත් වේ (Tschakert et al., 2013; Parsons et al., 2024). දේශගුණික අවදානමට ලක්විය හැකි පහළ මධ්‍යම ආදායම් ලබන රටක් වන ශ්‍රී ලංකාව තුළ දරුණු වන දේශගුණික බලපෑම් ආර්ථිකයට සහ එහි ඔරොත්තු දීමේ හැකියාවට සැලකිය යුතු තර්ජනයක් එල්ල කරයි (UN Women, 2022).

අන්ත දේශගුණික තත්ත්වයන් COVID-19 වසංගතය හෝ ශ්‍රී ලංකාවේ ආර්ථික අර්බුදය (2021-2025) වැනි අනෙකුත් අර්බුද සමඟ එකට ගැටෙන විට ස්ත්‍රීන්ට සහ ගැහැණු ළමයින්ට අවස්ථා සහ සහන සඳහා ඇති ප්‍රවේශය සීමා වේ. මෙය අනාගත අර්බුදවලට මෙන්ම දැනට පවතින අර්බුද උත්සන්න වීමට ඇති අවදානම පිළිබඳ විෂම චක්‍රයක් නිර්මාණය කරයි. (Ratwatte, 2023). මෙලෙස එකිනෙක අන්තර්ඡේදනය වන අර්බුද හේතුවෙන් ස්ත්‍රීන්ගේ කාලය සහ ශ්‍රමය සඳහා ඉල්ලුමක් ඇති වන අතර එය විශේෂයෙන්ම ස්ත්‍රීන්ගේ වැටුප් රහිත සුරැකුම් වැඩ ශ්‍රමය සඳහා අමතර පීඩනයක් ඇති කරයි.

ලොව අනෙකුත් රටවල මෙන්ම ශ්‍රී ලංකාවේ ද වැටුප් රහිත සුරැකුම් වැඩ ප්‍රධාන වශයෙන් සිදු කරනු ලබන්නේ ස්ත්‍රීන් විසිනි. මෙය ක්‍රමවේදයක් ලෙස අවතක්සේරු කර ඇති අතර පිළිගැනීමට ලක් නොවේ. බොහෝ විට ජාතික ගිණුම්කරණ ක්‍රියාවලීන්ගෙන් (DCS, 2020) මෙන්ම දේශගුණික සහ කම්කරු ප්‍රතිපත්තිවලින්ද මෙය බැහැර කර ඇත. 2017 වසරේ ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් පවත්වන ලද 'ශ්‍රී ලංකා කාලය භාවිතය පිළිබඳ සමීක්ෂණයට' අනුව නොගෙවන ගෘහස්ථ සේවා කටයුතු සඳහා පිරිමින්ගේ සහ ස්ත්‍රීන්ගේ සහභාගීත්ව අනුපාත පිළිවෙලින් 54%ක් සහ 86ග4%ක් වේ (DCS, 2020). තවද ශ්‍රී ලංකාව තුළ ප්‍රමාණවත් සුරැකුම් සේවා පහසුකම් නොමැතිකම හේතුවෙන් වැටුප් රහිත සුරැකුම් වැඩකරන්නන් වැඩි වශයෙන්ම ජනගහනයේ ලාබාලතම සහ වැඩිහිටි පිරිස් සඳහා සේවා සපයයි (ILO, 2024). ප්‍රවාහන, සෞඛ්‍ය, අධ්‍යාපන සහ සමාජ ආරක්ෂණ පද්ධතිවල පවතින අසමර්ථතාවයන් විශේෂයෙන්ම අන්ත දේශගුණික තත්ත්වයන් පවතින කාලසීමාවන්හිදී මෙම සුරැකුම් බර තීව්‍ර කරයි. දේශගුණික ව්‍යසනයන් ඇති වූ විට මෙම පද්ධතිමය අසාර්ථකත්වයන් හේතුවෙන් අවතැන්වීම් සහ හිඟතාවන් මධ්‍යයේ ගෘහස්ථ පැවැත්ම සහතික කරන අතරම වැඩිවන සුරැකුම් අවශ්‍යතා කළමනාකරණය කිරීමේ ද්විත්ව බර දරා ගැනීමටවැටුප් රහිත සුරැකුම් වැඩකරන්නනට සිදු වේ (UNFPA, 2025). මෙම අසමානතාවයන් බොහොමයක් දේශගුණික කම්පන හමුවේ අවදානම වැඩි කිරීමට හේතු විය හැකග මන්ද යත් බොහෝ ස්ත්‍රීන්ට සහ ගැහැණු ළමයින්ට ආපදා තොරතුරු-මූල්‍ය සේවා-ප්‍රජා තීරණ ගැනීමේ ක්‍රියාවලීන් සම්පත් බෙදා හැරීම මෙන්ම දේපළ සහ සංචලනය පාලනය කරන අයිතිවාසිකම් සඳහා නිසි ප්‍රවේශයක් නොමැති විය හැකි බැවිනි (WFP, 2021).

තවදල ගෘහස්ථ සහ සුරැකුම් වගකීම් කළමනාකරණය කිරීම හා බැඳුණු ශාරීරික හා මානසික ශ්‍රමයේ ඉල්ලුම සහ කාලය පිළිබඳ සීමාවන් හේතුවෙන් ස්ත්‍රීන් බොහෝ විට අවිධිමත් ශ්‍රමබලකායට ඇතුළත් වේ. මෙය අවසානයේදී ඔවුන්ව තවත් අවදානම් සහගත තත්ත්වයකට පත් කරයි; එනම් අඩු දෛනික වැටුප් සීමිත කම්කරු නීති ආරක්ෂණය විධිමත් සේවා කාලයක් නොමැතිකම අනාරක්ෂිත සේවා පරිසරයන් මෙන්ම විශ්‍රාම වැටුප්, සෞඛ්‍ය රක්ෂණ හෝ වැටුප් සහිත අසනීප නිවාඩු වැනි ප්‍රතිලාභ අහිමි වීමයි (ILO, 2024; ILO, 2023; ILO, 2020). ගෝලීය වශයෙන් අවිධිමත් සහ අවදානම් සහගත රැකියාවල ස්ත්‍රී නියෝජනය අධික වන අතර දකුණු ආසියාවේ සේවය කරන ස්ත්‍රීන් ගෙන් අඩකට වඩා වැඩි පිරිසක් අවිධිමත් අංශයේ නිරතව සිටිති (ලෝක බැංකුව, 2023). අවිධිමත් ශ්‍රම වෙළඳපොළ තුළ ස්ත්‍රීන්ගේ අධික නියෝජනය සහ ඔවුන්ගේ අසමානුපාතික සුරැකුම් බර ඒකාබද්ධ වූ විට දේශගුණික ආපදාවලදී නොගෙවන සුරැකුම් වැඩවල නියැලී සිටින ස්ත්‍රීන්ගේ අවදානම තවත් වැඩි වේ. මන්දයත් දේශගුණික

බාධාවන් පවතින කාලසීමාවන්හිදී ඔවුන්ගේ සුරැකුම් වගකීම් කිහිප ගුණයකින් වැඩි වන අතරම ඔවුන්ට රැකියා සුරක්ෂිතතාවක් විශ්වාසදායක වැටුපක් හෝ නිවාඩු ලබා ගැනීමේ හැකියාවක් නොමැති වීමයි (ILO, 2022).

2023 ශ්‍රී ලංකා ශ්‍රම බලකා සමීක්ෂණයට අනුව මෙරට ප්‍රධාන සේවා නියුක්ති මාදිලිය වන්නේ අවිධිමත් ශ්‍රම වෙළඳපොළ වන අතර එය මුළු ශ්‍රම බලකායෙන් 67.7% කි. අවිධිමත් රැකියා නියුක්ති අනුපාතය ස්ත්‍රීන් අතර 60.3% කි. මෙම අවිධිමත්භාවය දේශගුණික විපර්යාසයන්ට බෙහෙවින් ගොදුරු විය හැකි කෘෂිකාර්මික අංශය තුළ වඩාත් උග්‍ර වේ. එහි සේවකයන්ගෙන් 92.4% ක්ම කිසිදු විධිමත් ආරක්ෂණයකින් තොරව වැඩ කරන අතර මෙහි බලපෑම ආහාර නිෂ්පාදනයේ කොඳු නාරටිය බඳු ග්‍රාමීය ස්ත්‍රීන්ට අසමානුපාතික ලෙස එල්ල වේ. (DCS, 2024).

එමෙන්ම, ශ්‍රී ලංකාවේ සුරැකුම් වගකීම් දරන කෘෂිකාර්මික අංශයේ විශාල ස්ත්‍රී සංඛ්‍යාවක් දේශගුණික කම්පන හමුවේ එක හා සමාන අවදානමකට ලක්ව ඇති සාම්ප්‍රදායිකව නිවසේ ජල කළමනාකරණය. ගෙවතු වගාව සහ පශු සම්පත් පාලනය කරන ග්‍රාමීය ස්ත්‍රීන් දේශගුණික විපර්යාස සහ ස්වභාවික විපත් හේතුවෙන් ඇති වන ජල හිඟය සහ ආහාර අනාරක්ෂිතභාවය හමුවේ පෙරමුණේම සිටිති.

දේශගුණික හේතූන් මත සිදුවන වගා පාලු වීම් සහ අක්‍රමවත් වර්ෂාපතන රටා නිසා පිරිමින් කෘෂිකර්මාන්තයෙන් ඉවත් වී නගර කරා සංක්‍රමණය වන විට එහි ආර්ථික හා දේශීය ප්‍රතිවිපාක දරා ගැනීමට ඉතිරි වන්නේ ස්ත්‍රීන් ය. මෙහි ප්‍රතිඵලයක් ලෙස ස්ත්‍රීන්ට තම පවුලට සහ සැමියාට සහය වීම සඳහා නිවසේ වගකීම් ඉටු කරන අතරම වැඩි කාලයක් වැඩ කිරීමට සිදු වේ (Gunawardena, 2020).

දේශගුණික විපර්යාස නිසා පිරිමින් අතර සිදුවන ශ්‍රම සංක්‍රමණය හේතුවෙන් ස්ත්‍රීන්ගේ ගෘහස්ථ වගකීම්, ළමා සුරැකුම් සහ කෘෂිකාර්මික වැඩවල බර කැපී පෙනෙන ලෙස ඉහළ යයි. බොහෝ විට ගොවිතැනට අමතරව වෙනත් ආදායම් මාර්ග සෙවීමට ද ස්ත්‍රීන්ට බලපෑම් එල්ල වේ. දේශගුණික තත්ත්වයන් සහ ස්වභාවික විපත් නිසා ආදායම අඩුවීමෙන් කෘෂිකාර්මික ප්‍රජාවන් තුළ දරිද්‍රතාවය ඉහළ යාම ළමුන්ට සහ තරුණ පිරිසට දැඩි හානියක් සිදු කරයි. 2018 වසරේ ජාත්‍යන්තර කම්කරු සංවිධානය (ILO) පෙන්වා දුන් පරිදි මෙය අවසානයේදී ළමා අපයෝජන, ළමුන් නොසලකා හැරීම්, අධ්‍යාපනය අඩාල වීම සහ ළමා ශ්‍රමය සූරාකෑමට ද හේතු වී ඇත (Mombauer & Wijenayake, 2020).

දේශගුණය හේතුවෙන් සිදුවන සංක්‍රමණවල ප්‍රතිඵලයක් ලෙස ඇතිවන එක් ප්‍රධාන සමාජ ආර්ථික බලපෑමක් වන්නේ ග්‍රාමීය ස්ත්‍රීන් දරුණු ණය උගුල්වල සිරවීමයි. බොහෝ ස්ත්‍රීන් සහ ඔවුන්ගේ පවුල් යැපුම් කෘෂිකර්මාන්තයේ නිරත වන අතර ස්ථාවර ආදායමක් ලබා දෙන විධිමත් රැකියා අවස්ථා සඳහා ඔවුන්ට ඇත්තේ ඉතා සීමිත ප්‍රවේශයකිග එසේ වුවද, දිනෙන් දින ඉහළ යන ගෘහස්ථ වියදම් කෙසේ හෝ පියවා ගැනීමට ඔවුන්ට සිදු වේ (Arambepola & Romeshun, 2019). ණය සහ මානව හිමිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ විශේෂඥ වාර්තාවකට අනුව ශ්‍රී ලංකාවේ ස්ත්‍රීන්  මිලියන 2.4 කට වඩා වැඩි පිරිසක් ඉතා ඉහළ වාර්ෂික පොලී අනුපාත (30% සිට 220% දක්වා) අය කරන ක්ෂුද්‍ර මූල්‍ය ආයතනවලින් ණය ලබාගෙන ඇත. මෙයින් පෙන්නුම් කරන්නේ ශ්‍රී ලාංකික ස්ත්‍රීන් ණය පහසුකම් ලබා ගැනීමේදී මුහුණ දෙන අසීරු අභියෝග යන්ය (Munasinghe & Wijesinghe, 2019).

2023 වසර වන විට ශ්‍රී ලාංකිකයන්ගෙන් 25.9%ක් පමණ දරිද්‍රතා රේඛාවට පහළින් ජීවත් වූ අතර ක්ෂුද්‍ර-කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් (MSME) විශාල වශයෙන් වැසී යාම හේතුවෙන් ස්ත්‍රීන්  සහ නාගරික කම්කරුවන්ගේ ශ්‍රම බලකා සහභාගීත්වය සීඝ්‍රයෙන් පහත වැටුණි. අධික මිල ගණන් සහ අර්ධ සේවා නියුක්තිය හමුවේ. ආහාරල සෞඛ්‍ය සහ අධ්‍යාපනය වැනි අත්‍යවශ්‍ය වියදම් පියවා ගැනීම සඳහා නිවැසියන්ට වඩ වඩාත් ණය වීමට සිදුව ඇත (ලෝක බැංකුව, 2024). 2023 මාර්තු වන විට ශ්‍රී ලාංකිකයන්ගෙන් ආසන්න වශයෙන් 17% ක් මධ්‍යස්ථ මට්ටමේ උග්‍ර ආහාර අනාරක්ෂිතභාවයකට මුහුණ දුන් අතර දේශගුණික හදිසි අවස්ථාවන් මෙම අර්බුදය තවදුරටත් උග්‍ර කරයි. ඉහළ යන උෂ්ණත්වය සහ අක්‍රමවත් කාලගුණ රටා නිසා ජලය සහ ආහාර ලබා ගැනීමේ හැකියාවට තර්ජනයක් එල්ල වී ඇති අතර විශේෂයෙන් සහල් ඇතුළු අනෙකුත් අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය නිෂ්පාදනය අඩාල වී ඇත. (එක්සත් ජාතීන්ගේ සංවිධානය, 2023).

උත්සන්න වන දේශගුණික අර්බුදය හමුවේ ස්ත්‍රී පුරුෂ භාවය මත පදනම් වූ ශ්‍රම බර තවදුරටත් වැඩි වනු ඇතැයි අපේක්ෂා කෙරේ. මන්ද යත් කෘෂිකාර්මික අස්වැන්න අඩුවීම සහ ජීවන වියදම ඉහළ යාම හමුවේ පවුලේ යහපැවැත්ම රැකගැනීමේ ”ආරක්ෂක පලිහක්” ලෙස ස්ත්‍රීන්ගේ සුරැකුම් භූමිකාවන් ක්‍රියා කරන බැවිනි. ජාත්‍යන්තර ජල කළමනාකරණ ආයතනය (IWMI) විසින් ශ්‍රී ලංකාවේ ඉහළ දේශගුණික අවදානමක් සහිත පළාත් හතරක කරන ලද අධ්‍යයනයකින් හෙළි වූයේ මෙම වගකීම් වලට ප්‍රමුඛතාවය දීමේදී ස්ත්‍රීන් බොහෝ විට තම ආහාර වේ. සීමා කර ගැනීම සහ අත්‍යවශ්‍ය වෛද්‍ය ප්‍රතිකාර අත්හැර දැමීම හරහා පෝෂණ හා සෞඛ්‍ය ඌනතාවලට ගොදුරු වන බවයි (Arulingam et al., 2024).

පර්යේෂණ අධ්‍යයනවලින් පෙනී යන්නේ කෘෂිකාර්මික මෙන්ම රැකබලා ගැනීමේ කටයුතුවලද නිරත වන ස්ත්‍රීන්ට දේශගුණික තත්ත්වයන් වලින් එල්ලවන අයහපත් බලපෑම් තීව්‍රවනවාත් සමඟම තම සහකරුවන්ගෙන් එල්ල වන මානසික හා ශාරීරික හිංසනයන් වැඩි විය හැකි බවයි (Gunawardena, 2024). දේශගුණික කම්පන හේතුවෙන් ළමුන් ඇතුළු අවදානමට ලක්විය හැකි කණ්ඩායම් තවදුරටත් දරිද්‍රතාවයට ඇද දමන අතරම ආහාර මිල ඉහළ යාම, ආහාර අනාරක්ෂිතභාවය සහ සෞඛ්‍යයට ඇති වන බලපෑම් (උදා: මන්දපෝෂණය නිසා ඇතිවන මිටි බව) හේතුවෙන් දේශගුණික විපර්යාසවල අහිතකර බලපෑම්වලට ඔවුන් ගොදුරු වීමේ අවදානමද වැඩි කරයි. මෙවැනි බලපෑම් අවසානයේදී ස්ත්‍රීන් විසින් දරනු ලබන සුරැකුම් බර තවදුරටත් වැඩි කරන අතර අන්ත කාලගුණික තත්ත්වයන් තුළ රෝගාතුර වන පවුලේ සාමාජිකයන් සුවපත් කිරීමේ වගකීමද ඔවුන්ගේ කර මතටම පැටවේ. (UN Women, 2023; UNICEF, 2023).

ශ්‍රී ලංකාවේ ජාතිකව නිර්ණය කළ දායකත්වයන් (NDCs) (2026-2035) කෘෂිකර්මාන්තයේ නියැලී සිටින ස්ත්‍රීන්ට දේශගුණික ඔරොත්තු දීමේ හැකියාව වැඩි දියුණු කර ගැනීමට ඇති සැබෑ අභියෝග පිළිගනු ලබයි. ඉඩම් සහ උපකරණ වැනි නිෂ්පාදන වත්කම් සඳහා ඇති සීමිත ප්‍රවේශය හා හිමිකාරිත්වය මෙන්ම අදාළ පාලන හා තීරණ ගැනීමේ ක්‍රියාවලීන්හි නියෝජනයක් නොමැති වීම මීට ඇතුළත් වේ.

තීව්‍ර වන කාලගුණික රටාවන් හේතුවෙන් බෝග අසාර්ථක වීම්ල වගාබිම් සහ නිවාස වලට හානි සිදු වීම් සහ සෞඛ්‍ය තත්ත්වයන් පිරිහීම් සිදුවන පසුබිමක ස්ත්‍රීන්ට තම ආදායම වැඩි කර ගැනීමට හෝ සුරැකුම් බර ලිහිල් කර ගැනීමට අවස්ථාව නොමැති බැවින් ඔවුන්ගේ ජීවනෝපාය සහ සුරැකුම් වගකීම් යළිත් වරක් එකිනෙක ගැටෙන බව මෙහිදී පිළිගැනේ (පරිසර අමාත්‍යාංශය, 2025). ශ්‍රී ලංකාවේ දේශගුණික ප්‍රතිපත්ති ක්ෂේත්‍රය තුළ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ දේශගුණික විපර්යාසයන්හි අන්තර්ඡේදනය වන හෝ බහුවිධ අනුගාමී බලපෑම් පිළිබඳ අර්ථවත් ඇතුළත් කිරීමක් හෝ පරීක්ෂාවක් දක්නට නොලැබේ.

මෙම සන්දර්භය තුළ සමාජ ආරක්ෂණ යාන්ත්‍රණ සහ පොදු ප්‍රවාහන යටිතල පහසුකම් හෝ ළමා සුරැකුම්- වැඩිහිටි සුරැකුම් හෝ ආබාධිත පුද්ගලයන් සඳහා වූ සුරැකුම් පහසුකම් වැනි එදිනෙදා පහසුකම්ල දේශගුණික අනුවර්තනය සඳහා වූ මාර්ග ලෙස ප්‍රමාණවත් ලෙස ගවේෂණය කර නොමැත. ශ්‍රී ලංකාවේ ජාතිකව නිර්ණය කළ දායකත්වයන් (NDCs) (2025-2035) නාමිකව පිළිගන්නේ ස්වභාවික විපත් වලදී ස්ත්‍රීන්ගේ සුරැකුම් වගකීම් තීව්‍ර වන බැවින් පිරිහෙන දේශගුණික තත්ත්වයන් සුරැකුම් සපයන ස්ත්‍රීන්ට විශේෂයෙන් බලපාන බවයි. වැටුප් රහිත සුරැකුම් කටයුතු ස්ත්‍රීන් ගේ රැකියා නියුක්තියට සහ සංචලතාවයට බරපතල අභියෝගයක් බවත් එමඟින් හරිත රැකියා වල නියැලීමට හෝ කුසලතා වර්ධනය කර ගැනීමට ඇති හැකියාවට බාධා පමුණුවන බවත් NDCs තවදුරටත් සඳහන් කරයි.

CEDAW කමිටුව 2025 වසරේ ශ්‍රී ලංකාව පිළිබඳ සිය වාරික සමාලෝචනයේදී වැටුප් රහිත සුරැකුම් වැඩ වැඩ වල අසමාන බර ස්ත්‍රීන් මත පැටවීම සහ තීරණ ගැනීමේ ක්‍රියාවලීන් සඳහා ග්‍රාමීය  ස්ත්‍රීන්ගේ සහභාගීත්වය සීමිත වීම පිළිබඳව සිය සැලකිල්ල පළ කළේය. ශ්‍රී ලංකාවේ වයස්ගත වන ජනගහනය සඳහා වඩා හොඳ සුරැකුම් පද්ධතිවල අවශ්‍යතාවය සපුරාලීම සඳහා ILO මගින් ඉදිරිපත් කර ඇති 5R රාමුව මත පදනම් වූ සුරැකුම පිළිබඳ ජාතික මාර්ග සිතියමක් සහ ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීම ආරම්භ කර ඇත (The Morning, 2025). මෙම මුලපිරීම කාන්තා හා ළමා කටයුතු, කම්කරු, සෞඛ්‍ය සහ මුදල් අමාත්‍යාංශවලින් සමන්විත ක්‍රියාකාරී කණ්ඩායමක් විසින් මෙහෙයවනු ලැබේ. ශ්‍රී ලංකාව දේශගුණික විපර්යාස සඳහා නව ජාතික අනුවර්තන සැලැස්මක් (NAP) සකස් කරමින් සිටින අතර (පෙර සැලැස්ම 2025 දක්වා පමණක් ක්‍රියාත්මක වූ බැවින්) යටිතල පහසුකම්, මහජන සෞඛ්‍යය සහ ආර්ථික සුරක්ෂිතභාවය සම්බන්ධයෙන් දේශගුණික විපර්යාසයන්හි ස්ත්‍රී පුරුෂ සමාජභාවී බලපෑම් වඩා හොඳින් ඇතුළත් කිරීමට මෙහිදී අවස්ථාවක් පවතී.

ඉහළයන වාර ගණනකින් නැවත නැවත සිදුවන දේශගුණික විපත් හා බැඳුණු සමාජ පිරිවැය සංඛ්‍යානමය වශයෙන් තවමත් අදෘශ්‍යමාන වේ. එබැවින් හානි තක්සේරු කිරීම් ආපදා හදිසි ප්‍රතිචාර පද්ධති සැලසුම් කිරීම සහ පශ්චාත් ආපදා ප්‍රතිසාධන සැලසුම්කරණයේ දී හා කළමනාකරණයේ දී ඒ සඳහා අවධානය යොමු වන්නේ ඉතා අඩුවෙන්ය. ශ්‍රී ලංකාවේ පුරෝකථනය කරන ලද සාමාන්‍ය උෂ්ණත්වයන් පෙන්නුම් කරන්නේ සැලකිය යුතු උණුසුම් වීමක් වන අතර එමඟින් රට දරුණු උෂ්ණත්ව ඉහළ යාමකට උග්‍ර තාප තරංගවලට සහ වැඩිවන තාප පීඩනයට ලක් වේ (UNFPA, 2025). එමෙන්ම වඩාත් නිතර සිදුවන තීව්‍ර වර්ෂාපතනයන් මෙන්ම නියඟයේ දරුණු බව වැඩිවීමේ ප්‍රවණතා ද පුරෝකථනයන් මගින් පෙන්වා දෙයි (UNFPA, 2025). ශ්‍රී ලංකාව දේශගුණික විපර්යාස නිසා ඇතිවන ස්වභාවික විපත්වල වැඩිවන වාර ගණනකට සහ දරුණු ස්වභාවයකට මුහුණ දෙන බැවින් ආපදා ප්‍රතිචාර සහ දේශගුණික අනුවර්තන හා අවම කිරීමේ උපාය මාර්ග සකස් කිරීමේදී ස්ත්‍රී පුරුෂ සමාජභාවී අත්දැකීම් සහ බලපෑම් සැලකිල්ලට ගත යුතුය. ස්ත්‍රී පුරුෂ සමාජභාවය කෙරෙහි සංවේදී ප්‍රතිචාරයන් මගින් දේශගුණික බලපෑම් හමුවේ වැටුප් රහිත සුරැකුම් වැඩ හඳුනා ගැනීමල අවම කිරීම සහ ප්‍රතිව්‍යාප්තිය සිදු කළ යුතුය.

# ක්‍රමවේද විද්‍යා

මෙම වාර්තාවේ සාකච්ඡා කෙරෙන සොයාගැනීම් පදනම් වී ඇත්තේ කාන්තාව සහ මාධ්‍ය සාමූහිකය (Women and Media Collective) විසින් 2025 වසරේ මැයි මාසයේ සිට දෙසැම්බර් දක්වා මාස අටක කාලයක් පුරා සිදු කරන ලද නියමු අධ්‍යයනයක් පදනම් කරගෙනය. ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක තුනක් වන කොළඹ, ගම්පහ සහ මොණරාගල යන ප්‍රදේශවල ස්ත්‍රීන්ගේ වැටුප් රහිත සුරැකුම් වැඩ කෙරෙහි දේශගුණික විපර්යාස බලපාන ආකාරය මෙම අධ්‍යයනය මගින් ගවේෂණය කරන ලදී (දිස්ත්‍රික් ප්‍රොෆයිලය සඳහා ඊළඟ කොටස බලන්න).

මෙම අධ්‍යයනය සඳහා ප්‍රමාණාත්මක සහ ගුණාත්මක දත්ත රැස් කරමින් මිශ්‍ර ක්‍රමවේදයක් භාවිතා කරන ලදී. ඒ සඳහා සෑම දිස්ත්‍රික්කයකින්ම 20 දෙනෙකු බැගින් ස්ත්‍රීන් 60 දෙනෙකුගෙන් යුත් නියැදියක් යොදා ගැනුණි. මෙම ස්ත්‍රීන් 60 දෙනා හඳුනාගනු ලැබුවේ ප්‍රජා මූලික සංවිධානවල සහාය ඇතිව සිදුකළ අරමුණු සහගත නියැදි ක්‍රමවේදයක මගිනිග ඉන් අනතුරුව දේශගුණය සහ සුරැකුම් වැඩ අතර පවතින සබඳතාවයට සෘජුවම සම්බන්ධ වන ප්‍රතිචාර දක්වන්නන් වඩාත් හොඳින් හඳුනාගැනීම සඳහා අවශ්‍ය අවස්ථාවලදී 'හිමබෝල නියැදීම් ක්‍රමය' (Snowball sampling method) ක්‍රියාත්මක කරන ලදී. එමගින් දේශගුණික විපර්යාස පවතින යුගයක සුරැකුම් වැඩයන්හි වඩාත් සියුම් ස්වරූපයන් සහ අත්දැකීම් මෙන්ම ඒවා එකිනෙක කෙරෙහි බලපාන ආකාරය පිළිබඳ සාක්ෂි සපයා ගැනීමට හැකි විය. ආබාධිත පුද්ගලයන් රැකබලා ගන්නන් ආදායම් උපයන අතරම සුරැකුම් වැඩ සේවා සැපයීමේ ද්විත්ව බර දරන්නන් සහ කෘෂිකාර්මික අංශය වැනි දේශගුණික බලපෑම්වලට පහසුවෙන් ලක්විය හැකි ක්ෂේත්‍රවල රැකියාවල නියුතු වූවන් ද මෙයට ඇතුළත් වේ.

**සමස්තයක් වශයෙන් නියැදිය තෝරා ගැනීම සඳහා පහත සඳහන් නිර්ණායක භාවිතා කරන ලදී:**

- ස්ත්‍රී-පුරුෂ භාවය
- ගෘහස්ථ ආදායම් මට්ටම
- වයස (අවුරුදු 18-70 අතර)
- දේශගුණික බලපෑම්වලට ගොදුරු විය හැකි ප්‍රදේශවලට ඇති සමීපතාව

ප්‍රමාණාත්මක ක්‍රමවේදය මූලික ප්‍රජාවිද්‍යාත්මක දත්තවලට අමතරව ප්‍රධාන කොටස් හයකින් සමන්විත සවිස්තරාත්මක ප්‍රශ්නාවලියකින් සමන්විත විය:[1]

## 1 වන කොටස:

සාමාන්‍ය දිනයකදී[2] සුරැකුම් වැඩ සඳහා වැය කරන කාලය සහ දේශගුණික විපර්යාස පිළිබඳ ආකල්ප විමසා බැලෙන කාලය භාවිත කිරීම පිළිබඳ සමීක්ෂණයක්.

## 2 වන කොටස:

සුරැකුම් වැඩ බරෙහි වෙනස්වීම් - දේශගුණික ආපදාවකදී සුරැකුම් කටයුතු වෙනස් වී ඇති ආකාරය හෝ වඩාත් දුෂ්කර වී ඇති ආකාරය.

## 3 වන කොටස:

ආයතනික සහ ප්‍රජා උපකාරක සේවා - සහනාආධාර සහ වෙනත් ඕනෑම ආකාරයක උපකාර ලැබිය හැකි මාර්ග.

## 4 වන කොටස:

සුරැකුම් වැඩ බරට මුහුණ දීම සහ එය කළමනාකරණය කිරීම.

## 5 වන කොටස:

දේශගුණික ආපදා නිසා ඇති වන සෞඛ්‍ය බලපෑම් සහ සෞඛ්‍ය සේවා සඳහා ඇති ප්‍රවේශය.

## 6 වන කොටස:

දේශගුණික සිදුවීම් හමුවේ ගෘහස්ථ වියදම්.

[1] ප්‍රතිචාර දක්වන්නාගේ ප්‍රොෆයිල් (වයස, සිවිල් තත්ත්වය, ජාතිය, අධ්‍යාපන මට්ටම, ආදායම් මාර්ගය, මාසික ආදායම), ගෘහස්ථ තොරතුරු (පවුලේ සාමාජිකයන් සංඛ්‍යාව සහ ඔවුන්ගේ වයස, ආබාධිත/නොහැකියාවන් සහිත තත්ත්වය, ආදිය), ප්‍රදේශය පිළිබඳ තොරතුරු (පවතින වැඩ පිළිබඳ පහසුකම්).

[2] මෙම අවස්ථාවෙහිදී 'සාමාන්‍ය දිනයක්' යන්නෙන් අදහස් කරන්නේ දේශගුණික ආපදාවකින් හෝ අතිශය අයහපත් කාලගුණික තත්ත්වයකින් බාධාවක් සිදු නොවූ දිනයකිග

ගුණාත්මක දත්ත රැස්කිරීමේ අංගය සඳහා එක් දිස්ත්‍රික්කයකින් තිදෙනෙකු බැගින් තෝරාගත් ප්‍රතිචාර දක්වන්නන් සමඟ පවත්වන ලද අවධානය යොමු කළ කණ්ඩායම් සාකච්ඡා ඇතුළත් විය. මොවුන් තෝරාගනු ලැබුවේ මූලික ප්‍රශ්නාවලිය මගින් අනාවරණය කරගත් විවිධ අත්දැකීම් නියෝජනය වන පරිදි ය. මෙම සාකච්ඡා අර්ධ ව්‍යුහගත සම්මුඛ සාකච්ඡා ලෙස පවත්වන ලද අතර මූලික සමීක්ෂණයෙන් මතු වූ තේමාවන් සහ කරුණු වඩාත් ගැඹුරින් විමර්ශනය කිරීම සඳහා ඒවා සැලසුම් කර තිබුණි.

මෙම සාකච්ඡාවලට අමතරව ස්ත්‍රීන්, ළමුන්, වැඩිහිටියන් සහ ආබාධිත පුද්ගලයන් කෙරෙහි දේශගුණික විපර්යාස බලපාන ආකාරය පිළිබඳ ප්‍රමුඛතා සහ ආකල්ප මැන බැලීම සඳහා එක් දිස්ත්‍රික්කයකින් දෙදෙනෙකු බැගින් ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන් සම්මුඛ සාකච්ඡාවට ලක් කරන ලදී. තවද මෙම සම්මුඛ සාකච්ඡා මගින් දේශීය දේශගුණික ප්‍රතිචාර හැඩගස්වන ආයතනික සාධක පිළිබඳ අමතර පසුබිමක් සපයන ලද අතර විශේෂයෙන්ම වඩාත් ඇතුළත් සහ ස්ත්‍රී-පුරුෂ භාවය කෙරෙහි සංවේදී වූ අනුවර්තන ක්‍රියාමාර්ග සඳහා පවතින හිඩැස් - බාධාවන් සහ අවස්ථාවන් පිළිබඳව ද අවධානය යොමු කරන ලදී.

## සීමාවන්

මෙම අධ්‍යයනයෙහි සොයාගැනීම් පොදුවේ අදාළ කරගැනීමේ හැකියාවට  බලපෑම් කළ අඩුපාඩු කිහිපයක් පැවතිණි. අරමුදල් සීමිත වීම හේතුවෙන් දිස්ත්‍රික්ක තුනක් පුරා ස්ත්‍රීන් 60 දෙනෙකුගෙන් යුත් කුඩා නියැදියක් පමණක් තෝරා ගැනීමට සිදු විය. ණියැඳිය තුළ සහ දිස්ත්‍රික්ක අතර පවතින විවිධත්වයේ අඩුව, විශේෂයෙන්ම තෝරාගත් දිස්ත්‍රික්ක 3න් 2ක්ම බස්නාහිර පළාතේ වීම, ශ්‍රී ලංකාවේ අනෙකුත් ප්‍රදේශවලට සහ බහුවිධ අවදානම්වලට මුහුණ දෙන අනෙකුත් ප්‍රජාවන්ට (උදාහරණ ලෙස යුද්ධයෙන් පසු නැවත පදිංචි වූ ප්‍රජාවන්, වතු අංශයේ කම්කරුවන් සහ දුරස්ථ වෙනත් ආපදා සහිත ප්‍රදේශවල වෙසෙන පවුල්) මෙම අධ්‍යයනයේ වලංගුභාවය සීමා කරයි. ඔවුන්ගේ සමාජ ආර්ථික හා පාරිසරික තත්ත්වයන් මෙම නියැළිය තුළ හසු නොවන සුවිශේෂී අවදානම් සහිත ස්වරූපයන් පෙන්නුම් කරයි. බස්නාහිර පළාතේ දිස්ත්‍රික්ක දෙක තුළ එකම ආකාරයේ සොයාගැනීම් ලැබීමේ හැකියාව අවම කිරීම සඳහා දිස්ත්‍රික්ක තුන අතර පවතින සංවර්ධන මට්ටම් පිළිබඳව වැඩි අවධානයක් යොමු කරන ලදී. එමගින් නාගරිකල අර්ධ නාගරික සහ ග්‍රාමීය ප්‍රදේශවල අත්දැකීම්වල පවතින වෙනස්කම් මතු කරමින් සොයාගැනීම් වඩාත් අර්ථවත් කිරීමට හැකි විය. ඒ අනුව එකම පළාතකට අයත් දිස්ත්‍රික්ක අතර වුවද අත්දැකීම් සහ ආකල්පවල පවතින වෙනස්කම් මෙම දත්ත මගින් මනාව පැහැදිලි කෙරේ.

තවද කාල සීමාවන් ද සොයාගැනීම් පොදුවේ අදාළ කරගැනීමේදී අභියෝගයක් විය. මෙම සමීක්ෂණය ප්‍රධාන වශයෙන් පවත්වන ලද්දේ 2025 වසරේ ජූලි සහ අගෝස්තු මාසවලදී වන අතර එය ශ්‍රී ලංකාවේ දකුණු සහ බස්නාහිර ප්‍රදේශවලට තද වැසි ලැබෙන සහ ඍතුමය අස්ථාවරත්වයක් පවතින කාලයකි. මේ හේතුවෙන් දත්ත තුළ ඍතුමය පක්ෂග්‍රාහීත්වයක් ඇති විය හැකිය. මන්ද එම කාලය තුළ ප්‍රතිචාර දක්වන්නන්ගේ අත්දැකීම් වසරේ අනෙකුත් කාලසීමාවන්හි පවතින තත්ත්වයන් නිරූපණය නොකිරීමට ඉඩ ඇති බැවිනි. සමස්තයක් ලෙස මෙම සීමාවන්ගෙන් පෙනී යන්නේ මෙම අධ්‍යයනය වටිනා අවබෝධයක් ලබා දෙන අතරම අනාගත පර්යේෂණ සඳහා වඩාත් පුළුල් නියැදියක් වැඩි භූගෝලීය විවිධත්වයක් සහ දිගුකාලීන දත්ත රැස්කිරීමක් ප්‍රයෝජනවත් වන බවයි.

එසේ වුවද වඩාත් ක්‍රමවත් ලෙස ස්ත්‍රී-පුරුෂ භාවය අනුව වෙන් කරන ලද දත්ත රැස් කිරීමේ අවශ්‍යතාව මෙම අධ්‍යයනයේ සොයාගැනීම් මගින් ඉස්මතු කරයි. එසේ නොමැති වුවහොත් දේශගුණික සහ සංවර්ධන සැලසුම්කරණයේදී ස්ත්‍රීන් මුහුණ දෙන සුවිශේෂී වූත් විවිධ වූත් අවදානම් සහ බරපතලකම් නිසි ලෙස හඳුනා ගැනීමට නොහැකි වනු ඇත.

# දිස්ත්‍රික්ක පැතිකඩ

## දිස්ත්‍රික් මට්ටමින් දේශගුණික අවදානම සහ ආපදා අවදානම

ශ්‍රී ලංකාව තුළ අන්තගාමී කාලගුණික තත්ත්වයන් සහ ස්වාභාවික ආපදාවන්ගේ තීව්‍රතාවය මෙන්ම වාර ගණන ද ඉහළ යනු ඇතැයි පුරෝකථනය කර ඇති අතර එය සෘජුවම බලපෑමට ලක්වන ප්‍රජාවන්ට දැඩි තර්ජනයක් එල්ල කරයි (De Alwis & De Noy, 2019). ඉදිරි වසරවලදී ශ්‍රී ලංකාවට බලපාන ආපදා අතර ගංවතුර සහ නියඟය වඩාත් නිතර සිදුවනු ඇතැයි අපේක්ෂා කෙරේ. මෙහිදී ආහාර සහ ජලය වැනි අත්‍යවශ්‍ය සම්පත්වලට ඇති ප්‍රවේශයට අමතරව ජීවනෝපාය කෘෂිකර්මාන්තය සහ යටිතල පහසුකම් අඩාල කිරීමට ද මෙම ආපදාවන්ට විශාල හැකියාවක් පවතී (දේශගුණික විපර්යාස පිළිබඳ අන්තර් රාජ්‍ය මණ්ඩලය, 2014).

මෙම ව්‍යාපෘතිය සඳහා දිස්ත්‍රික්ක තුනක් තෝරා ගන්නා ලදී: කොළඹල ගම්පහ සහ මොණරාගල කොළඹ යනු අධික උෂ්ණත්වයල ගංවතුර සහ වායු දූෂණයට ගොදුරු වීමේ වැඩි ප්‍රවණතාවක් ඇති නාගරික දිස්ත්‍රික්කයකි (Nanayakkara et al., 2023). එහි නාගරික පරිසරය තුළ නාගරික තාප දූපත් බලපෑම දක්නට ලැබේ. අවිධිමත් හා ශීඝ්‍ර සංවර්ධනය, ගොඩනැගිලි ඝනත්වය ඉහළ යාම අඳුරු මතුපිටවල් සහ වෘක්ෂලතාදිය අඩුවීම වැනි සාධක නිසා අවට ග්‍රාමීය ප්‍රදේශවලට වඩා මෙහි උෂ්ණත්වය ඉහළ අගයක් ගනී (Nanayakkara et al., 2023; Emmanuel et al., 2023; Rangalge et al., 2017).

කොළඹ දිස්ත්‍රික්කයේ පර්යේෂණ සඳහා කේන්ද්‍රස්ථානය ලෙස කොලොන්නාව නගර සභා බලප්‍රදේශය තෝරා ගන්නා ලදී. නාගරීකරණය මෙන්ම ජල මූලාශ්‍ර පිටාර ගැලීම හේතුවෙන් නිතර ගංවතුර ඇතුළු අන්තගාමී කාලගුණික තත්ත්වයන්ට මුහුණ දෙන ප්‍රදේශයක් වීම මෙයට හේතුවයි (Dissanayake & Sangasumana, 2017). ප්‍රනාන්දු (2018) ට අනුව මෙම ප්‍රදේශය UHI බලපෑමට 71% ක අවදානමක් පෙන්වන අතර අවදානමට ලක්විය හැකි ග්‍රාම නිලධාරී වසම් 14 ක් හඳුනාගෙන ඇත. කෙසේ වෙතත් 2024 වසර ශ්‍රී ලංකාවේ වාර්තාගත උණුසුම්ම වසර ලෙස සටහන් වීමත් සමඟ තාප දර්ශකයේ (Heat Index) කැපී පෙනෙන ඉහළ යාම මත පදනම්ව UHI රටා සඳහා හඳුනාගත් භූමි ප්‍රමාණය තවදුරටත් වැඩි වී ඇති බව උපකල්පනය කළ හැකිය (Sumaiya et al., 2025; Perera & Perera, 2025; Piratheeparajah & Dhanushan, 2024).

ගම්පහ යනු කැළණි ගඟට සමීපව පිහිටීම නිසා ගංවතුර අවදානමට ලක්වන අර්ධ නාගරික නගරයකි. කොළඹ දිස්ත්‍රික්කය මෙන්ම ගම්පහ ද අවිධිමත් නාගරීකරණයට මුහුණ දී ඇති අතර එමඟින් ජලය බැසයාම වළක්වන 'අපාරගම්‍ය මතුපිට' වැඩි වී ඇත (Arambegedara and Nwankwo, 2025; Dammalage and Jayasinghe, 2019).

ගම්පහ නගරයේ පදිංචිකරුවන්ට අනුව පසුගිය වසර 7 තුළ ඇති වූ හදිසි ගංවතුර සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී ඇත්තේ: කඩවත සිට මීරිගම දක්වා අධිවේගී මාර්ගය වැනි යටිතල පහසුකම් ව්‍යාපෘති සඳහා සිදුකළ නීත්‍යානුකූල සහ අනවසර ගොඩකිරීම්ල කාණු පද්ධති පිළිබඳ අවධානය යොමු නොකර (එය අනවශ්‍ය වියදමක් ලෙස සලකා) සිදුකළ මාර්ග සංවර්ධන කටයුතු (Warakapitya, 2024).

ගම්පහ දිස්ත්‍රික්කයේ පර්යේෂණ කේන්ද්‍රස්ථාන වූයේ බියගම සහ මල්වාන යන ප්‍රදේශයි. කැළණි ගඟ ආශ්‍රිත මෙම අධි-අවදානම් කලාප දෙක නිරන්තරයෙන් දරුණු ගංවතුර තත්ත්වයන්ට මුහුණ දෙන අතර පරිසර පද්ධති පිරිහීම සහ යටිතල පහසුකම් ආශ්‍රිත දුර්වලතා හේතුවෙන් ගෘහස්ත මට්ටමින් දේශගුණික අවදානම තවදුරටත් සංකීර්ණ වී ඇත. (Liyanarachchi, 2024; Samarasinghe et al., 2022).

සාමාන්‍යයෙන් ශ්‍රී ලංකාවේ ප්‍රධාන මෝසම් කාල දෙකක් පවතී; ඒ ඊසානදිග මෝසම හා සම්බන්ධ මහ කන්නය (සැප්තැම්බර්-මාර්තු) සහ නිරිතදිග මෝසම හා සම්බන්ධ යල කන්නය (මැයි-අගෝස්තු) වේ. මෙම මෝසම් තත්ත්වයන් දිවයිනට නව දෙයක් නොවුණත්ල දේශගුණික විපර්යාස හේතුවෙන් ඒවායේ තීව්‍රතාවය සහ විනාශකාරී හැකියාව ඉහළ ගොස් ඇත. මෙහි ප්‍රතිඵලයක් ලෙස වර්ෂාපතනයේ විචල්‍යතාවය කාලයත් සමඟ දැඩි වී ඇති අතර එය අන්තගාමී වර්ෂාපතන තත්ත්වයන්ට දීර්ඝ නියං කාලයන්ට සහ සාම්ප්‍රදායික කාලගුණ රටා වෙනස් වීමට මඟ පාදා ඇත. මේ හේතුවෙන් මෑත වසරවලදී ශ්‍රී ලංකාවට බලපාන විශාලතම සහ නිරන්තරයෙන්ම සිදුවන දේශගුණික විපර්යාසයක් ලෙස ගංවතුර හඳුනාගත හැකිය. (De Alwis & De Noy, 2019). අබේවර්ධන (2024) ට අනුව 2010 වසරේ සිට ශ්‍රී ලංකාවේ සිදු වූ සියලුම ප්‍රධාන ගංවතුර තත්ත්වයන්ට හේතුව දේශගුණික විපර්යාසයන්ය.

මෙම ව්‍යාපෘතිය සඳහා තෝරාගත් දිස්ත්‍රික්ක දෙකක් වන කොළඹ සහ ගම්පහ මෑත වසරවලදී කිහිප වතාවක්ම ගංවතුරට ගොදුරු විය. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයට අනුව 2020 වසරේදී පුද්ගලයින් 40,000 කට අධික සංඛ්‍යාවක් අවතැන් වූ අතර 2024 වසර වන විට එම සංඛ්‍යාව 150,000 දක්වා ඉහළ ගියේය. (Floodlist, 2020; Relief Web, 2024).

එලෙසම වර්තමාන දේශගුණික විපර්යාස පුරෝකථනයන්ට අනුව ඉහළ යන උෂ්ණත්වය සහ වෙනස් වන වර්ෂාපතන රටා හේතුවෙන් ශ්‍රී ලංකාවේ නියඟය ද වඩාත් නිතර හා දරුණු වනු ඇතැයි අපේක්ෂා කෙරේ.  2008-2018 කාලය තුළ ශ්‍රී ලංකාවේ පුද්ගලයන් මිලියන 8ක් දක්වා නියඟයෙන් පීඩාවට පත් වූ අතර එය පුළුල් ජල හිඟයකට සහ කෘෂිකාර්මික අස්වැන්න අඩුවීමට හේතු විය (Igoor, 2024). ලංකාවේ වියළි කලාපය විශේෂයෙන් උතුරු සහ නැගෙනහිර ප්‍රදේශ මෙන්ම ඌව පළාත මේ සම්බන්ධයෙන් දැඩි අවදානමක පවතී. මින් ඌව පළාතේ මොණරාගල  දිස්ත්‍රික්කය දැඩි ලෙස නියඟයට ගොදුරු වන දිස්ත්‍රික්කයක් ලෙස හඳුනාගෙන ඇත (පරිසර අමාත්‍යාංශය 2020) මෙම ව්‍යාපෘතිය යටතේ මොණරාගල දිස්ත්‍රික්කයේ පර්යේෂණ කේන්ද්‍රස්ථානය ලෙස බලහරුව ග්‍රාම නිලධාරී වසම තෝරා ගන්නා ලදී. නිතර ඇතිවන දීර්ඝ වියළි කාලගුණය සහ ඉහළ යන වාෂ්පීකරණ වේගය හේතුවෙන් එම ප්‍රජාවන් ආහාර අනාරක්ෂිතභාවය ආර්ථික අස්ථාවරත්වය සහ ජල සම්පත් සපයා ගැනීමේ දුෂ්කරතා වලට මුහුණ දී සිටිති (UNDP, 2024).

*වැදගත් කරුණක් වන්නේල මෙම ව්‍යාපෘතිය සඳහා දත්ත රැස් කිරීමේ කාලසීමාව 2025 ජූලි සහ අගෝස්තු මාසවලදී සිදු කිරීමයි. එය 2025 නොවැම්බර් 28 වන දින මෙරටට කඩා වැදුණු 'ඩිට්වා' (Ditwah) සුළි කුණාටුවට මාස තුනකට පමණ පෙර සිදු වූවකිග මෙම ව්‍යසනය ව්‍යාපෘතිය ක්‍රියාත්මක වූ දිස්ත්‍රික්ක තුනටම මෙන්ම ශ්‍රී ලංකාවේ තවත් බොහෝ ප්‍රදේශවලට සෘජුවම බලපෑවේය. ඒ සමඟ ඇති වූ ගංවතුර සහ නායයෑම් හේතුවෙන් 2025 දෙසැම්බර් වන විට පුද්ගලයින් 640 කට අධික සංඛ්‍යාවක් මියගොස් ඇති බව තහවුරු වූ අතර 203 කට වැඩි පිරිසක් අතුරුදහන් වී ඇති අතර මිලියන 23 කට අධික පිරිසක් පීඩාවට පත් වූහ (Mustafa, 2025).*

*එමනිසා මෙම ව්‍යාපෘතියේ සොයාගැනීම්වලට ලේඛනගත කරන අවස්ථාවේ සිදු වූ මෑතකාලීන මහා දේශගුණික ව්‍යසනය ඇතුළත් නොවන අතර එය 2025 ජූලි මාසය දක්වා සහ එම කාලය තුළ සමීක්ෂණයට ලක් වූ ස්ත්‍රීන් 60 දෙනා මුහුණ දුන් ව්‍යසනයන් පිළිබඳ අතීතාවර්ජනයක් පමණක් බව සලකන්න.*

[3] These numbers do not make up an official count as recovery and relief operations are - at the time of writing - not yet completed.

# ජනවිකාශන තොරතුරු

සමීක්ෂණයට ලක් කරන ලද ස්ත්‍රීන් 60 දෙනාගේ ජනගහන සහ ප්‍රොෆයිල් දත්ත විශ්ලේෂණය කිරීමේදී පෙනී යන්නේ ආයතනික සහයෝගය ඉතා සීමිත මට්ටමක පවතින පසුබිමක, එනම් සුරැකුම් කටයුතු සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සම්පූර්ණයෙන්ම පාහේ නොමැති තත්ත්වයක් තුළ, ස්ත්‍රීන් සැබවින්ම ගෘහස්ථ සුරැකුම් කටයුතු සහ දේශගුණික පීඩනය යන දෙකෙහිම බර උසුලන පීඩන අවශෝෂකයන් (shock absorbers) බවයි. එසේම ඔවුන් මත යැපෙන්නන්ගේ අනුපාතය ද අසාමාන්‍ය ලෙස ඉහළ මට්ටමක පවතින බව මෙහිදී අනාවරණය විය.

මුළු නියැදියෙන් බහුතරයක් එනම් 76.7%ක් (පුද්ගලයන් 46 දෙනෙකු) විවාහක අය වෙති. සමස්ත නියැදියෙන් 83.3%ක් (පුද්ගලයන් 50 දෙනෙකු) තමන් මත යැපෙන දරුවන් රැකබලා ගන්නා බව වාර්තා විය.

- දරුවන් රැකබලා ගැනීමේ වගකීම් වැඩිම වශයෙන් වාර්තා වන්නේ මොණරාගල සහ ගම්පහ දිස්ත්‍රික්කවලින් වන අතර එම සෑම දිස්ත්‍රික්කයකම ස්ත්‍රීන් 20 දෙනෙකුගෙන් 18 දෙනෙකුම දරුවන් රැකබලා ගැනීමේ නිරත වෙති. කොළඹ දිස්ත්‍රික්කයේ ස්ත්‍රීන් 14 දෙනෙකු එම වගකීම් ඉටු කරති.

එසේම නියැදියෙන් සැලකිය යුතු පිරිසක් ආබාධිත පුද්ගලයන් රැකබලා ගැනීමේ නිරතව සිටිති:

- සමස්ත නියැදියෙන් 61.7%ක් අවම වශයෙන් එක් ආබාධිත පුද්ගලයෙකු හෝ රැකබලා ගනිති.

වගුව 1

**නිවෙස්වල වෙසෙන ආබාධිත පුද්ගලයන්**


| | කොළඹ | මොණරාගල | ගම්පහ |
|---|---|---|---|
| **ඇත** | 95.0%[3] | 30.0% | 60.0% |
| **නැත** | 5.0% | 70.0% | 40.0% |
| **නියැදිය** | 20 | 20 | 20 |

විශේෂයෙන්ම, ආබාධිත පවුලේ සාමාජිකයෙකු රැකබලා ගන්නා බව වාර්තා කළ ස්ත්‍රීන් අතරින් එම යැපෙන්නන්ගෙන් බහුතරයක් දරුවන් (67.6%) වේ. දේශගුණික විපර්යාස හේතුවෙන් ගමනාගමනයට බාධා ඇති වූ විට ඖෂධ ලබා ගැනීමට ඇති ප්‍රවේශය අහිමි වූ විට හෝ අත්‍යවශ්‍ය වැඩ අඩාල වූ විට මෙම දරුවන් මෙන්ම ඔවුන්ව රැකබලා ගන්නා ස්ත්‍රීන් ද දැඩි අවදානමකට ලක් වේ.

එමෙන්ම දත්ත මගින් හෙළිවන තවත් කරුණක් වන්නේ ආබාධිත දරුවන්ට පසුව දෙවනුවට වැඩිම පිරිසක් ලෙස ආබාධ සහිතව සිටින්නේ එම ස්ත්‍රීන් ම (13.5%) බවයි. මෙයින් ඔවුන් උසුලන බහුපාර්ශවීය බර පැහැදිලි වේ; එනම් ඔවුන් ආබාධ සහිතව සිටිමින්ම අන් අයව රැකබලා ගන්නන් ලෙස කටයුතු කරන අතර සාමාන්‍ය දෛනික අවශ්‍යතාවලට අමතරව දේශගුණික විපර්යාසයන්ට අනුවර්තනය වීම සඳහා ද ඔවුන්ට විශේෂිත අවශ්‍යතා පවතී.

රූපසටහන 1

**පවුලේ ආබාධිත සාමාජිකයන් සමඟ ඇති සම්බන්ධතාවය**




වර්ධිත පවුල් සුරැකුම සම්බන්ධයෙන් වැඩිම ප්‍රතිශතයක් වාර්තා වන්නේ ගම්පහ දිස්ත්‍රික්කයෙන් වන අතර එහිදී ප්‍රතිචාර දැක්වූවන්ගෙන් 55%ක් (20 දෙනෙකුගෙන් 11 දෙනෙකු) තම සමීපතම පවුලේ සාමාජිකයන්ට අමතරව වෙනත් ඥාතීන්ව ද රැකබලා ගනිති. මෙය කොළඹ (25%) හෝ මොණරාගල (20%) නියැදියන් සමඟ සැසඳීමේදී බෙහෙවින් ඉහළ අගයකි (වගුව.2 බලන්න). විශේෂයෙන්ම සමස්ත නියැදිය හා සැසඳීමේදී ස්වයං රැකියාවල නියුතු ස්ත්‍රීන් වැඩිම ප්‍රමාණයක් වාර්තා වන්නේ ද ගම්පහ දිස්ත්‍රික්කයෙන් (දිස්ත්‍රික් මට්ටමේ නියැදියෙන් 45%) වීම කැපී පෙනේ.

[3] කොළඹ දිස්ත්‍රික්කයේ නියැදිය හඳුනා ගැනීම සඳහා සහය වූයේ ආබාධිත ප්‍රජාවගේ අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටින සංවිධානයක් බව මෙහිදී මතක තබා ගැනීම වැදගත් වේ. එසේ වුවද මෙම නිශ්චිත ප්‍රදේශයේ ස්ත්‍රීන් ගෙන් 95%ක්ම අවම වශයෙන් එක් ආබාධිත පුද්ගලයෙකු හෝ රැකබලා ගන්නා අතර, ඔවුන්ට ප්‍රජා මූලික ආබාධිත ජාලයකින් ලැබෙන සහයෝගය හැර වෙනත් කිසිදු ආයතනික ආබාධි. සහනයක් හෝ සුරැකුම් සහයෝගයක් නොලැබේ.

මෙම සාධක දෙකම එකට ගත් කළ මෙම ප්‍රදේශයට විශේෂ වූ මෝසම් සහ ගංගා පිටාර ගැලීම් වැනි දේශගුණික බලපෑම් බොහෝ යැපෙන්නන් සිටින සහ සීමිත සහයෝගිතා ජාලයන් සහිත නිවාස ඒකක කෙරෙහි අසමාන ලෙස බලපාන බව පෙනී යයි. එමෙන්ම මෙම ආපදා හේතුවෙන් ඔවුන්ගේ ජීවනෝපායන් අඩාල වන විට මෙම ස්ත්‍රීන් තවදුරටත් දැඩි අනාරක්ෂිතභාවයකට ඇද දැමීමට ද එය හේතු වේ.

**වගුව 2**

**නිවසේ වසන සමීපතම නොවන පවුලේ සාමාජිකයන්**

| | කොළඹ | මොණරාගල | ගම්පහ |
|---|---|---|---|
| **ඇත** | 25.0% | 20.0% | 55.0% |
| **නැත** | 75.0% | 80.0% | 45.0% |
| **නියැදිය** | 20 | 20 | 20 |

කෙසේ වෙතත් දිස්ත්‍රික්ක පුරා සිටින ප්‍රතිචාර දැක්වූවන් තහවුරු කළේ, නිවසේ වෙසෙන විස්තෘත පවුලේ සාමාජිකයන් බොහෝ විට නිවසේ දෛනික වැඩකටයුතු සඳහා සහයෝගය දක්වන බවයි. මෙයින් පෙනී යන්නේ ස්ත්‍රීන් ගේ බර ලිහිල් කරන (නමුත් එය සම්පූර්ණයෙන් ඉවත් නොකරන) යම් ආකාරයක නොනිල අන්‍යෝන්‍ය උපකාරක පද්ධතීන් පවතින බවයි.

ළමා සුරැකුම් මධ්‍යස්ථානවල පවතින සුලභතාවය පිළිබඳ ප්‍රශ්නයට ලැබුණු ප්‍රතිචාර 3 වන වගුවේ දක්වා ඇත:

**වගුව 3**

**නිවෙස්වලට ආසන්නව ළමා සුරැකුම් මධ්‍යස්ථාන පිහිටා තිබීම**

| | කොළඹ | මොණරාගල | ගම්පහ |
|---|---|---|---|
| **ඇත** | 0.0% | 0.0% | 10.0% |
| **නැත** | 100.0% | 100.0% | 90.0% |
| **නියැදිය** | 20 | 20 | 20 |

දිස්ත්‍රික් මට්ටමේ ප්‍රතිචාර මගින් ළමා සුරැකුම් මධ්‍යස්ථාන පිළිබඳ යම් දැනුවත්භාවයක් පවතින බව ඇඟවුම් කළද සමස්ත පින්තූරය ඉතා අඳුරු සහ අසතුටුදායක එකකි:

- සමස්ත නියැදියෙන් තමන් පදිංචි ප්‍රදේශයේ ළමා සුරැකුම් මධ්‍යස්ථාන පවතින බව හෝ ඒ පිළිබඳව තමන් දන්නා බව විශ්වාසයෙන් යුතුව තහවුරු කළේ 33%ක් වැනි ඉතා සුළු පිරිසක් පමණි. මේ පිළිබඳ දැනුවත්භාවය වැඩි වශයෙන්ම වාර්තා වූයේ:

මෙම ප්‍රතිචාර සහ සමස්තයක් ලෙස වාර්තා වූ අතිශය අඩු තහවුරු කිරීමේ ප්‍රතිශතය මගින් හෙළිවන්නේ එවැනි මධ්‍යස්ථානවල ඇති සීමිත බව පමණක් නොවේ. එම සේවා පිළිබඳ පවතින අවම ප්‍රසිද්ධිය ඒවා කෙරෙහි ඇති විශ්වාසය මදිකම හෝ ප්‍රවේශ වීමේ අපහසුව ද මෙයින් පැහැදිලි වේ. මෙයින් පෙනී යන්නේ ස්ත්‍රීන් අතිමහත් ලෙස පෞද්ගලික හෝ නොනිල රැකවරණ ක්‍රමවේද මත යැපෙන බවත් එම ක්‍රමවේදයන් ඉතා අස්ථාවර මෙන්ම දැනටමත් උපරිම සීමාවට වඩා බරක් දරා සිටින ඒවා බවත්ය.

> ළඟපාත දැරිය හැකි මිලකට ළමා සුරැකුම් මධ්‍යස්ථාන තිබුණත් මම දන්නවා ඔහුට (ආබාධිත පුතාට) මා සලකන ආකාරයට රැකවරණය දෙන්න කාටවත් බැරි බව ඔහුගේ අවශ්‍යතා වෙනස්ග ඒවා ඔවුන්ට තේරුම් ගන්න බැහැ
>
> කාන්තාවක්- වයස 44 -කොළඹ

තවද දිස්ත්‍රික්ක තුනේම ප්‍රතිචාර දැක්වූවන් ඒකමතිකව ප්‍රකාශ කළේ තම ප්‍රජාවන් තුළ වැඩිහිටි සුරැකුම් මධ්‍යස්ථාන කිසිවක් නොමැති බවයි. දේශගුණික විපර්යාසයන්ට ඔරොත්තු දීමේ හැකියාව සම්බන්ධයෙන් ගත් කල මෙම හිඩැස ඉතා තීරණාත්මක බලපෑමක් ඇති කරයි. මන්දයත්, දේශගුණය ආශ්‍රිත ආපදා අවස්ථාවලදී වැඩිහිටි පුද්ගලයන්ට දැඩි සහ අඛණ්ඩ රැකවරණයක් අවශ්‍ය වන බැවිනි. එබැවින්, ගම්පහ දිස්ත්‍රික්කයේ දක්නට ලැබෙන පරිදි යැපෙන වැඩිහිටියන් කිහිප දෙනෙකු සිටින නිවාස ඒකක දේශගුණික ආපදා හමුවේ දැඩි හා වර්ධනය වන අවදානමකට නිරාවරණය වේ. මෙය දැනටමත් සීමිත මට්ටමක පවතින රැකවරණය සැපයීමේ හැකියාව තවදුරටත් අසීරුතාවයට පත් කරයි.



## කොටස 1

# කාලය භාවිතය පිළිබඳ සමීක්ෂණය සහ දේශගුණික විපර්යාස පිළිබඳ ආකල්ප

Monaragala, Sri Lanka
Farmer in drought-affected area

ප්‍රශ්නාවලියට කාලය භාවිතය පිළිබඳ සමීක්ෂණයක් ඇතුළත් කරන ලද අතර එහිදී ප්‍රතිචාර දැක්වූවන්ට ආදායම් උත්පාදන කටයුතු සහ විවේකී කාලයට අමතරව සෘජු සහ වක්‍ර සුරැකුම් වැඩ සඳහා දිනකට පැය කීයක් වැය කරන්නේද යන්න සටහන් කරන ලෙස ඉල්ලා සිටින ලදී. සාමාන්‍ය දිනයක් තුළ රැකවරණය ආශ්‍රිත ක්‍රියාකාරකම් සඳහා වැය කරන කාලය සිතියම්ගත කිරීමේ මෙවලමක් වන මෙම කාලය භාවිතය පිළිබඳ සමීක්ෂණය මෙහිදී ප්‍රධාන අරමුණු තුනක් ඉටු කරයි. එමගින් 'ශ්‍රමය' යන්න විවිධ ස්වරූප ගන්නා ආකාරය "විශේෂයෙන් දේශගුණික විපර්යාස සන්දර්භය තුළ" පැහැදිලි කරයි.

වඩාත් නිශ්චිතව පවසන්නේ නම් කාලය භාවිතය පිළිබඳ සමීක්ෂණය මගින්: දිනක් තුළ සිදු කරනු ලබන වැඩ කොටසෙහි ප්‍රමාණය සංඛ්‍යාත්මකව දක්වයි. 'කාල දරිද්‍රතාවය' ප්‍රායෝගිකව පෙන්නුම් කරයි. දේශගුණික සිදුවීම් සහ ඒ ආශ්‍රිත බාධා කිරීම් හේතුවෙන් දැනටමත් බරපතල වී ඇති වැඩ ප්‍රමාණය තවදුරටත් ඉහළ යන ආකාරය පිළිබඳ සන්දර්භානුගත දළ සටහනක් ඉදිරිපත් කරයි. මෙම කොටස මගින් මූලික වශයෙන් පළමු කරුණ එනම් සාමාන්‍ය දිනයක සිදු කරනු ලබන කාර්යයන්හි ප්‍රමාණය පිළිබඳව සාකච්ඡා කෙරෙන අතර දේශගුණික විපර්යාස හේතුවෙන් දෛනික චර්යාවන්ට සහ ස්ත්‍රීන් ගේ වැඩකටයුතු වලට එල්ල වන බාධාකාරී බලපෑම පිළිබඳව 2 වන කොටසින් විස්තර කෙරේ.

## 1.1 සෘජු සුරැකුම් කටයුතු සඳහා වැය කළ කාලය

දිස්ත්‍රික්ක තුන පුරාම දත්ත පෙන්වා දෙන්නේ ස්ත්‍රීන්ගේ කාලය අතිමහත් ලෙස සෘජු සුරැකුම් වැඩ සඳහා වැය වන බවයි. මෙයින් ස්ත්‍රීන්ගේ ජීවිත සහ ආර්ථික තේරීම් හැඩගැස්වීමේදී වැටුප් රහිත සුරැකුම් වැඩ හි ඇති ප්‍රධාන භූමිකාව යළිත් තහවුරු වේ. මෙහිදී සෘජු සුරැකුම් ලෙස හැඳින්වෙන්නේ පුද්ගලික සබඳතා මත පදනම් වූ සහ යැපෙන්නෙකු සමඟ සෘජුව සම්බන්ධ වී සිදුකරන වැඩකටයුතුය - උදාහරණයක් ලෙස දරුවෙකුට ආහාර කැවීම, දරුවන්ගේ පාසල් වැඩ සඳහා කාලය ගත කිරීම හෝ අසනීප හෝ වැඩිහිටි පුද්ගලයෙකු රැකබලා ගැනීම දැක්විය හැකිය (Addati et al., 2018).

සමස්තයක් ලෙස ගත් කලල ප්‍රතිචාර දැක්වූවන් තම කාලයෙන් වැඩිම කොටසක් වැය කරන්නේ ළමා රැකවරණය සඳහා ය. කොළඹ සහ මොණරාගල යන දිස්ත්‍රික්ක දෙකෙහිම ස්ත්‍රීන්ගෙන් අඩකට වඩා වැඩි පිරිසක් සාමාන්‍ය දිනයකදී පැය 3 සිට 5 දක්වා කාලයක් තම දරුවන් සමඟ සෘජුව කටයුතු කරන බව වාර්තා කර ඇත. වඩාත් කැපී පෙනෙන කරුණක් වන්නේ කොළඹ දිස්ත්‍රික්කයේ ළමා සුරැකුම් කටයුතු කරන ස්ත්‍රීන්ගෙන් 50% ක් (පුද්ගලයන් 14 දෙනෙක්) එම කාර්යය සඳහා පැය 7 කට වඩා වැඩි කාලයක් වැය කිරීමයි. පෙර නිරීක්ෂණයක් නැවත මතක් කරන්නේ නම් ගම්පහ සහ මොණරාගල සාම්පලවලට වඩා කොළඹ දිස්ත්‍රික් සාම්පලය තුළ ආබාධිත දරුවන් රැකබලා ගන්නා ස්ත්‍රීන් වැඩි වශයෙන් සිටිය (රූප සටහන 1 බලන්න). ආබාධිත දරුවන් රැකබලා ගැනීම සඳහා

වගුව 4

**සාමාන්‍ය දිනයකදී ස්ත්‍රියක් සුරැකුම් වැඩ සඳහා වැය කරන කාලය**

| | ඔව් (%) | නැත (%) | පැය 0-1 (%) | පැය 1-3 (%) | පැය 3-5 (%) | පැය 5-7 (%) | පැය 7+ (%) |
|---|---|---|---|---|---|---|---|
| **නිවසේ ආහාර පිසීම** | 98.3 | 1.7 | 37.3 | 62.7 | 0.0 | 0.0 | 0.0 |
| **පිරිසිදු කිරීම සහ නිවස නඩත්තු කිරීම** | 93.3 | 6.7 | 37.5 | 46.4 | 12.5 | 3.6 | 0.0 |
| **දරුවන් රැකබලා ගැනීම** | 76.7 | 23.3 | 13.0 | 37.0 | 10.9 | 10.9 | 28.3 |
| **වැඩිහිටි හෝ අසනීප තැනැත්තන් රැකබලා ගැනීම** | 31.7 | 68.3 | 47.4 | 21.1 | 10.5 | 21.1 | 0.0 |
| **ජලය රැස්කර ගැනීම (අදාළ වන්නේ නම්)** | 25.0 | 75.0 | 46.7 | 53.3 | 0.0 | 0.0 | 0.0 |
| **දර එකතු කිරීම (අදාළ වන්නේ නම්)** | 53.3 | 46.7 | 46.9 | 40.6 | 12.5 | 0.0 | 0.0 |
| **ගොවිතැන හෝ ගෙවතු වගාව (අදාළ වන්නේ නම්)** | 30.0 | 70.0 | 44.4 | 27.8 | 5.6 | 11.1 | 11.1 |
| **ආදායම් උත්පාදන කටයුතු (අදාළ වන්නේ නම්)** | 43.3 | 56.7 | 8.7 | 13.0 | 26.1 | 34.8 | 17.4 |
| **නිදාගැනීම** | 100.0 | | 3.3 | 11.7 | 21.7 | 45.0 | 18.3 |
| **විවේකය, රූපවාහිනිය නැරඹීම, කියවීම,සමාජයීය කටයුතු ආදිය** | 53.3 | 46.7 | 34.4 | 53.1 | 6.3 | 3.1 | 3.1 |

අඛණ්ඩ අධීක්ෂණය සහ අවධානය මෙන්ම චිත්තවේගීය කැපවීම සහ අවශ්‍ය අවස්ථාවලදී වෛද්‍ය ආධාර ද සැපයිය යුතුය. මේ හේතුවෙන් ස්ත්‍රීන්ගේ "කාල  දරිද්‍රතාවය" සැලකිය යුතු ලෙස ඉහළ යන අතර වැටුප් සහිත රැකියාවක නිරත වීමට හෝ සාමාජීය ජීවිතයට සම්බන්ධ වීමට ඇති හැකියාව සීමා වේ.

අනෙක් අතට කලින් සඳහන් කළ පරිදි වැඩිහිටි හෝ අසනීප පුද්ගලයන් රැකබලා ගන්නා වැඩිම පිරිසක් වාර්තා වූයේ ගම්පහ දිස්ත්‍රික්කයෙන් ය. මෙම වගකීම දරන ස්ත්‍රීන් අතරින් (පුද්ගලයන් 9 දෙනෙක්) 44.4% ක් දිනකට පැය 5 සිට 7 දක්වා කාලයක් ද 11.1% ක් පැය 3 සිට 5 දක්වා කාලයක් ද වැඩිහිටි/අසනීප සුරැකුම් ය සඳහා වැය කරති. දත්ත රැස්කිරීමේ කාලසීමාවේදී නිරීක්ෂණය වූ පරිදි මෙම ව්‍යාප්තිය මගින් පෙනී යන්නේ විස්තෘත පවුල් එකට ජීවත්වීම මත පදනම් වූ අධික සුරැකුම් සේවා බරක් පවතින බවයි. ගම්පහ දිස්ත්‍රික්කයේ වැඩිහිටි සුරැකුම් යේ ඇති තීව්‍රතාවය වඩාත් වැදගත් වන්නේ පෙර සොයාගැනීම් සමඟ සසඳන විටය: එහි සිටින බොහෝ ස්ත්‍රීන් තම සමීපතම පවුලේ සාමාජිකයන් නොවන අයගේ සුරැකුම්  සඳහා ද වගකීම දරති.

මොණරාගල  දිස්ත්‍රික්කයේ වැඩිහිටි හෝ අසනීප තැනැත්තන් රැකබලා ගන්නා මුළු ප්‍රතිචාරකයින් සංඛ්‍යාව අඩු වුවද (පුද්ගලයන් 4 කි) ඔවුන්ගෙන් 75% ක් දිනකට අවම වශයෙන් පැය එකක්වත් එම කාර්යයන් සඳහා වැය කරති. එම දිස්ත්‍රික්කයේ පවතින ග්‍රාමීය ස්වභාවය සහ භූගෝලීය වශයෙන් ජනතාව විසිරී පවතින ආකාරය අනුව මෙය සුවිශේෂී තත්ත්වයකි. මන්දයත් එවැනි පරිසරයක සෞඛ්‍ය සේවාල පොදු ප්‍රවාහනය සහ ප්‍රජා සබඳතා ජාලයන් වෙත ඇති ප්‍රවේශය බොහෝ විට සීමිත බැවිනි. මීට අමතරව කොළඹ දිස්ත්‍රික්කයේ වැඩිහිටි සුරැකුම්හි නියැලෙන ප්‍රතිචාරකයින්ගෙන් 66.7% ක් (මුළු 6 දෙනෙක්) දිනකට එම කාලයම ඒ වෙනුවෙන් වැය කරති.

## 1.2 වක්‍ර සුරැකුම් සඳහා ගත කරන කාලය

වක්‍ර සුරැකුම් ක්‍රියාකාරකම් යනු මුහුණට මුහුණ හමුවී සිදුකරන සබඳතාමය සුරැකුම්  නොවන කාර්යයන් වේ. මෙයට පිරිසිදු කිරීමල ඉවුම් පිහුම්ල ගෙවතු වගාව සහ පුද්ගලික සුරැකුම් සැපයීම සඳහා පූර්ව අවශ්‍යතා සපුරාලන වෙනත් ගෘහ පාලන කටයුතු ඇතුළත් වේ (Addati et al., 2018).

### ඉවුම් පිහුම්

සමස්තයක් ලෙස ගත් කලල දිස්ත්‍රික්ක තුනේම ප්‍රතිචාර දැක්වූවන්ගෙන් අඩකට වඩා වැඩි පිරිසක් දිනකට නිවසේ ඉවුම් පිහුම් කටයුතු සඳහා පැය 1-3ත් අතර කාලයක් ගත කරති. ඉලක්කගත කණ්ඩායම් සාකච්ඡා වලදී හෙළි වූයේ ඇතැම් ස්ත්‍රීන් සඳහා දවසේ මුලින්ම ආරම්භ කරන කාර්යය ඉවුම් පිහුම් බවත් එය බොහෝ විට හිරු උදාවීමට පෙර සිදුවන බවත්ය. ආබාධිත හෝ විවිධ රෝගාබාධ සහිත යැපෙන්නන් රැකබලා ගන්නා ස්ත්‍රීන් සමබර ආහාර වේලක් සඳහා අවශ්‍ය සෞඛ්‍ය සම්පන්න ද්‍රව්‍ය සපයා ගැනීමට සහ විශේෂිත ආහාර පිළියෙළ කිරීමට වැඩි කාලයක් වැය කරති.

### පිරිසිදු කිරීම

දිස්ත්‍රික්ක තුනේම ප්‍රතිචාර දැක්වූවන්ගෙන් බහුතරයක් පිරිසිදු කිරීම සහ නිවස නඩත්තු කිරීම සඳහා ද පැය 1-3 ත් අතර කාලයක් ගත කරති. මෙම කාර්යයන් බොහෝ විට වෙනත් කාර්යයන් සමඟ සමගාමීව සිදු වේ. උදාහරණයක් ලෙස; ඉවුම් පිහුම් සහ පිරිසිදු කිරීම හෝ ඉවුම් පිහුම් සහ ළමා සුරැකුම් කටයුතු ආදිය යි. මේවා බොහෝ විට ඇතුළත් වන්නේ අතුගෑම,සේදීම, රෙදි සේදීම පිළිවෙළ කිරීම සහ ගෘහස්ථ සනීපාරක්ෂාව කළමනාකරණය කිරීම වැනි පුනරාවර්තන සහ දැඩි ශ්‍රමයක් අවශ්‍ය වන වැඩ කටයුතුය. බිළිඳුන් හෝ අසනීප-වයෝවෘද්ධ හෝ ආබාධිත යැපෙන්නන් රැකබලා ගැනීමේදී මෙම වගකීම්වල පරාසය සහ තීව්‍රතාවය තවදුරටත් පුළුල් වේ.

### ජලය එකතු කිරීම

ඉවුම් පිහුම් සහ පිරිසිදු කිරීම ස්ත්‍රීන් 60 දෙනාම ඉටු කරන විශ්වීය දෛනික වගකීම් වන අතර ජලය එකතු කිරීම, ගෙවතු වගාව සහ දර එකතු කිරීම යන වගකීම් සම්පත්වල පවතින සුලභතාවය හෝ හිඟකම මත රඳා පවතී. කොළඹ සහ ගම්පහ දිස්ත්‍රික්කවල ජලය රැස් කිරීම දෛනික අවශ්‍යතාවයක් වූ ප්‍රතිචාර දැක්වූවන් සිටියේ පිළිවෙලින් එක් අයෙකු සහ දෙදෙනෙකු පමණි. මෙහිදී එම තිදෙනාම තම වත්තේ ඇති පෞද්ගලික ළිඳකින් හෝ අසල්වැසි ප්‍රජා ළිඳකින් ජලය එකතු කිරීමේ කාර්යය සඳහා පැයකට වඩා අඩු කාලයක් වැය කර ඇත.

කෙසේ වෙතත් මොණරාගල දිස්ත්‍රික්කය දරුණු නියඟයට ගොදුරු වන ග්‍රාමීය සහ කෘෂිකාර්මික දිස්ත්‍රික්කයක් බැවින් නියැළියේ සිටින ස්ත්‍රීන් 12 දෙනෙකුට දිනපතා ජලය රැගෙන ඒමට සිදු වේ. මෙම 12 දෙනාගෙන් 41.7 %ක් ජලය රැස් කිරීමට පැයකට වඩා අඩු කාලයක් ගත කරන අතර, 58.3% ක් ඒ සඳහා පැය 1-3ත් අතර කාලයක් ගත කරති. සමීක්ෂණය පවත්වන විට හෙළි වූයේ මෙම ප්‍රතිචාර දැක්වූවන්ට බොහෝ විට සෑම දිනකම පෙ.ව. 7-9 සහ දහවල් 12-2 අතර ජලය

එකතු කිරීම සඳහා වෙන් කරන ලද කාලසටහන් ඇති විහාරස්ථානය වෙත යාමට සිදුවන බවයි. ප්‍රතිචාර දැක්වූවන් විහාරස්ථානයට ඇති සමීපත්වය මෙන්ම පොදු ප්‍රවාහනයේ පවතින පහසුකම් (සමීක්ෂණය කළ ප්‍රදේශයේ එය ඉතා හිඟ බව හෙළි විය) මත පදනම්ව මෙම ගමන කිලෝමීටර 2 සිට 5 දක්වා පරාසයක පවතී. මේ නිසා බොහෝ විට ස්ත්‍රීන්ට දිනපතා මෙම දුර පයින් යාමට සිදු වේ.

## දර එකතු කිරීම

මොණරාගල  දිස්ත්‍රික්කයේ දර එකතු කිරීමේ කාර්යය වඩාත් කාලය වැයවන කාර්යයක් බව තහවුරු විය. ඒ සඳහා දායක වූ ප්‍රතිචාර දැක්වූවන් 19 දෙනා අතරින්:

- 52.6%ක් පැය 1-3ත් අතර කාලයක් ගත කරති.
- 10.5%ක් පැය 3-5ත් අතර කාලයක් ගත කරති.
- 36.8%ක් පැයකට අඩු කාලයකින් එම කාර්යය නිම කරති.

මීට වෙනස්ව අනෙකුත් දිස්ත්‍රික්කවල මෙම බර සැලකිය යුතු ලෙස අඩුය: කොළඹ දිස්ත්‍රික්කයේ ප්‍රතිචාර දැක්වූවන් 20 දෙනාගෙන් 4 දෙනෙකු පමණක් ද ගම්පහ දිස්ත්‍රික්කයේ 9 දෙනෙකු පමණක් ද දර එකතු කරන අතර ඒ සඳහා සාමාන්‍යයෙන් පැය 3ක පමණ කාලයක් ගත වේ. දර එකතු කිරීම තරමක් බහුලව දක්නට ලැබෙන ගම්පහ දිස්ත්‍රික්කයේ පවා එම 9 දෙනාගෙන් පැය 3-5ක කාලයක් වැය කරන්නේ 22.2%ක් (පුද්ගලයන් දෙදෙනෙක්) පමණි.

මෙහිදී සැලකිය යුතු කරුණක් වන්නේ සියලුම ප්‍රතිචාර දැක්වූවන් දිනපතා දර එකතු නොකරන බවයි; සම්පත් සඳහා ප්‍රවේශය වැඩි ප්‍රදේශවල මෙම කාර්යය සතියකට වරක් සිදු කරනු ලබයි. මෙය විශේෂයෙන්ම කොළඹ දිස්ත්‍රික්කයේ දක්නට ලැබුණු අතර එහිදී අසල ඇති දේශීය වෙළඳසැල් වලින් දර මිටි මිලදී ගැනීමට ඇති හැකියාව ප්‍රතිචාර දැක්වූවන් පෙන්වා දුන්හ. තවද කොළඹ සහ ගම්පහ යන දිස්ත්‍රික්ක දෙකෙහිම ප්‍රතිචාර දැක්වූවන් පිරිසකට ගෑස් ලිප් සඳහා ප්‍රවේශය තිබුණි. ඒවා දෛනිකව භාවිතා නොකළද මෝසම් වැසි පවතින මාසවලදී මෙන් දර සොයා ගැනීමට අපහසු අවස්ථාවලදී ඒවා භාවිතා කරනු ලැබේ. කෙසේ වෙතත් මොණරාගල දිස්ත්‍රික්කයේ විකල්ප ලිප් භාවිතා කළේ ඉතා සීමිත නිවාස සංඛ්‍යාවක් වන අතර බහුතරයක් දර ලිප් භාවිතා කළහ. ජෛව ස්කන්ධ මත පදනම් වූ මෙම යැපීම හරහා නූතන බලශක්ති ප්‍රභවයන් සඳහා ඇති සීමිත ප්‍රවේශය මෙන්ම දේශගුණික විපර්යාස හමුවේ පවතින දැඩි අවදානමද නිරූපණය වේ.

## ගෙවතු වගාව සහ ගොවිතැන

සමස්ත ස්ත්‍රීන් 60 දෙනාගේ නියැදියෙන් ගෙවතු වගාව සහ යැපුම් කෘෂිකර්මාන්තයේ නියැලෙන්නේ 30%ක් (පුද්ගලයන් 18ක්) පමණි. මින් කොළඹ දිස්ත්‍රික්කයේ ප්‍රතිචාර දැක්වූවන් 20 දෙනාගෙන් ගෙවතු වගාවේ නියැලෙන්නේ දෙදෙනෙකු පමණක් වන අතර ඔවුන් ඒ සඳහා වැය කරන්නේ පැයකට අඩු කාලයකි. කොළොන්නාව වැනි ඉහළ නාගරීකරණයට ලක් වූ කලාපවල පවතින ජනාකීර්ණ ජනාවාස සීමිත ඉඩකඩ සහ හරිත අවකාශයන් නොමැතිකම මෙයට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත. මෙලෙස හරිත අවකාශයන් නොමැතිකම හේතුවෙන් ජලය පොළොවට උරා ගැනීම සහ ශාක මගින් වාෂ්පීකරණය වීම වැනි ක්‍රියාවලීන් සඳහා ඉඩක් නොලැබෙන අතර එමගින් කොළොන්නාව ප්‍රදේශයේ නිතර සිදුවන විනාශකාරී ගංවතුර තත්ත්වයන්හිදී මෙම ප්‍රජාවන් තවදුරටත් අසරණ භාවයට පත් වේ.

> අපිට කලින් වත්තක් තිබුණා-නමුත් වැල්ලම්පිටිය පාර සංවර්ධනය කිරීමට සහ පුළුල් කිරීමට ඒ ඉඩම පවරා ගත් අවස්ථාවේදී එය විනාශ වුණා
>
> කාන්තාවක් - වයස 50 - කොළඹ

තවද ගම්පහ දිස්ත්‍රික්කයේ ප්‍රතිචාර දැක්වූවන් 20 දෙනාගෙන් ගෙවතු වගාවේ නියැලෙන්නේ 5 දෙනෙකු පමණක් වන අතර ඔවුන් ද ඒ සඳහා දිනකට පැයකට වඩා අඩු කාලයක් වැය කරති. ඉඩම් සඳහා වැඩි ප්‍රවේශයක් තිබුණද "ඇතැම් ස්ත්‍රීන් ට පුද්ගලික ඉඩම් හිමිකම පවා තිබියදී" පවතින දත්ත අනුව පෙනී යන්නේ ගම්පහ දිස්ත්‍රික්කයේ වැඩිම ස්ත්‍රීන් පිරිසක් වැටුප් රහිත සුරැකුම් වැඩ සහ වැටුප් සහිත රැකියා යන දෙඅංශයේම නියැලෙන බැවින් ඔවුන්ට යැපුම් කෘෂිකර්මාන්තය හෝ ගෙවතු වගාව සඳහා ප්‍රමාණවත් කාලයක් ඉතිරි නොවන බවයි. තවද සමීක්ෂණයට ලක් වූ ප්‍රදේශය රඹුටන් වැනි වාරික පලතුරු සඳහා ප්‍රසිද්ධ බැවින් වාණිජ කෘෂිකර්මාන්තය දිනපතා සිදුකරන කාර්යයක් නොව වාරිකව (සෘතුමය වශයෙන්) සිදුකරන කාර්යයක් බව ද සඳහන් කළ යුතුය.

මොනරාගල දිස්ත්‍රික්කයේ ගොවිතැන සහ ගෙවතු වගාව මෙම ස්ත්‍රීන්ගේ ජීවනෝපායෙහි අනිවාර්ය අංගයකි. මෙම ක්‍රියාකාරකම්වල නියැලෙන ප්‍රතිචාර දැක්වූවන් 11 දෙනාගෙන් අඩකට ආසන්න පිරිසක් ඒ සඳහා පැය 1-3ක් වැය කරන අතර තුනෙන් එකකට වඩා වැඩි පිරිසක් පැය 5ක් හෝ ඊට වැඩි කාලයක් වැය කරති. එම 11 දෙනාගෙන් 18.2%ක් (2 දෙනෙකු) පැය 7කට වඩා වැඩි කාලයක් ඒ සඳහා වැය කරති. මෙහිදී ගෙවතු වගාව සහ ගොවිතැන ජීවත් වීමට මෙන්ම ආදායම් මාර්ගයක් ලෙස ද උපකාරී වන අතර එමගින් ස්ත්‍රීන් මත දෙගුණයක් බරක් පැටවෙනවා මෙන්ම දේශගුණික විපර්යාස හමුවේ ඔවුන් දැඩි අවදානමකට ද ලක්වේ.

> මම මගේ හැම විවේක කාලයක්ම වැය කරන්නේ වගාවන් බලාගන්නයි - සමහර වෙලාවට පළිබෝධකයින්ගෙන් වගාව බේරගන්න රෑ වෙනකල් වැඩ කරනවා[4]
>
> කාන්තාවක් - වයස 50 - මොණරාගල

### ආදායම් උත්පාදනය

සමීක්ෂණයට ලක් වූ ස්ත්‍රීන් 60 දෙනාගෙන් 23 දෙනෙකු (43.3%) ආදායම් උත්පාදන කටයුතුවල නියැලෙති. මොණරාගල සහ ගම්පහ දිස්ත්‍රික්කවලින් 8 දෙනා බැගින් ද කොළඹ දිස්ත්‍රික්කයෙන් 7 දෙනෙකු ද මෙයට ඇතුළත් වේ. මින්:

- ස්ත්‍රීන් 4 දෙනෙකු පැය හතකට වඩා වැඩි කාලයක් වැය කරති
- 7 දෙනෙකු පැය 5-7ත් අතර කාලයක් වැය කරති
- 5 දෙනෙකු පැය 3-5ත් අතර කාලයක් වැය කරති
- 5 දෙනෙකු දිනකට පැය 3ක් දක්වා කාලයක් වැය කරති

පොදු ආදායම් මාර්ග අතර සුබපැතුම් පත් සෑදීම, කෑම පාර්සල් පිළියෙළ කිරීම, නිවසේ පවත්වාගෙන යන කුඩා සිල්ලර කඩ, කෙටි ආහාර පිළියෙළ කර විකිණීම, මැහුම් කටයුතු, මැටි කර්මාන්තය සහ වාණිජ කෘෂිකර්මාන්තය ඇතුළත් වේ. ඔවුන් අතර වෙනත් නිවෙස්වල මෙහෙකාර සේවයේ යෙදෙන හෝ කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ කුලී වැඩ කරන දෛනික වැටුප් ලබන්නන් ද සිටිති. ප්‍රතිචාර දැක්වූවන්ගෙන් කුඩා පිරිසක් (6.7% - පුද්ගලයින් 4 දෙනෙකු) පෞද්ගලික අංශයේ රැකියාවල නියැලෙන අතර ඇඟලුම් ක්ෂේත්‍රයේ හෝ සිල්ලර වෙළඳසැල්වල සේවය කිරීම ඊට ඇතුළත් වේ.

සමස්ත නියැදියෙන් අඩකටත් වඩා අඩු පිරිසකට පමණක් ආදායම් උත්පාදන මාර්ග ඇති අතර වැටුප් සහිත නිවාඩු හෝ මාතෘ නිවාඩු වැනි ස්ථාවර ප්‍රතිලාභ සහිත පූර්ණ කාලීන රැකියාවල නියැලෙන්නේ ඉතාමත් සුළු පිරිසකි.

### විවේකය සහ විවේකීව ගත කරන කාලය

සමස්ත නියැදියෙන් අඩකට වඩා වැඩි පිරිසක් (53.3% ස්ත්‍රීන් 32ක්) පොත පත කියවීම, රූපවාහිනිය නැරඹීම හෝ ගුවන් විදුලියට සවන් දීම වැනි කිසියම් විනෝදාත්මක කටයුත්තක නියැලෙන බව තහවුරු කළද මෙම විනෝදාත්මක ක්‍රියාකාරකම් බොහොමයක් "සන්නිවේදන හෝ අධීක්ෂණ සුරැකුම්" රාමුව තුළ සිදු වන බව සැලකිය යුතුය. එනම් සුරැකුම් වැඩ කරන්නා සහ සුරැකුම් ලබන්නා සමඟ සෘජුව අන්තර්ක්‍රියා නොකළද සෘජු සුරැකුම් අවශ්‍යතාවයක් මතු වුවහොත් ඒ සඳහා සූදානමින් සිටින අතරතුර සිදු කරන වැටුප් සුරැකුම් වැඩකි (UN Women" 2025).

මේ අනුව බොහෝ විට විවේකය යනු සෘජු සහ වක්‍ර සුරැකුම් වැඩ කටයුතු සමඟ එකට බැඳී පවතින දෙයකි; උදාහරණයක් ලෙස රෙදි නවන අතරතුර රූපවාහිනිය නැරඹීම හෝ උයන අතරතුර ගුවන් විදුලියට සවන් දීම දැක්විය හැකිය.

[4] කොලොන්නාව- වැල්ලම්පිටිය - ඔරුගොඩවත්ත - අඹතලේ පාර

එක් ස්ත්‍රියක් ඇය පැය 5-7ක් රූපවාහිනිය නැරඹීමට "වැය කරන" බව සඳහන් කළාය. එය බැලූ බැල්මට සැලකිය යුතු කාලයකි. නමුත් පසුව ඇය පැහැදිලි කළේ බුද්ධිමය සහ කායික ආබාධ සහිත (අංශභාග තත්ත්වය ද ඇතුළුව) තම පුත්‍රයා වෙනුවෙන් රූපවාහිනිය ක්‍රියාත්මක කර තබන බවයි. ඇය සිය දෛනික සුරැකුම් වගකීම් ඉටු කරන අතරතුර ඔහු වෙනුවෙන් පසුබිමින් රූපවාහිනිය ක්‍රියාත්මක වන අතර ඇය ඉඳහිට රූපවාහිනී වැඩසටහන්වල කොටස් නරඹයි. එසේ වුවද ඇය මෙය සලකන්නේ විවේකීව ගත කරන කාලයක් ලෙසය. මෙයින් අවධාරණය වන්නේ ස්ත්‍රීන්ට තම කාලය පිළිබඳ ඇති ස්වාධිපත්‍යයෙහි අඩුව මෙන්ම අධීක්ෂණ සත්කාරක ස්වරූපයෙන් හෝ වෙනත් ආකාරයකින් එකවර කාර්යයන් කිහිපයක නිරත වීම ස්ත්‍රීන්ගේ දෛනික චර්යාවේ අනිවාර්ය අංගයක් වී ඇති ආකාරයයි.

දිස්ත්‍රික්ක තුන පුරාම ස්ත්‍රීන්ගේ නිදාගැනීමේ රටාවන් දෙස බැලීමේදී ඔවුන්ගේ වැටුප් රහිත සුරැකුම් වැඩ සහ ගෘහස්ථ වැඩ බර සමඟ සමීපව බැඳී පවතින ව්‍යාප්ත වූ සහ අසමාන වූ නිදි වැරීමේ ස්වභාවයක් හෙළි වේ. කොළඹ දිස්ත්‍රික්කයේ බහුතරයක් ස්ත්‍රීන් පැය 5-7ක නින්දක් ලබන අතර මොනරාගල දිස්ත්‍රික්කය වඩාත් පුළුල් සහ කනස්සල්ලට පත්වන සුළු දත්ත පරාසයක් පෙන්වයි: එහි ස්ත්‍රීන් හතරෙන් එකක් පැය 7කට වඩා නිදාගන්නා බව වාර්තා කරන අතර තවත් පිරිසක් දැඩි නිදි වැරීමකට ලක් වෙති. ඇතැම් ස්ත්‍රීන් යැපුම් ශ්‍රමය සහ ජලය හා දර එකතු කිරීම වැනි කාලය වැයවන සම්පත් ආශ්‍රිත ගෘහස්ථ කාර්යයන්හි අවශ්‍යතාවය නිසා දිනකට පැය 3ක් හෝ ඊට අඩු කාලයක් පමණක් නිදාගනිති.

අනෙක් අතට ගම්පහ දිස්ත්‍රික්කය මීට වඩා වෙනස් ආතති සහගත රටාවක් පෙන්නුම් කරයි. එහි නියැදියෙන් අඩක්ම පැය 5කට වඩා අඩුවෙන් නිදාගන්නා අතර එය දැඩි පවුල් වගකීම් මෙන්ම ආදායම් උත්පාදන කටයුතු නිසා ඇතිවන අඛණ්ඩ හා දෛනික නින්ද අහිමි වීමකි.

නිදසුනක් වශයෙන්, එක් ස්ත්‍රියක් උදේ 6 වන විට සේවයට වාර්තා කළ යුතු ඇඟළුම් කම්හල් සේවකයන් 85කට වැඩි පිරිසක් වෙනුවෙන් දිවා ආහාර පාර්සල් පිළියෙල කරයි. මෙයින් අදහස් කරන්නේ මෙම ස්ත්‍රිය ආහාර පාර්සල් සකස් කිරීම සඳහා සෑම දිනකම මධ්‍යම රාත්‍රී 12ට අවදි වන බවත් බොහෝ විට ඇයට දිනකට ලැබෙන්නේ පැය 3කට නොවැඩි නින්දක් බවත්ය. ඒ හා සමානව තම නිවස ඉදිරිපිට වෙළඳසැලක් පවත්වාගෙන යන තවත් කාන්තාවක් රැකියාවට යන මඟීන්ට උදෑසන ආහාර සැපයීම සඳහා කෙටි ආහාර සහ කොළ කැඳ පිළියෙල කිරීමට සෑම දිනකම අළුයම 2:30ට අවදි වෙයි.

සමස්තයක් ලෙස ගත් කල ඉහත දත්ත මගින් හෙළිදරව් වන්නේ ස්ත්‍රීන් තම පවුල සහ ප්‍රජාව වෙනුවෙන් දරනු ලබන වැඩ බරෙහි ස්වභාවය සහ එහි බරපතලකම හේතුවෙන් ඔවුන්ගේ විවේකය සහ නින්ද අඛණ්ඩව කැප කිරීමට සිදුවී ඇති ආකාරයයි.

## 1.3 දේශගුණික විපර්යාස පිළිබඳ අදහස්

පසුගිය වසර 2 ඇතුළත අත්විඳින ලද දේශගුණික විපර්යාසයන්ට අදාළ ආන්තික කාලගුණික තත්ත්වයන් පිළිබඳව විමසූ විට දිස්ත්‍රික්ක තුනේම ස්ත්‍රීන් විවිධ දේශගුණික බලපෑම් පිළිබඳව වාර්තා කළහ. එම අත්දැකීම්වලට නිරාවරණය වීම සහ ඒවායේ බරපතලකම අතර කැපී පෙනෙන වෙනස්කම් දක්නට ලැබිණි.

**වගුව 5**

**පසුගිය වසර 2 තුළ අත්විඳින ලද ආන්තික කාලගුණික සිදුවීම්**

| | ඔව් | නැත |
|---|---|---|
| **නියඟය** | 30.0 | 70.0 |
| **ගංවතුර** | 65.0 | 35.0 |
| **තාප තරංග/අධික උණුසුම** | 95.0 | 5.0 |
| **නායයෑම්/පාංශු ඛාදනය** | 1.7 | 98.3 |
| **දැඩි සුළං/කුණාටු** | 85.0 | 15.0 |
| **වගා පාළුවීම හෝ ආදායම් අහිමි වීම (කුඩා පරිමාණ වාණිජ කෘෂිකර්මාන්තය)** | 23.3 | 76.7 |
| **පිරිසිදු ජල හිඟය** | 40.0 | 60.0 |
| **නියැදිය** | 60 | |

වඩාත්ම පොදුවේ අත්විඳින ලද කාලගුණික සිදුවීම ලෙස උෂ්ණ තරංග සහ අධික රශ්මිය (අධික උණුසුම) ඉස්මතු වී ඇත. සමස්ත ප්‍රතිචාර දැක්වූවන්ගෙන් 95%ක් (60 දෙනෙකුගෙන් 57 දෙනෙක්) සහ සෑම දිස්ත්‍රික්කයකින්ම 95%ක් (වගුව 6 හි පෙන්වා ඇති පරිදි) මෙයට නිරාවරණය වී ඇති බව වාර්තා කර ඇත. මෙයින් පෙනී යන්නේ ශ්‍රී ලංකාව පුරා දිවයිනේ සෑම ප්‍රදේශයකටම බලපාන පරිදි උෂ්ණත්වය ඉහළ යාමේ පදනමක් නිර්මාණය වී ඇති බවයි (Alahakoon et al., 2022).

[5] ඉණෙන් පහළ පණ නැති වීම/අධර කාය පක්ෂාඝාතය

උණුසුමට අමතරව ගංවතුර තත්ත්වය ද ප්‍රධාන ගැටලුවක් ලෙස මතු වූ අතර, සමස්තයක් ලෙස ස්ත්‍රීන් ගෙන් 65% ක් (60 දෙනෙකුගෙන් 39 දෙනෙක්) එය වාර්තා කර ඇත. දිස්ත්‍රික් මට්ටමේ රටාවන් නිරීක්ෂණය කරන විට එහි පැහැදිලි වෙනස්කම් දක්නට ලැබේ (වගුව 6 බලන්න): මොණරාගල දිස්ත්‍රික්කයේ ගංවතුර අත්විඳ ඇත්තේ 5%ක් වුවද කොළඹ 90% ක් සහ ගම්පහ 100%ක් වශයෙන් පසුගිය වසර 2 තුළ ගංවතුර අත්විඳ ඇත. කොළඹ සහ ගම්පහ දත්ත මගින් නාගරික අපවහන පද්ධතිවල ගැටළු, ගංගා පිටාර ගැලීම, පෙර නොවූ විරූ සහ දීර්ඝ කාලීන මෝසම් වැසි කාලයන් මෙන්ම පහත් බිම් සහ පහසුකම් අවම ප්‍රදේශවලට අසමාන ලෙස බලපාන දේශීය අකල් තද වැසි තත්ත්වයන්ගේ මිශ්‍රණයක් පෙන්නුම් කරයි.

දැඩි සුළං සහ කුණාටු ද බහුලව අත්විඳ ඇති අතර මුළු නියැඳියෙන් 85%ක් ඒ පිළිබඳව වාර්තා කර ඇත. මින් මොණරාගල (100%) සහ ගම්පහ (95%) යන දිස්ත්‍රික්කවලට විශේෂයෙන් බලපෑම් එල්ල වී ඇති අතර එය කාලීන සුළං රටාවන් සහ කුණාටු හේතුවෙන් ග්‍රාමීය හා කෘෂිකාර්මික පරිසරයන්ට සිදුවන අවදානම සමඟ සමපාත වේ. සුළං ආශ්‍රිත උපද්‍රව අත්විඳීමේදී කොළඹ අඩු අගයක් (60%) ගත්තද දත්ත රැස් කරන කාලසීමාව තුළ සංචාරය කරන ලද බොහෝ නිවාසවල තද සුළඟින් සිදු වූ පළුදු වූ බිත්ති කැඩුණු ජනෙල් සහ හානි වූ වහලවල් ඇතුළු දෘශ්‍යමාන හානි දක්නට ලැබිණි.

පසුගිය වසර 2 තුළ නියඟය ඒකාකාරී ලෙස බලපා නොමැති බව මුළු නියැඳිය පෙන්වා දෙයි (30%). කෙසේ වෙතත් දිස්ත්‍රික් මට්ටමේ රටාවන් අනුව මොණරාගල ස්ත්‍රීන් ගෙන් 65%ක් (පුද්ගලයන් 13ක්) දීර්ඝ වියළි කාලගුණික තත්ත්වයන්ට මුහුණ දී ඇති බව වාර්තා කර ඇති අතර ඉන් අඩකට වඩා වැඩි පිරිසක් නියඟයේ වාර ගණන සමස්තයක් ලෙස වැඩි වී ඇති බව නිරීක්ෂණය කර ඇත. මෙම වියළි කාලගුණික තත්ත්වයන් ජල සුරක්ෂිතතාවයට සෘජුවම බලපාන අතර එය මොණරාගල දිස්ත්‍රික්කයෙන් වාර්තා වූ 65%ක පිරිසිදු ජල හිඟය මගින් පිළිබිඹු වේ - මෙය දිස්ත්‍රික්ක තුන අතර ඉහළම එකතුව වේ.

එමෙන්ම වගා පාළු වීම ද සමස්ත නියැඳියෙන් 23%ක් වාර්තා කර ඇති නමුත් දිස්ත්‍රික් මට්ටමින් එය ග්‍රාමීය ප්‍රදේශවල වැඩි වශයෙන් දක්නට ලැබේ: කොළඹ 5%ක් සහ ගම්පහ 10%ක් වන විට මොණරාගල එය 55%කි. මෙයින් මොණරාගල ස්ත්‍රීන්ට එල්ල වන දෙගුණයක පීඩනය ඉස්මතු වේ: එනම් නොමිලේ සපයන ශ්‍රමය හරහා පවුල් සහ දේශීය පරිසර පද්ධති නඩත්තු කිරීම මෙන්ම කුඩා පරිමාණ ගොවිතැන අඩාල වන විට ඇතිවන දේශගුණික හා ආර්ථික කම්පන දරා ගැනීමට සිදු වීමයි.


වගුව 6

**පසුගිය වසර 2 තුළ අත්විඳින ලද ආන්තික කාලගුණික සිදුවීම් (දිස්ත්‍රික්ක අනුව බිඳවැටීම)**

| | කොළඹ | මොණරාගල | ගම්පහ |
|---|---|---|---|
| **නියඟය** | 20.0% | 65.0% | 5.0% |
| **ගංවතුර** | 90.0% | 5.0% | 100.0% |
| **තාප තරංග/අධික උණුසුම** | 95.0% | 95.0% | 95.0% |
| **නායයෑම්/පාංශු ඛාදනය** | 0.0% | 5.0% | 0.0% |
| **දැඩි සුළං/කුණාටු** | 60.0% | 100.0% | 95.0% |
| **වගා පාළුවීම හෝ ආදායම් අහිමි වීම (කුඩා පරිමාණ වාණිජ කෘෂිකර්මාන්තය)** | 5.0% | 55.0% | 10.0% |
| **පිරිසිදු ජල හිඟය** | 15.0% | 65.0% | 40.0% |


**රූප සටහන 2**

**උෂ්ණත්ව රටාවන්හි සිදුවී ඇති වෙනස්කම් ප්‍රතිශතයක් ලෙස**





**රූප සටහන 4**

**වර්ෂාපතනයේ බරපතලකමෙහි සිදුවී ඇති වෙනස්කම් ප්‍රතිශතයක් ලෙස**





**රූප සටහන 3**

**වර්ෂාපතන කාලසීමාවේ සිදුවී ඇති වෙනස්කම් ප්‍රතිශතයක් ලෙස**





**රූප සටහන 5**

**සුළං රටාවන්හි සිදුවී ඇති වෙනස්කම් ප්‍රතිශතයක් ලෙස**




රූප සටහන 6

**ගංවතුර තත්ත්වයන්හි සිදුවී ඇති වෙනස්කම්**




රූප සටහන 7

**නියඟ සහ වියළි කාලගුණික තත්ත්වයන්හි සිදුවී ඇති වෙනස්කම් ප්‍රතිශතයක් ලෙස**




ප්‍රතිචාර දැක්වූවන් තුළ දේශගුණික විපර්යාස පිළිබඳ පවතින දැනුවත්භාවය මැන බැලීම සඳහා ප්‍රධාන සමීක්ෂණයට අවබෝධය සහ අදහස් විමසන කොටසක් ඇතුළත් කරන ලදී. දේශගුණික ආපදා හඳුනා ගැනීමට සහ ඒවා සාමාන්‍ය කාලීන කාලගුණික වෙනස්වීම්වලින් මෙන්ම 'ස්වාභාවික විපත්වලින්' වෙන්කර හඳුනා ගැනීමට ඔවුන් තුළ පවතින හැකියාව මෙහෙයවනු ලබන්නේ කිනම් ආකාරයේ මතවාදයන් මගින්ද යන්න තේරුම් ගැනීම මෙහිදී වැදගත් විය. මෙම දත්තල දිස්ත්‍රික්කය වයස සහ අධ්‍යාපන මට්ටම අනුව හරස් වගුගත කරන ලදී.

සමස්තයක් ලෙස ගත් කල ප්‍රතිචාර දැක්වූවන්ගෙන් බහුතරයක් වෙනස් වන කාලගුණ රටාවන් පිළිබඳව දැඩි අවධානයකින් පසුවන බව දක්නට ලැබිණි. ඔවුන්ගෙන් වැඩි පිරිසක් - විශේෂයෙන් කොළඹ සහ ගම්පහ දිස්ත්‍රික්කවල - වර්ෂාපතන කාලසීමාව - වර්ෂාපතනයේ බරපතලකම - සුළං රටාවන් සහ ගංවතුර තත්ත්වයන්ගේ සැලකිය යුතු වැඩි වීමක් නිරීක්ෂණය කර ඇත. මේ සියල්ල ඔවුන්ගේ දෛනික කටයුතුවලට සහ පවුල් රැකවරණ වගකීම්වලට සෘජුවම බලපාන අතර එමගින් මෙම ස්ත්‍රීන් දිනෙන් දින තීව්‍ර වන දේශගුණික විපර්යාසවල බලපෑම හමුවේ තවදුරටත් අවදානමට ලක් වේ.

> ගංවතුර වැඩි වෙලා තියෙනවා-ගිය අවුරුද්දෙ තුන් පාරක් ගංවතුර ආවා - ඒ හැම පාරකම අපිට ගේ දාලා යන්න වුණා
>
> කාන්තාවක් -වයස 49 - කොළඹ දිස්ත්‍රික්කය

කොළඹ සහ ගම්පහ දිස්ත්‍රික්කවල පවතින දේශගුණික බාධාවන් සමඟ සැසඳීමේදී මොණරාගල දිස්ත්‍රික්කය සැබවින්ම ඊට වඩා වෙනස් ස්වභාවයක් ගනී. වියළි කලාපයේ පිහිටි ග්‍රාමීය කෘෂිකාර්මික දිස්ත්‍රික්කයක් වීම මෙයට එක් හේතුවකි. මොණරාගල වර්ෂාපතන රටාවන් පිළිබඳ නිරීක්ෂණ කොළඹ සහ ගම්පහ දිස්ත්‍රික්කවලට වඩා හාත්පසින්ම වෙනස් චිත්‍රයක් මතු කරයි. කොළඹ සහ ගම්පහ ප්‍රතිචාර දැක්වූවන් වර්ෂාපතන කාලසීමාව වැඩි වීම පිළිබඳව අවධාරණය කරන අතරතුර මොණරාගල දිස්ත්‍රික්කයේ ප්‍රතිචාර දැක්වූවන්ගෙන් අඩකට වඩා වැඩි පිරිසක් වර්ෂාපතන කාලසීමාව අඩු වී ඇති බව හඳුනාගෙන ඇත. මුළු දිස්ත්‍රික් නියැදියෙන් 'යම් මට්ටමකට වර්ෂාපතන කාලසීමාව වැඩි වී ඇති' බව ප්‍රකාශ කර ඇත්තේ 30%ක් පමණි.

එලෙසම මොණරාගල ප්‍රතිචාර දැක්වූවන්ගෙන් 40%ක් වාර්තා කළේ වර්ෂාපතනයේ බරපතලකම යම් ප්‍රමාණයකට අඩු වී ඇති බවයි. මෙයින් වර්ෂාපතනය අඩුවීම මෙන්ම වර්ෂාපතන රටාවන්හි වෙනස් වීමක් පෙන්නුම් කරන අතර එමගින් දිස්ත්‍රික්කය තුළ සහ ඒ අවට වර්ධනය වන ජල හිඟය මෙන්ම ආර්ථික අස්ථාවරත්වය ද ඉස්මතු කරයි.

මීට අමතරව දීර්ඝ වියළි කාලගුණික තත්ත්වයන් සහ නියඟයන් වැඩිපුරම අත්විඳ ඇත්තේ මොණරාගල දිස්ත්‍රික්කයෙනි. එහි ප්‍රතිචාර දැක්වූවන්ගෙන් අඩකට වඩා වැඩි පිරිසක් වියළි කාල පරිච්ඡේදවල බරපතලකම වැඩි වී ඇති බව වාර්තා කර ඇත (වගුව 8 බලන්න). මෙහිදී අවධාරණය කළ යුතු කරුණක් වන්නේ වියළි කාලගුණික තත්ත්වයන් සහ නියඟ පිළිබඳව විමසූ විට මුළු දිස්ත්‍රික් නියැදියෙන් 20%ක් මෙන්ම කොළඹ සහ ගම්පහ යන දිස්ත්‍රික්ක දෙකෙන්ම 55% බැගින් 'නොදනී' යනුවෙන් ප්‍රතිචාර දක්වා තිබීමයි. මෙය නියඟයක ප්‍රධාන දර්ශක පිළිබඳ දැනුවත්භාවයේ අඩුවක් නිසා සිදු වූවක් යැයි උපකල්පනය කළ හැකි වුවද නියඟයක බලපෑම සහ එහි කාලසීමාව මැන බැලීම පිළිබඳව පවතින ව්‍යාකූලත්වය මෙයට හේතුව බව සාධාරණව නිගමනය කළ හැකිය. මන්දයත් ගංවතුරක්, කුණාටුවක් හෝ සුළි කුණාටුවක් මෙන් ක්ෂණිකව සිදු නොවී නියඟයක් ඉතා සෙමින් වර්ධනය වන අතර එහි ප්‍රතිවිපාක ද දෘශ්‍යමාන වන්නේ ක්‍රමිකව බැවිනි.

වගුව 7

**වර්ෂාපතන කාලසීමාව පිළිබඳ නිරීක්ෂිත වෙනස්කම්**

| | කොළඹ | මොණරාගල | ගම්පහ |
|---|---|---|---|
| **විශාල වශයෙන් වැඩි වී ඇත** | 70.0% | 0.0% | 70.0% |
| **යම් මට්ටමකට වැඩි වී ඇත** | 25.0% | 30.0% | 15.0% |
| **යම් මට්ටමකට අඩු වී ඇත** | 0.0% | 60.0% | 10.0% |
| **විශාල වශයෙන් අඩු වී ඇත** | 5.0% | 10.0% | 0.0% |
| **නිශ්චිතවම කිව නොහැක** | 0.0% | 0.0% | 5.0% |
| **නියැඳිය** | 20 | 20 | 20 |

කෙසේ වෙතත් නියඟයක් හෝ මෑතකාලීන දීර්ඝ වියළි කාලගුණික තත්ත්වයක් නිසි ලෙස හඳුනා ගැනීම එහි බලපෑම් අවම කර ගැනීමට හෝ ඒ සඳහා සූදානම් වීමට ඇතැම් ස්ත්‍රීන් කරන වැඩකටයුතුවලට බලපා නොමැති වීම විශේෂත්වයකි. නිදසුනක් වශයෙන් දීර්ඝ කාලීන ජල හිඟය හඳුනාගෙන තිබුණද වගා රටාවන් හෝ ගෙවතු වගා ක්‍රම වෙනස් කිරීම ජල ගබඩා කිරීමේ ධාරිතාව වැඩි කිරීම හෝ පවුලේ ශ්‍රමය කලින්ම ප්‍රතිසංවිධානය කිරීම වැනි පූර්ව සූදානම් වීමේ පියවර ගත් බවක් ස්ත්‍රීන් වාර්තා කර නැත; ඒ වෙනුවට ඔවුන්ගේ වැඩකටයුතු දැඩි ලෙස තීව්‍ර වී ඇත්තේ ජල හිඟය මඟහරවා ගත නොහැකි මට්ටමට පත් වූ පසු ඒ සඳහා ප්‍රතිචාර දැක්වීමක් වශයෙනි.

වගුව 8

**නියඟ සහ වියළි කාලගුණික තත්ත්වයන් පිළිබඳ නිරීක්ෂිත වෙනස්කම්**

| | කොළඹ | මොණරාගල | ගම්පහ |
|---|---|---|---|
| **විශාල වශයෙන් වැඩි වී ඇත** | 10.0% | 30.0% | 0.0% |
| **යම් මට්ටමකට වැඩි වී ඇත** | 10.0% | 25.0% | 5.0% |
| **යම් මට්ටමකට අඩු වී ඇත** | 5.0% | 5.0% | 0.0% |
| **විශාල වශයෙන් අඩු වී ඇත** | 0.0% | 10.0% | 0.0% |
| **වෙනසක් නැත** | 20.0% | 10.0% | 40.0% |
| **නිශ්චිතවම කිව නොහැක** | 55.0% | 20.0% | 55.0% |
| **නියැඳිය** | 20 | 20 | 20 |

## වයස අනුව හරස් වගුගත කිරීම

ප්‍රතිචාර දැක්වූවන් අතර දේශගුණික විපර්යාස සහ ආන්තික කාලගුණික සිදුවීම් පිළිබඳ දැනුවත්භාවයේ මට්ටමට වයස බලපාන සාධකයක් ද යන්න හඳුනා ගැනීම සඳහා මෙම දත්ත වයස අනුව අනුබණ්ඩනය කරන ලදී. ඒ අනුව ලැබුණු ප්‍රතිචාර පහත පරිදි වේ. (මෙහිදී 'විශාල වශයෙන් වැඩි වී ඇත' සහ 'යම් මට්ටමකට වැඩි වී ඇත' යන ප්‍රතිචාර දෙකම එකට එකතු කර ඇති බව සලකන්න):

වගුව 9

**දේශගුණික ආපදා පිළිබඳ නිරීක්ෂිත අවබෝධය (වයස අනුව අනුබණ්ඩනය කිරීම)**

| කාලගුණික සිදුවීම | අවබෝධ කරගත් වෙනස්කම් | 18-29 | 30-39 | 40-49 | 50-59 | 60+ | |
|---|---|---|---|---|---|---|---|
| උෂ්ණත්වය | **ඉහළ ගොස් ඇත** | 100.0% | 92.9% | 100.0% | 100.0% | 100.0% | 59 |
| වර්ෂාපතනය කාලවේලාවන් | **ඉහළ ගොස් ඇත** | 0.0% | 35.7% | 65.0% | 81.8% | 100.0% | 37 |
| වර්ෂාපතනය කාලසීමාව | **ඉහළ ගොස් ඇත** | 0.0% | 57.1% | 75.0% | 81.8% | 100.0% | 42 |
| වර්ෂාපතනයේ උග්‍රතාවය | **ඉහළ ගොස් ඇත** | 20.0% | 64.3% | 85.0% | 81.8% | 80.0% | 44 |
| දැඩි සුළං | **ඉහළ ගොස් ඇත** | 80.0% | 64.3% | 95.0% | 81.8% | 80.0% | 49 |
| ගංවතුර | **ඉහළ ගොස් ඇත** | 0.0% | 42.9% | 65.0% | 81.8% | 80.0% | 36 |
| නියඟයන් | **ඉහළ ගොස් ඇත** | 60.0% | 35.7% | 20.0% | 18.2% | 20.0% | 16 |

සමස්තයක් වශයෙන් දත්ත පෙන්වා දෙන්නේ වයස අවුරුදු 18-29 අතර පසුවන ප්‍රතිචාර දැක්වූවන් වයස අවුරුදු 40 - 60+ කාණ්ඩයේ අයට වඩා කාලගුණික වෙනස්වීම් වල රටාවන්, විශේෂයෙන් වර්ෂාපතනය සහ ගංවතුර සම්බන්ධ රටාවන් හඳුනා ගැනීමට ඇති ඉඩකඩ අඩු බවයි. මෙම කාලගුණ රටාවන් හඳුනා ගැනීම වයස සමඟ වැඩි වන බව පෙනෙන අතර වයස අවුරුදු 60 ට වැඩි ප්‍රතිචාර දැක්වූවන් මෙම වෙනස්කම් වඩාත් පහසුවෙන් හඳුනා ගනී. කෙසේ වෙතත්, නියඟය සම්බන්ධයෙන් මෙහි වෙනසක් දක්නට ලැබේ; එහිදී වයස අවුරුදු 50-60+ කාණ්ඩයට වඩා 18-29 වයස් කාණ්ඩයේ පසුවන්නන් නියඟය සහ වියළි කාලගුණයේ තීව්‍රතාවය වඩාත් පහසුවෙන් හඳුනාගෙන ඇත.

මෙම සොයාගැනීම්වලින් ගම්‍ය වන්නේ දේශගුණික විපර්යාසයන් අවබෝධ කර ගන්නා සහ අර්ථකථනය කරන ආකාරය කෙරෙහි වයස බලපාන බවයි. මෙය කාලයත් සමඟ ලැබූ අත්දැකීම් සහ පාරිසරික සම්බන්ධතාවල ස්වභාවය අනුව හැඩගස්වා ඇත. වැඩිහිටි ප්‍රතිචාර දැක්වූවන් වර්ෂාපතන රටාවන්ගේ සහ ගංවතුරේ සිදුවන ක්‍රමික හෝ චක්‍රීය වෙනස්වීම් පිළිබඳව වඩාත් අවධානයෙන් සිටින බව පෙනේ. එය බොහෝ විට ඔවුන් සතු දීර්ඝ කාලීන අත්දැකීම් නිසා එවැනි වෙනස්කම් මැන බැලීමට ඇති හැකියාව මත රඳා පවතී. මීට වෙනස්ව තරුණ ප්‍රතිචාර දැක්වූවන් නියඟය සහ දිගු වියළි කාලගුණය කෙරෙහි වැඩි සංවේදීතාවක් දැක්වීම කෙරෙහි මෑත වසරවල ජල හිඟය සහ දැඩි උණුසුම පිළිබඳ වැඩි අවධානයක් යොමුවීම මෙන්ම සමකාලීන දේශගුණික කතිකාවන් කෙරෙහි ඔවුන් තුළ ඇති වැඩි නැඹුරුව හේතු විය හැකිය.

### අධ්‍යාපන මට්ටම අනුව අනුබණ්ඩනය

ප්‍රතිචාර දැක්වූවන්ගේ අධ්‍යාපන මට්ටම අනුව ඔවුන්ගේ සංකල්ප අනුබණ්ඩනය කිරීමේ මූලික අරමුණ වූයේ දැනුවත්භාවය සහ අධ්‍යාපන මට්ටම අතර සහසම්බන්ධතාවයක් පවතීද යන්න මැන බැලීමයි. ප්‍රතිචාර පහත පරිදි වේ (මෙහිදී විශාල වශයෙන් වැඩි වී ඇත සහ යම් ප්‍රමාණයකට වැඩි වී ඇත යන ප්‍රතිචාර එකට එකතු කර ඇති බව සලකන්න).

වගුව 10

**දේශගුණික ව්‍යසනයන් පිළිබඳ නිරීක්ෂිත සටහන (අධ්‍යාපන මට්ටම අනුව අනුබණ්ඩනය)**

| කාලගුණික සිදුවීම | අවබෝධ කරගත් භානිය | 5 වසර දක්වා | 8 වසර දක්වා | සාමාන්‍ය පෙළ (O/L) දක්වා | උසස් පෙළ (A/L) දක්වා | වෙනත්[6] | නියැදිය |
|---|---|---|---|---|---|---|---|
| උෂ්ණත්වය | **ඉහළ ගොස් ඇත** | 100.0% | 100.0% | 96.8% | 100.0% | 100.0% | 59 |
| වර්ෂාපතනයේ කාල වේලාවන් | **ඉහළ ගොස් ඇත** | 66.7% | 53.8% | 61.3% | 71.4% | 66.7% | 37 |
| වර්ෂාපතනයේ කාලසීමාව | **ඉහළ ගොස් ඇත** | 100.0% | 69.2% | 61.3% | 71.4% | 100.0% | 42 |
| වර්ෂාපතනයේ උග්‍රතාවය | **ඉහළ ගොස් ඇත** | 66.7% | 84.6% | 67.7% | 71.4% | 100.0% | 44 |
| දැඩි සුළං | **ඉහළ ගොස් ඇත** | 100.0% | 84.6% | 77.4% | 85.7% | 66.7% | 49 |
| ගංවතුර | **ඉහළ ගොස් ඇත** | 83.3% | 53.8% | 54.8% | 71.4% | 66.7% | 36 |
| නියඟයන් | **ඉහළ ගොස් ඇත** | 0.0% | 23.1% | 29.0% | 42.9% | 33.3% | 16 |

[6] මෙම පසුබිම තුළ වෙනත් යන්නෙන් මූලික වශයෙන් අදහස් වන්නේ විධිමත් අධ්‍යාපනයක් නොලැබූ ස්ත්‍රීන් හෝ 5 වසර - 8 වසර - සාමාන්‍ය පෙළ (O/L) හෝ උසස් පෙළ (A/L) යන මට්ටම්වලට අයත් නොවන වෙනත් ශ්‍රේණියක් හෝ මට්ටමක් දක්වා අධ්‍යාපනය ලැබූවන්යග

තවද දැනුවත්භාවය සහ අවබෝධය කෙරෙහි අධ්‍යාපනය නිසැකවම බලපාන සාධකයක් විය හැකි වුවද සාමාන්‍ය පෙළ හෝ උසස් පෙළට වඩා අඩු සුදුසුකම් සහිත ස්ත්‍රීන් ට විවිධ දේශගුණික ව්‍යසනයන් සහ රටාවන් පිළිබඳව විශේෂයෙන් වර්ෂාපතනය ආශ්‍රිත සිදුවීම් පිළිබඳව වැඩි සෘජු අත්දැකීම් තිබීමට ද හැකියාවක් ඇත. මීට අමතරව තොරතුරු ලබා ගැනීමේ හැකියාව දිස්ත්‍රික්ක අනුව වෙනස් විය හැකිය. උදාහරණයක් ලෙස නාගරික දිස්ත්‍රික්කවල වඩා හොඳ මාධ්‍ය සහ තොරතුරු ප්‍රවේශයක් පැවතිය හැකි අතර ග්‍රාමීය දිස්ත්‍රික්කවල අධ්‍යාපනයට වඩා සෘජු නිරාවරණය මගින් දැනුම තීරණය විය හැකිය.

කෙසේ වෙතත් සෘජු අත්දැකීම් මගින් අවබෝධය සහ දැනුවත්භාවය හැඩගස්වන අතරම ස්ත්‍රීන්ට වඩාත් හොඳ සහයෝගයක් ලබා දීම සඳහා දේශගුණික සාක්ෂරතාවය නඟා සිටුවීමේ වැඩසටහන් දේශීය හා ගෝලීය වශයෙන් දිරිමත් කරනු ලැබේ (Choden, 2024; Kwauk, 2019). මෙයින් අදහස් කරන්නේ තමන්ගේ පවතින වැඩකටයුතු, ජීවිත සහ ජීවනෝපායන් කෙරෙහි දේශගුණික බලපෑම් වඩා හොඳින් අපේක්ෂා කිරීමට සහ කළමනාකරණය කිරීමට ස්ත්‍රීන්ට හැකි වන බවයි. තවද දැනුවත්භාවය තුළින් ආත්මශක්තිය සහ ස්වාධීනත්වය ඇති කිරීමට දේශගුණික සාක්ෂරතාවය උත්ප්‍රේරකයක් ලෙස ක්‍රියා කිරීම, ඔරොත්තු දීමේ හැකියාව සහ අනුවර්තනය වීමේ සාධාරණ ප්‍රවේශයක් ලෙස පුළුල් ලෙස පිළිගැනේ (The Economist" 2025).



## කොටස

# සුරැකුම් වැඩ භාරයෙහි සිදුවන වෙනස්වීම්


2

**Colombo, Sri Lanka**
**Polluted sewage canal visible from a woman's window in Kolonnawa**

සමීක්ෂණයට ලක් වූ පිරිසෙන් 95% ක් (ස්ත්‍රීන් 57 ක්) ප්‍රකාශ කළේ අහිතකර දේශගුණික තත්ත්වයන් හමුවේ තම සුරැකුම් වැඩ වඩාත් දුෂ්කර සහ වැඩි කාලයක් වැය වන ඒවා බවට පත්වන බවයි. සෑම දිස්ත්‍රික්කයකින්ම එක් ප්‍රතිචාර දක්වන්නියක් පමණක් එහි කැපී පෙනෙන වෙනසක් සිදු නොවන බව සඳහන් කළා ය. මෙම පොදු පිළිගැනීම මගින් දේශගුණික කම්පනයන් විසින් වැටුප් රහිත සුරැකුම් වැඩ බර සෘජුවම වැඩිකරන ප්‍රමාණය අවධාරණය කරයි. මෙම දුෂ්කරතා නිශ්චිත කාර්යයන් හරහා ප්‍රකාශ වන්නේ කෙසේද යන්න පිළිබඳ වැඩිදුර අවබෝධයක් 2 වන කොටස මගින් අනාවරණය වේ.

රූප සටහන 8


### දේශගුණික ව්‍යසනයකදී වඩාත් දුෂ්කර වන කාර්යයන් පිළිබඳ විශ්ලේෂණය[8]




සැබෑ දෛනික කාර්යයන් අනුව ගත් කල සෘජු සුරැකුම් වැඩ (ළමා සුරැකුම්, වැඩිහිටි සුරැකුම්, ආබාධිත පුද්ගලයින් රැකබලා ගැනීම) සහ වක්‍ර සුරැකුම් වැඩ (ඉවුම් පිහුම්,පිරිසිදු කිරීම,ජලය/දර එකතු කිරීම) අතර කැපී පෙනෙන වෙනසක් දක්නට නොලැබුණි. ඒ වෙනුවට කාර්යයන්හි පවතින දුෂ්කරතාවයේ ප්‍රමාණය තීරණය වන්නේ සම්පත් ලබා ගැනීමේ හැකියාව, කාලය හිඟකම මෙන්ම ව්‍යසනයේ පරිමාණය සහ ඒ හා බැඳුණු පාරිසරික බාධා කිරීම් මත බව අතිමහත් බහුතරයකගේ අදහස විය. දේශගුණික ව්‍යසනයන් විසින් සුරැකුම් වැඩ වර්ගීකරණයන් අතර පවතින සීමා මායිම් මෙන්ම එම කාර්යයන් ක්‍රමවත්ව පවත්වාගෙන යන දෛනික චර්යාවේ ස්ථාවරත්වය ද විශාල වශයෙන් බිඳ දමන ආකාරය මෙයින් අනාවරණය වේ. මෙහිදී සියලුම කාර්යයන් එකවර සංකීර්ණ වන අතර, ඒ නිසාම එම කාර්යයන් ඉටු කිරීම සඳහා වැටුප් රහිත සුරැකුම් වැඩවල නියුතු ස්ත්‍රීන් ගේ කාලය සහ ශ්‍රමය දැඩි ලෙස වැය කිරීමට සිදුවේ.

රූප සටහන 9

### දේශගුණික ව්‍යසනයකදී සම්පූර්ණ කිරීමට වඩාත් දුෂ්කර වන කාර්යයන් (දිස්ත්‍රික්ක අනුව අනුබණ්ඩනය)




[7] නියැදියේ ස්ත්‍රීන් 57 කි.

### පිරිසිදු කිරීම

ඉටු කිරීමට ඇති වඩාත් දුෂ්කර වගකීම ලෙස පිරිසිදු කිරීම මෙහිදී අවධාරණය කෙරිණි. මෙය විශේෂයෙන්ම කොළඹ සහ ගම්පහ නියැදි අතර බහුලව දක්නට ලැබුණු අතර එයට හේතුව පෙර නොවූ විරූ ලෙස නිතර සිදුවන සහ තීව්‍ර වන ගංවතුර තත්ත්වයන්ට එම ප්‍රදේශ ගොදුරු වීමය. මෙම දුෂ්කරතාවයට හේතු වන කරුණු ස්ත්‍රීන් විසින් මෙසේ අනාවරණය කරන ලදී:

- අපිරිසිදු ගංවතුර නිවාස තුළට ඇතුළු වීම හේතුවෙන් සනීපාරක්ෂාව පවත්වා ගැනීමට දැඩි වෙහෙසක් දැරීමට සිදුවීම් විශේෂයෙන්ම රෝගීන්, වැඩිහිටියන් සහ ආබාධිත පුද්ගලයින් සිටින නිවාසවල මෙය නිරන්තර සනීපාරක්ෂක බරක් නිර්මාණය කරයි.
- නිවසේ සිටින රෝගීන්, වැඩිහිටියන් හෝ ආබාධිත සාමාජිකයන් නිසා සනීපාරක්ෂක අවශ්‍යතා තවදුරටත් ඉහළ යාම.
- ගංවතුර පවතින කාලය තුළ පිරිසිදු කිරීමේ කටයුතු චක්‍රීයව සහ අඛණ්ඩව සිදු කිරීමට සිදු වීම. සාමාන්‍ය 'ව්‍යසනයක් නොමැති' දිනයකදී මෙන් දවසේ නිශ්චිත වේලාවක පමණක් නොව ගංවතුර පවතින විට පිරිසිදු කිරීම නැවත නැවතත් සිදු කළ යුතු කාර්යයක් බවට පත්වේ.

එබැවින් ගංවතුර බැස ගොස් බොහෝ කාලයක් ගත වන තුරුත් මෙම වගකීම නතර නොවන නිසා හෝ සාමාන්‍ය දෛනික චර්යාවකට අනුව සිදු කළ නොහැකි නිසා පිරිසිදු කිරීම වඩාත් කාලය වැය වන කාර්යය බවට පත් වේ.

### ඉවුම් පිහුම්

පවුලේ සාමාජිකයන් සඳහා ආහාර පිසීම ඊළඟට ඇති වඩාත් වෙහෙසකර සහ දුෂ්කර කාර්යය ලෙස පෙන්වා දී ඇත. අහිතකර කාලගුණික තත්ත්වයන් පවතින අවස්ථාවලදී අඩු ආදායම්ලාභී පවුල්වලට අවශ්‍ය සම්පත් සහ සැපයුම් හිඟ වීම හේතුවෙන් මෙය විශේෂයෙන්ම වැඩි කාලයක් වැය වන වගකීමක් ලෙස හඳුනාගෙන තිබේ. මෙයට පහත කරුණු ඇතුළත් වේ:

- දර සහ ගෑස් ලිප් වැනි ඉවුම් පිහුම් උපකරණ ලබා ගැනීමට ඇති අපහසුව.
- හානියට පත් මුළුතැන්ගෙවල් සහ/හෝ අනාරක්ෂිත ගෘහස්ථ අවකාශයන් (මීට උෂ්ණ අධික කාලවලදී සහ වියළි කාලගුණ තත්ත්වයන්හිදී ලිප අසල වැඩි වේලාවක් ගත කිරීමට සිදු වීම ද ඇතුළත් වේ).
- සෞඛ්‍ය සම්පන්න-පෝෂ්‍යදායී ආහාර සහ පිරිසිදු පානීය ජලය ලබා ගැනීමට ඇති බාධා.
- බෝග හානි හෝ වෙළඳපොලේ පවතින ආහාර හිඟය.
- ව්‍යසන අවස්ථාවලදී නිවසේ ආදායම අඩු වීම නිසා ආහාර මිලදී ගැනීමේ හැකියාව සීමා වීම.

අධික අයහපත් කාලගුණික තත්ත්වයන් පවතින විට සහල් සහ එළවළු වැනි මූලික ආහාර ද්‍රව්‍ය මිලදී ගැනීමට තම නිවෙස්වලින් පිටවීමට පවා නොහැකි වූ බව කොළඹ සමහර ස්ත්‍රීන් ප්‍රකාශ කළහ. මීට වෙනස්ව මොණරාගල සහ යම් ප්‍රමාණයකට ගම්පහ දිස්ත්‍රික්කවල කෘෂිකර්මාන්තයට එල්ල වන දේශගුණික බලපෑම් ප්‍රබල බැවින් නියඟය නිසා සිදුවන බෝග පාලු වීම් සහ ගංවතුර නිසා සිදුවන විනාශයන් අඩු ආදායම්ලාභී පවුල්වලට ආහාර ලබා ගැනීමට ඇති හැකියාව සෘජුවම අඩාල කරයි.

> සමහර වෙලාවට මම ගංවතුර කාලෙට මගේ දරුවෝ බලාගන්නවට වඩා වැඩි කාලයක් පිරිසිදු කිරීම්වලට වැය කරනවා. මොකද අපේ ගෙවල්වලට එන වතුර හරිම අපිරිසිදුයි. ඒ වගේම ගංවතුර කාලෙට කවුරු හරි අසනීප වුණොත් සායනයකට (Clinic) යන එකත් හරිම අමාරුයි කොහොමත් හැමෝම අසනීප වෙනවා, අපිරිසිදු වතුරේ ඇවිදලා අපේ කකුල්වල තුවාල හැදෙනවා.
>
> කාන්තාවක්- වයස 49 - කොළඹ දිස්ත්‍රික්කය

කොළඹ ප්‍රදේශයේ එක් ස්ත්‍රියක් විස්තර කළේ, පෙර වසරක ගංවතුරින් ඇයගේ මුළුතැන්ගෙය යට වූ පසු විශාල බැරලයක් උඩ ලී කැබලි ගල් සහ කඩදාසි එකතු කර තාවකාලික ලිපක් සාදා ආහාර පිළියෙළ කිරීමට සිදු වූ ආකාරයයි.

> නියඟ කාලෙට මම දවසට වේල් තුනම උයන්න උපරිම උත්සාහ කරනවා. නමුත් හැම වෙලාවෙම ඒක කරන්න බැහැ. බොහෝ වෙලාවට මම වේලක් නොකා ඉන්නවා. ඒත් මගේ දරුවන්ට පවා වේල් මඟ හරින්න සිදු වුණ අවස්ථා තිබුණා.
>
> කාන්තාවක් - වයස 51-මොණරාගල දිස්ත්‍රික්ක

**ළමා සුරැකුම් වැඩ සහ ආබාධිත පුද්ගලයින් රැකබලා ගැනීම**

අහිතකර කාලගුණික තත්ත්වයන් පවතින විට ඉටු කිරීමට ඇති මීළඟ දුෂ්කරම කාර්යයන් ලෙස ළමා සුරැකුම් වැඩ සහ ආබාධිත පුද්ගලයින් රැකබලා ගැනීම පෙන්වා දී ඇත. මෙම කාර්යයන් ආශ්‍රිතව පවතින දුෂ්කරතාවය සහ පීඩනය විවිධ ආකාරවලින් ප්‍රකාශ වන අතර, එය ස්ථර කිහිපයකින් යුත් බරක් පවතින බව පෙන්නුම් කරයි:

- ගංවතුර,නියඟය සහ අධික උණුසුම පවතින කාලවලදී පාසල් වසා දැමීම හේතුවෙන් දරුවන් නිවසටම සීමා වීම සහ ඔවුන් පිළිබඳව නිරන්තර අධීක්ෂණ රැකවරණයක් අවශ්‍ය වීම.
- ව්‍යසන කාලවලදී දරුවන් අසනීප වීම, උණ, ශ්වසන ගැටළු, ආමාශ ආන්ත්‍රික රෝග, උෂ්ණත්වය නිසා ඇති වන පලු යනාදිය සඳහා දැඩි අවධානයක් සහ සෘජු සත්කාරක සේවාවක් අවශ්‍ය වීම.
- ආරක්ෂාව පිළිබඳ ගැටලු, තුවාල වීම්, දියේ ගිලීම්, ලිස්සා යාම් වැනි ව්‍යසනය හා බැඳුණු අනතුරුවලින් දරුවන් ආරක්ෂා කර ගැනීමට සිදු වීම
- ආබාධිත දරුවන් රැකබලා ගැනීමේදී අනතුරු වැළැක්වීම, පවතින රෝගී තත්ත්වයන් උත්සන්න වීම වැළැක්වීම සහ නිරන්තර අධීක්ෂණය සඳහා වඩාත් වෙහෙසකර සහ වැඩි කාලයක් වැය වන සුරැකුම් අවශ්‍ය වීම.

එක් කාන්තාවක් ප්‍රකාශ කළේ ගංවතුර පවතින අවස්ථාවල පවා තම පුතාට පාසල් යාමට නොහැකි වුවද, ඔහුගේ අධ්‍යාපන කටයුතු අතපසු නොවීම සහතික කිරීම සඳහා ඔහු සමඟ වාඩි වී වැඩපොත් කරවීමට ඇය උත්සාහ කරන බවයි.

ව්‍යසන කාලවලදී සෘජු සුරැකුම්, විශේෂයෙන්ම දරුවන් සහ ආබාධිත දරුවන් සම්බන්ධයෙන් ඔවුන් අසනීප වීම හෝ තුවාල වීම වැළැක්වීම සඳහා නිරන්තර අධීක්ෂණයකින් යුක්ත විය යුතුය.

මෙහේ කොලොන්නාව රෑටත් රස්නයේ අඩුවක් වෙන්නේ නැහැ. දවස පුරාම එකම රස්නයක් තියෙන්නේ, විශේෂයෙන්ම උණුසුම් මාසවලදී මම නිතරම රෙදි කෑලි කිහිපයක් තෙත් කරලා දරුවෝ නිදාගන්න කොට ඔවුන් වටේට තියනවා. සමහර වෙලාවට හීට් ස්ට්‍රෝක් හැදෙන එක වළක්වන්න රෑට වරින් වර ඇහැරිලා ඔවුන්ගේ ඇඟවල් වතුරෙන් තවලා පිරිසිදු කරනවා.

කාන්තාවක් - වයස 49-කොළඹ

ගංවතුර වැනි හේතු නිසා පවුලට තම නිවෙස්වලින් ඉවත් වීමට සිදු වන අතිශය දුෂ්කර අවස්ථාවලදී එම ඉවත් කිරීමේ ක්‍රියාවලිය ආරක්ෂිත සහ සියලු දෙනා ඇතුළත් කරගන්නා එකක් බව සහතික කිරීමට ස්ත්‍රීන් ට අමතර කාලයක් වැය කිරීමට සිදු වේ. විශේෂ අවශ්‍යතා ඇති පුද්ගලයින් ඉවත් කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීමට සහ සහාය වීමටත් පසුව සහන මධ්‍යස්ථාන තුළ දරුවන්ගේ ආරක්ෂාව සහතික කිරීමටත් ඔවුන්ට සිදු වේ. එලෙසම සහන මධ්‍යස්ථාන තුළ ආබාධිත පුද්ගලයන් රැකබලා ගැනීමේදී මුහුණ දීමට සිදු වන අභියෝග පිළිබඳව දත්ත රැස් කිරීමේදී නිරන්තරයෙන් අසන්නට ලැබුණි. එහිදී සහන මධ්‍යස්ථානවල සහ ඉවත් කිරීමේ ක්‍රියාවලීන්හිදී ආබාධිත පුද්ගලයන්ට අවශ්‍ය ප්‍රවේශ පහසුකම් නොමැති බව ස්ත්‍රීන්  වාර්තා කළහ. තම දරුවන්ගේ විශේෂ අවශ්‍යතා, විශේෂයෙන්ම සනීපාරක්ෂාව සම්බන්ධ අවශ්‍යතා, සපුරා ගැනීම සඳහා පොදු ස්ථාන පිරිසිදු කිරීමට සහ විශේෂ විධිවිධාන සැකසීමට කාලය වැය කිරීමට සිදු වූ බව ඔවුහු විස්තර කළහ.

මෙයින් පෙන්නුම් කරන්නේ ව්‍යසන කළමනාකරණ ක්‍රියාවලීන්හි පවතින පහසුකම් ලබා ගැනීමේ අපහසුව පෞද්ගලිකත්වය රැක ගැනීමට ඇති බාධා සහ ප්‍රමාණවත් යටිතල පහසුකම් නොමැතිකමයි.

2016 ගංවතුර කාලේ අපිව ළඟ තියෙන පන්සලකට ගෙනිච්චාග නමුත් මගේ පුතාට ඩවුන් සින්ඩ්‍රෝම්ග ඒ නුහුරු පරිසරය සහ සෙනඟ ඉන්න එක දරාග න්න බැරි වුණාග ඒ නිසා මම ආපහු ගෙදර ඇවිත් වතුර බහිනකම් ඔහුව මේස දෙකක් උඩ තියලා බලාගත්තා

කාන්තාවක් - වයස 47 - කොළඹ දිස්ත්‍රික්කය


ඉහත උපුටා දැක්වීම ඩවුන් සින්ඩ්‍රෝම් සහිත පුතෙකු රැකබලා ගන්නා කාන්තාවකගේ සාක්ෂියකි මෙයින් අවධාරණය වන්නේ ආබාධිත දරුවන් රැකබලා ගන්නන් මුහුණ දෙන බහුවිධ අවදානම් සහගත තත්ත්වයයි. ව්‍යසන අවස්ථාවකදී අනාරක්ෂිත නිවසක් සහ ප්‍රවේශ පහසුකම් නොමැති සහන මධ්‍යස්ථාන අතරින් එකක් තෝරා ගැනීමට ඔවුන්ට බල කෙරී ඇත. දේශගුණික ව්‍යසනයකදී හදිසි ක්‍රියාවලීන් තුළ ආබාධිත පුද්ගලයන්ගේ පහසුකම් බොහෝ විට ව්‍යුහාත්මකව මඟහැරී යයි. මෙවැනි අවස්ථාවලදී ආබාධිත පුද්ගලයන් සඳහා වෙන් කළ ස්ථාන, සහන මධ්‍යස්ථාන තුළ රෝද පුටු සහ ආබාධිත වැසිකිළි වැනි වඩා හොඳ පහසුකම් මෙන්ම වඩාත් ආරක්ෂිත සහ සියලු දෙනා ඇතුළත් කරගන්නා ඉවත් කිරීමේ ක්‍රියාවලීන් ද මීට ඇතුළත් විය යුතුය.

## ආදායම් උත්පාදනය

දේශගුණික ව්‍යසනයන්, වඩාත්ම කැපී පෙනෙන ලෙස ගංවතුර සහ නියඟය ස්ත්‍රීන්ගේ ආදායම් උත්පාදන කටයුතුවලට සැලකිය යුතු ලෙස බාධා පමුණුවන බව මෙම අධ්‍යයනයෙන් ලැබුණු සාක්ෂි මගින් ගම්‍ය වේ. මෙම සමීක්ෂණ දත්තවලට අනුව ආදායම් උත්පාදන මාර්ග සහිත ස්ත්‍රීන්ගෙන් වැඩි ප්‍රතිශතයක් ස්වයං රැකියාවල නියුතු අය වෙති. ඔවුහු මූලික වශයෙන් කුඩා පරිමාණයේ ගෘහස්ත, කර්මාන්ත, සෘතුමය කෘෂිකාර්මික කටයුතු හෝ අවිධිමත් සේවා සැපයීම වැනි කටයුතුවල නිරත වෙති. මේ අනුව දේශගුණික ව්‍යසනයන් විසින් ස්ත්‍රීන්ගේ ආර්ථික සහභාගීත්වයට දෙවැදෑරුම් බාධාවක් ඇති කරයි.


රූප සටහන 10

**ආදායම් මාර්ග (ස්ත්‍රීන් 60 දෙනෙකු සඳහා දිස්ත්‍රික්ක අනුව කරන ලද වර්ගීකරණය)**



රූප සටහන 11

**ආදායම් මාර්ග (ස්ත්‍රීන් 60 දෙනෙකු ඇසුරින්)**




### 1. ජීවනෝපාය මාර්ගවලට එල්ල වන ක්ෂණික බාධා

ගංවතුර, නියඟය, තද සුළං සහ අකාලයේ ඇද හැලෙන වර්ෂාව වැනි තත්ත්වයන් උපකරණවලට හානි කිරීම, වෙළඳපොළට ඇති ප්‍රවේශය අහුරා දැමීම, සංචලනය සීමා කිරීම සහ වගාවන් විනාශ කිරීම මගින් ආදායම් උත්පාදන කටයුතුවලට සෘජුවම බාධා පමුණුවයි. නිවසේ සිට වැඩ කරන අය සඳහා විශේෂයෙන් ගංවතුර කාලවලදී නිවෙස් යටවීම සහ විදුලිය විසන්ධි වීම නිසා වැඩකටයුතු කරගෙන යාම කළ නොහැක්කක් බවට පත් වේ. කෘෂිකාර්මික සහ දෛනික කුලී වැඩවල නිරත වන්නන්හට දේශගුණික විපර්යාස නිසා වැඩ කරන දින අහිමි වීම හෝ සැලකිය යුතු ලෙස අඩු වීම සිදු වේ. මෙය ඔවුන්ගේ ආදායම සම්බන්ධයෙන් අවිනිශ්චිත සහ අනාරක්ෂිත තත්ත්වයක් නිර්මාණය කරයි.

### 2. වැඩි වන මූල්‍ය පීඩනය සහ ප්‍රතිසංස්කරණ කටයුතු පිළිබඳ බර

ව්‍යසනයකින් පසු යථා තත්ත්වයට පත්වීමේ ක්‍රියාවලිය අධික වියදම් සහිත මෙන්ම දැඩි ශ්‍රමයක් වැය වන්නකි. බොහෝ විට හානි වූ ගොඩනැගිලි අළුත්වැඩියා කිරීමට, කැඩී ගිය උපකරණ සහ අනෙකුත් අත්‍යවශ්‍ය දේපළ ප්‍රතිස්ථාපනය කිරීමට ව්‍යසනයේදී අහිමි වූ අත්‍යවශ්‍ය ද්‍රව්‍ය මිලදී ගැනීමට, මෙන්ම පවුලේ සාමාජිකයන්ගේ සෞඛ්‍යයට ඇති වූ බලපෑම් වැනි ව්‍යසනය නිසා සිදු වූ වෙනත් ඕනෑම හානියක් පියවා ගැනීමට පවුල්වලට සිදු වේ. රැකියාවට සහ ආදායම් මාර්ගවලට එල්ල වන බාධාවන් නිසා පවුල් ඒකක දැඩි අවදානම් සහගත විෂම චක්‍රයකට හසු වේ.

> මම වැඩ කරන්නේ මැටි කර්මාන්තයේ. ගංවතුර එන හැම වෙලාවකම අපේ මැටි සකපෝරු විනාශ වෙනවා. ඒවා ඇදලා ගන්නවත් වෙන තැනකට ගෙනියන්නවත් අපිට වෙලාවක් නැහැ. අනික ඒවා අපිට උස්සන්න බැරි තරම් බරයි. ඉතින් වතුර බැහැලා ගියාම  අපිට සිද්ධ වෙනවා මේ මැෂින් අලුතෙන්  ගන්න සල්ලි හොයාගන්න. මොකද ඒවා සාමාන්‍යයෙන් ආයෙත් හදන්න බැරි වෙන්නම කැඩෙනවා
>
> -කාන්තාවක්- වයස 46-ගම්පහ

මන්ද යත් මෙම වියදම් පියවා ගැනීම වළක්වාලිය නොහැකි හෝ කල් දැමිය නොහැකි ක්ෂණික හා අත්‍යවශ්‍ය අවශ්‍යතාවයක් වන බැවිනි. ස්ත්‍රීන් බොහෝ විට මෙම බර අසමාන ලෙස දරතිග ඔවුන් තම ජීවනෝපාය සහ ආයෝජන කටයුතු සඳහා වැය කළ කාලය, දෛනික සහ පශ්චාත් ව්‍යසන සුරැකුම් සේවාවලට අමතරව අළුත්වැඩියා කිරීම සහ නැවත ගොඩනැඟීම වැනි වැටුප් රහිත වැඩකටයුතු සඳහා යොමු කිරීමට සිදු වේ.

සමස්තයක් ලෙස ගත් කල මෙම ප්‍රතිවිපාක මාලාව දැනටමත් පවතින වෙනස් කළ නොහැකි සුරැකුම් වැඩ බර තවදුරටත් වැඩි කරන අතරම ආර්ථික අනාරක්ෂිතභාවය ද උග්‍ර කරයිග මෙලෙස ස්ත්‍රී පුරුෂ භාවය මත පදනම් වූ ශ්‍රම විභජනය සහ සහන ලබා ගැනීමේ හැකියාව තුළ පවතින අසමානතා තවදුරටත් පුළුල් වේ.

## දර එකතු කිරීම

දේශගුණික ව්‍යසනයන් පවතින කාලවලදී ඉටු කිරීමට ඇති වඩාත් දුෂ්කර කාර්යයක් ලෙස ආදායම් උත්පාදනයට සමානවම දර එකතු කිරීම ද හඳුනාගෙන ඇත. මෙය දේශගුණික කම්පන හමුවේ ස්ත්‍රීන්  මුහුණ දෙන අවදානම් සහගත තත්ත්වයේ තවත් පැතිකඩක් ආලෝකවත් කරයි. අධික උෂ්ණත්වය පවතින කාලවලදී වියළි කාලගුණ තත්ත්වයන්හිදී මෙන්ම ගංවතුර පවතින අවස්ථාවලදී ද මෙය විශේෂයෙන් දුෂ්කර බව හඳුනා ගන්නා ලදී. විශේෂයෙන්ම මොනරාගල දිස්ත්‍රික්කයේ ස්ත්‍රීන්  දර සෙවීම සඳහා පයින්ම දුර බැහැර යන අතර නියඟ කාලවලදී එළිමහනේ මෙසේ කාලය ගත කිරීමට සිදු වීම නිසා එම ස්ත්‍රීන් සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන් හීට් ස්ට්‍රෝක් සමේ රෝග සහ වියළි කලාපීය ජල හිඟය නිසා උත්සන්න වන වෙනත් සෞඛ්‍ය ගැටලුවලට ගොදුරු වීමේ දැඩි අවදානමකට ලක් වේ.

ඊට ප්‍රතිවිරුද්ධව මෝසම් වැසි සහ ගංවතුර පවතින මාසවලදී භාවිතයට ගත හැකි වියළි දර සොයා ගැනීමට නොහැකි වීම නිසා දර එකතු කිරීම අතිශය දුෂ්කර වේ. මෙහිදී බොහෝ විට ස්ත්‍රීන්  හදිසි අවස්ථාවන් සඳහා පමණක් වෙන් කර ඇති ගෑස් ලිප් භාවිතයට යොමු වන අතර එය අධික වියදම් සහිත බැවින් දැනටමත් බර වී ඇති ඔවුන්ගේ ආර්ථික බර තවදුරටත් වැඩි කිරීමට හේතු වේ. ජීව ස්කන්ධ (දර) මත මෙසේ යැපීමට සිදු වීමෙන් නවීන බලශක්ති ප්‍රභවයන් සඳහා ඇති සීමිත ප්‍රවේශය මෙන්ම දේශගුණික විපර්යාස හමුවේ පවතින දැඩි අවදානම ද පිළිබිඹු වේ.


එබැවින් සම්පත් සඳහා ඇති ප්‍රවේශය දේශගුණික ව්‍යසන පවතින කාලවලදී ඵලදායිතාව, කාලය භාවිතය සහ කාර්යක්ෂමතාව කෙරෙහි බලපායි. දර ලබා ගැනීමේ හැකියාව ද මෙයට ඇතුළත් වන අතර එය දිනෙන් දින බර වන සුරැකුම් වැඩ බරට බලපාන ප්‍රධාන සාධක 5 න් එකක් ලෙස හඳුනාගෙන ඇත. අක්‍රමවත් වර්ෂාපතනය සහ වනාන්තර විනාශය හේතුවෙන් භාවිතයට ගත හැකි දර සෙවීම සඳහා දැන් පෙරට වඩා වැඩි කාලයක් වැය කිරීමට සිදු වන බව මොනරාගල දිස්ත්‍රික්කයේ බහුතරයක් ස්ත්‍රීන් වාර්තා කර ඇත. වැටුප් රහිත සුරැකුම් වැඩ සහ ගෘහස්ථ ශ්‍රමය මෙසේ ඉහළ යාම නිසා ඔවුන්ගේ ආදායම් උත්පාදන කටයුතුවල නිරත වීමට ඇති හැකියාව හෝ පුහුණු සහ ජීවනෝපාය අවස්ථාවන්ට ප්‍රවේශ වීමට ඇති හැකියාව සෘජුවම සීමා වේ. මෙය අවසාන වශයෙන් අර්බුදකාරී අවස්ථාවන්හිදී ස්ත්‍රී පුරුෂ සමාජභාවීය අසමානතාවය සහ අවදානම තවදුරටත් ගැඹුරු කරයි.

ස්ත්‍රීන් විසින් පෙන්වා දෙන ලද සම්පත් ලබා ගැනීමේදී පවතින අනෙකුත් බාධාවන් අතරට මේවා ඇතුළත් වේ:

- පිරිසිදු පානීය ජලය ලබා ගැනීමට ඇති අපහසුව.
- විදුලිය සහ ආලෝකය ලබා ගැනීම.
- සනීපාරක්ෂක පහසුකම්.
- සංචලනය සහ ප්‍රවාහන පහසුකම්.
- හදිසි සැපයුම් සහ ව්‍යසනයෙන් පසු අවශ්‍ය අනෙකුත් ද්‍රව්‍ය මිලදී ගැනීමට අවශ්‍ය ආදායම.
- විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින් සඳහා විශේෂිත සත්කාරක පහසුකම් සපයන ස්ථාන.

රූප සටහන 12

**දේශගුණික ව්‍යසනයන් මගින් දෛනික සුරැකුම් වැඩ වලට බලපාන ආකාරය පිළිබඳව ස්ත්‍රීන් (57) දැක්වූ ප්‍රතිචාර**




තවද මෙම කාර්යයන් ඉටු කිරීම වඩාත් අපහසු වන්නේ කෙසේදැයි විමසූ විට ස්ත්‍රීන්ගෙන් සැලකිය යුතු පිරිසක් වාර්තා කළේ අහිතකර දේශගුණික තත්ත්වයකදී තමන්ට දැරීමට සිදුවන අතිරේක ශාරීරික වෙහෙස නිසා මෙම අපහසුව මූලික වශයෙන් ඇතිවන බවයි. නියඟ කාලවලදී වැඩි දුරක් පයින් ගොස් ජලය රැගෙන ඒමට සිදු වීම- වගාවන් වේලී යාමෙන් ආරක්ෂා කර ගැනීමට වැඩි කාලයක් වැය කිරීමට සිදු වීම, ගංවතුරෙන් පසු නිවසට එකතු වන මඩ සහ බොහෝ විට අපිරිසිදු වූ අපද්‍රව්‍ය පිරිසිදු කිරීම, සීමිත ඉන්ධන හෝ විදුලිය භාවිතයෙන් ආහාර පිසීම සහ සෞඛ්‍ය සේවා වැනි නිසි පරිදි ක්‍රියාත්මක නොවන හෝ සැමට සමානව ප්‍රවේශ විය නොහැකි සේවාවන්හි අඩුව පිරවීමට සිදු වීම වැනි කරුණු ප්‍රතිචාර දැක්වූවන් විසින් විස්තර කරන ලදී. මෙයට අමතරව ස්ත්‍රීන්ගෙන් 16% ක් ප්‍රකාශ කළේ දෛනික කාර්යයන් සම්පූර්ණ කිරීමට වෙනදාට වඩා වැඩි කාලයක් ගතවන බවය. ඉහත සඳහන් කළ පරිදි මෙලෙස ගෘහස්ථ දෛනික චර්යාවන් අඩාල වන අතර ඒ වෙනුවට ස්ත්‍රීන්ට බහුවිධ වගකීම් සමහර විට තනිවම සහ බොහෝ විට එකවර දැරීමට සිදු වේ.

දේශගුණික ව්‍යසනයන්හිදී සුරැකුම් වැඩ  බර තීව්‍ර වන ප්‍රධාන මාර්ග ලෙස සැලකෙන ශාරීරික ශ්‍රමය සහ වැඩිවන කාලය වැය වීමටත් එහා ගිය ව්‍යසනකාරී තත්ත්වයන් හමුවේ පවුලක් පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය වන චිත්තවේගීය සහ මනෝවිද්‍යාත්මක වෙහෙස සම්බන්ධයෙන් ද ස්ත්‍රීන් අසමාන ලෙස වගකීම් දරති. සුරැකුම් වැඩ කළමනාකරණය කිරීම අපහසු කරන මානසික සහ චිත්තවේගීය පීඩනය පිළිබඳව ලැබුණු ප්‍රතිචාර සංඛ්‍යාවෙන් මෙය තහවුරු වේ. අවිනිශ්චිත සහ අවදානම් සහගත තත්ත්වයන් යටතේ නිවසක් පවත්වාගෙන යාමේදී ඇතිවන මානසික සහ චිත්තවේගීය වෙහෙස සුරැකුම් වැඩ කළමනාකරණය කිරීමට අපහසු කරන ප්‍රධාන සාධකයක් බව ප්‍රතිචාර දැක්වූවන් කිහිප දෙනෙකුම හඳුනාගෙන ඇත. මෙයට දරුවන්, වැඩිහිටියන්, ආබාධිත පවුලේ සාමාජිකයන් සහ අසනීප හෝ තුවාල නිසා පීඩා විඳින සාමාජිකයන් පිළිබඳ නිරන්තර අවධානයෙන් සිටීම; ආහාර, ජලය සහ ඖෂධ හිඟයන් පිළිබඳව පූර්ව නිගමනයන්ට එළඹීම; නිවස තුළ ඇතිවන බිය, ආතතිය සහ ගැටුම් කළමනාකරණය කිරීම; මෙන්ම මූල්‍ය හා චිත්තවේගීය පිරිවැය ඇතුළත් පශ්චාත් ව්‍යසන ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියේ බර ද ඇතුළත් වේ. මේ අනුව දේශගුණික ව්‍යසනයන් විසින් එදිනෙදා ජීවිතය පවත්වාගෙන යාම මෙන්ම පැවැත්ම සඳහා අවශ්‍ය කොන්දේසි කළමනාකරණය කිරීම ද, ස්ත්‍රීන් සතු වගකීමක් ලෙස පවතින සමාජ අපේක්ෂාව තවදුරටත් දැඩි කරන අතර එමගින් ස්ත්‍රීන් තුළ ඉහළ ආතතියක් සහ කාංසාවක් ඇති කරයි.

මූලික වශයෙන් යටිතල පහසුකම්වලට සිදුවන හානිය සහ ආර්ථික අලාභය කෙරෙහි පමණක් අවධානය යොමු කරන ප්‍රධාන දේශගුණික ව්‍යසන කළමනාකරණ රාමු තුළ ඉහත සඳහන් කළ චිත්තවේගීය සහ මානසික වෙහෙස බොහෝ දුරට පිළිගැනීමට ලක් නොවේ. සහන සහ ආධාර ලබා දෙන අවස්ථාවලදී පවා මනෝ-සමාජීය රැකවරණය නොසලකා හරිනු ලබන අතර එමගින් ව්‍යසන ප්‍රතිචාර දැක්වීමේදී සහ යථා තත්ත්වයට පත් කිරීමේ ක්‍රියාවලීන්හිදී සත්කාරක සේවය සහ මානසික සුවතාවය ක්‍රමානුකූලව අවතක්සේරු කිරීම තවදුරටත් තහවුරු වේ.



කොටස

3


# සුරැකුම් වැඩ වල බරට මුහුණ දීම සහ එය කළමනාකරණය කිරීම

Monaragala, Sri Lanka
A woman's kitchen in a drought-affected area

අහිතකර කාලගුණික සිදුවීමක් අතරතුර සහ ඉන් පසුව ප්‍රමාණවත් සහ කාලෝචිත ආධාරක සේවාවන් නොමැති විට හෝ ඒවා ලබා ගැනීමට අපහසු වූ විට ස්ත්‍රීන් තම එදිනෙදා වගකීම්වලට එල්ල වන බාධා ජය ගැනීම සඳහා නව හෝ විකල්ප ක්‍රම සොයා ගනිමින් අලුත් වැඩ කොටසක් තමන් වෙත පවරා ගනිති. වෙනත් වචනවලින් කිවහොත් ව්‍යසනයකදී ස්ත්‍රීන් සුරැකුම් වැඩ බර කළමනාකරණය කර ගැනීමට සහ එයට මුහුණ දීමට විවිධ ක්‍රම සොයා ගන්නා අතර එමගින් මැදිහත්වීම්, සහන සහ ආධාරක සේවාවන්හි පවතින හිඩැස් පියවනු ලබයි. අර්බුදකාරී අවස්ථාවන්හිදී නිවෙස් සහ ප්‍රජාවන් ස්ථාවරව පවත්වාගෙන යාම සඳහා ස්ත්‍රීන් දරන ශ්‍රමය තුළ පවතින අලුත් පීඩනයන් මෙම කොටස මගින් අනාවරණය වේ. ආයතනික සහයෝගයක් නොමැතිව සහ නිසි පිළිගැනීමක් නොලැබෙන පසුබිමක අහිතකර කාලගුණික සිදුවීම්වලින් පසුව මෙම ශ්‍රමය තවදුරටත් ව්‍යාප්ත වන සහ තීව්‍ර වන ආකාරය මෙහිදී පරීක්ෂා කෙරෙන අතර එය දැනටමත් පවතින ස්ත්‍රී පුරුෂ සමාජභාවීය අසමානතාවයන් තවදුරටත් තහවුරු කරයි.

රූපසටහන 13

**නිවසේ වැඩකටයුතු සහ සුරැකුම් වැඩ කළමනාකරණය කර ගැනීම සඳහා තමන් වෙනස් යමක් කළේද යන්න පිළිබඳව ස්ත්‍රීන් දැක්වූ ප්‍රතිචාර**




සමීක්ෂණයට ලක් කළ ස්ත්‍රීන් 60 දෙනාගෙන් 51 දෙනෙකු (85%) නිවසේ වැඩ සහ සුරැකුම් වැඩ වගකීම් කළමනාකරණය කර ගැනීම සඳහා තම දෛනික කටයුතු වෙනස් ආකාරයකින් සිදු කළ බව ප්‍රකාශ කළහ (වගුව 11 බලන්න)ශ ප්‍රතිචාර දක්වන්නන්ගේ අත්දැකීම්වලට අදාළ ප්‍රකාශයන් තෝරා ගැනීමට ලබා දීමෙන් විවිධ ප්‍රතිචාර රැසක් වාර්තා කර ගන්නා ලදීශ සමීක්ෂණයට ඇතුළත් කර තිබූ එම ප්‍රකාශයන් පහත පරිදි වේ:

1. මම කලින්ම හෝ දවසේ වෙනත් වේලාවක (උදා: පාන්දර හෝ සවස් කාලයේදී හෝ ව්‍යසනයට සූදානම් වීමක් ලෙස) උයනවා, පිරිසිදු කරනවා හෝ ජලය රැගෙන එනවා.
2. මම වෙනදාට වඩා නිතර පවුලේ අනෙකුත් සාමාජිකයන්ගෙන් ගෘහස්ථ වැඩකටයුතු සඳහා උදවු ඉල්ලනවා.
3. මම අසල්වාසීන්ගෙන් මිතුරන්ගෙන් හෝ ඥාතීන්ගෙන් වෙනදාට වඩා නිතර උදවු ලබා ගන්නවා.
4. මම කාර්යයන් පහසු කරන දේවල් භාවිතා කරනවා (උදා: ජලය රැස් කිරීමේ ක්‍රම- ගෑස් ලිප් ආදිය)
5. ප්‍රමාණවත් කාලයක් හෝ ශක්තියක් නොමැති විට මම සමහර කාර්යයන්ට ප්‍රමුඛතාවය දෙනවා (උදා: වඩාත්ම වැදගත් වැඩ මුලින්ම කර අනෙක් ඒවා පසුවට තැබීම)
6. අපහසු කාලවලදී මම දරුවන් හෝ වැඩිහිටියන් ඥාතීන් හෝ වෙනත් විශ්වාසවන්ත පුද්ගලයන් සමඟ නතර කිරීමට යවනවා.
7. වෙනත් (කරුණාකර සඳහන් කරන්න)

ස්ත්‍රීන් 51 දෙනා විසින් ලබා දුන් ප්‍රතිචාර අතරින් වැඩිපුරම තෝරාගත් ප්‍රකාශයන් වූයේ:

- මම වෙනදාට වඩා නිතර පවුලේ අනෙකුත් සාමාජිකයන්ගෙන් ගෘහස්ථ වැඩකටයුතු සඳහා උදවු ඉල්ලනවා. (20.6%)
- මම කලින්ම හෝ දවසේ වෙනත් වේලාවක උයනවා, පිරිසිදු කරනවා හෝ ජලය රැගෙන එනවා. (18.4%)
- මම අසල්වාසීන්ගෙන් මිතුරන්ගෙන් හෝ ඥාතීන්ගෙන් වෙනදාට වඩා නිතර උදවු ලබා ගන්නවා. (16.2%)
- ප්‍රමාණවත් කාලයක් හෝ ශක්තියක් නොමැති විට මම සමහර කාර්යයන්ට ප්‍රමුඛතාවය දෙනවා. (16.2%)

වගුව 11

**අහිතකර කාලගුණික සිදුවීම්වලදී සුරැකුම් වැඩ බරට මුහුණ දීමේ සහ කළමනාකරණය කිරීමේ වෙනස්කම් හෝ නව ක්‍රමවේද (දිස්ත්‍රික්ක අනුව හරස් වර්ගීකරණය)**

| | ප්‍රතිශතය |
|---|---|
| මම කලින්ම හෝ දවසේ වෙනත් වේලාවක උයනවා, පිරිසිදු කරනවා හෝ ජලය රැගෙන එනවා | 18.4% |
| මම වෙනදාට වඩා නිතර පවුලේ අනෙකුත් සාමාජිකයන්ගෙන් ගෘහස්ථ වැඩකටයුතු සඳහා උදවු ඉල්ලනවා | 20.6% |
| මම අසල්වාසීන්ගෙන් මිතුරන්ගෙන් හෝ ඥාතීන්ගෙන් වෙනදාට වඩා නිතර උදවු ලබා ගන්නවා | 16.2% |
| මම කාර්යයන් පහසු කරන දේවල් භාවිතා කරනවා | 11.0% |
| ප්‍රමාණවත් කාලයක් හෝ ශක්තියක් නොමැති විට මම සමහර කාර්යයන්ට ප්‍රමුඛතාවය දෙනවා | 16.2% |
| අපහසු කාලවලදී මම දරුවන් හෝ වැඩිහිටියන් ඥාතීන් හෝ වෙනත් විශ්වාසවන්ත පුද්ගලයන් සමඟ නතර කිරීමට යවනවා | 14.0% |
| වෙනත් | 3.7% |
| නියදිය | 51 |

ව්‍යසන සහ අර්බුද පවතින අවස්ථාවලදී පමණක් පවුලේ සාමාජිකයන්ගෙන් සහ අසල්වාසීන් වැනි ප්‍රජා ජාලයන්ගෙන් බාහිර සහය පැතීමෙන් ගම්‍ය වන්නේ සාමාන්‍ය අවස්ථාවලදී ස්ත්‍රීන් තම පෞද්ගලික ධාරිතාව මත පමණක් යැපෙමින් මෙම කටයුතු සිදු කරන බවයි. ඒ අනුව අහිතකර කාලගුණික තත්ත්වයකදී ස්ත්‍රීන් ගේ ශ්‍රමය වෙනත් අය වෙත පැවරීම, සහයෝගීතාව හෝ හිතෛෂීභාවය මත පදනම්ව ස්වයංක්‍රීයව අඩු නොවන අතර එය හුදෙක් එම මොහොතේ අවශ්‍යතාවය මත තාවකාලිකව ප්‍රතිසංවිධානය වීමක් සහ නැවත බෙදාහැරීමක් පමණක් වේ. වෙනත් වචනවලින් කිවහොත් මෙය අත්‍යවශ්‍යතාවය මත පදනම් වූ ගැලපුමක් වන අතර වැඩකටයුතු බෙදා හදා ගත්ත ද, ගෘහස්ථ ශ්‍රමය සහ වගකීම්වල මූලික සම්බන්ධීකාරකවරුන් සහ කළමනාකරුවන් ලෙස දිගටම කටයුතු කරන්නේ ස්ත්‍රීන් ය.

අසල්වාසීන් මිතුරන් සහ ඥාතීන්ගේ මැදිහත්වීම මගින් දේශගුණික අනුවර්තනය සඳහා අවිධිමත් ජාලයන් ඉටු කරන වැදගත් කාර්යභාරය ද අවධාරණය කෙරේ. මෙම ජාලයන් බොහෝ විට සමාජ ඔරොත්තු දීමේ හැකියාවේ දර්ශක ලෙසත් ප්‍රජා සාමූහිකත්වයේ පවතින වැදගත්කම ලෙසත් අර්ථකථනය කෙරේ. එහෙත් ව්‍යසනයන් අතරතුර සහ ඉන් පසුව රජයේ සහය සහ දේශගුණයට හිතකාමී සුරැකුම් වැඩ යටිතල පහසුකම්වල පවතින පද්ධතිමය හිඩැස් පියවීමට මෙම ජාලයන් ආදේශක ලෙස ක්‍රියා කරන බව දත්ත මගින් ගම්‍ය වේ. තවද ස්ත්‍රීන් විසින් මෙම ජාලයන් මෙහෙයවීමේදී සමහර විට අන්‍යෝන්‍ය වශයෙන් ඉටු කළ යුතු බැඳීම්වලට එකඟ වීමට සිදු වන අතර එමගින් අර්බුද කාලවලදී ඔවුන් දරන වැටුප් රහිත ශ්‍රමයේ විෂය පථය තවදුරටත් පුළුල් වේ. උදාහරණයක් ලෙස කොළඹ එක් ස්ත්‍රීයක් විස්තර කළේ ගංවතුර නිසා දරුවන් තනිවම තැබීම අනාරක්ෂිත වූ අවස්ථාවක නිවසේ බඩු බාහිරාදිය ආරක්ෂා කර ගැනීම සහ සහන ද්‍රව්‍ය ලබා ගැනීම වැනි හදිසි කටයුතුවල නිරත වන තෙක් දරුවන් බලා ගැනීමට ඇය අසල්වාසීන්ගේ සහය ලබාගත් ආකාරය යි.

මෙම සහයෝගය බොහෝ විට අනාගත හදිසි අවස්ථාවකදී පෙරළා එවැනිම සහයක් ලබා දෙනු ඇතැයි යන අපේක්ෂාව මත පදනම් වේ. මොණරාගල තවත් කාන්තාවක් සඳහන් කළේ වියළි කාලගුණය පවතින විට අසල්වැසියාගේ දරුවා බලා දෙන අතරතුර ඇයගේ වාරයේදී දරුවා බලා ගැනීමට සහය ලබාගෙන ජලය සහ එළවළු ණයට ලබාගත් ආකාරය යි.

එලෙසම වෙනස් වේලාවන්හිදී ආහාර පිසීම, පිරිසිදු කිරීම හෝ ජලය රැගෙන ඒම මෙන්ම කාර්යයන් සඳහා ප්‍රමුඛතාවය ලබා දීම වැනි ක්‍රියාවන් මගින් පෙන්වා දෙන්නේ මෙවැනි ගැලපීම් බොහෝ විට විවිධ මට්ටමේ කැප කිරීම් මත සිදුවන බවයි. එදිනෙදා චර්යාවන් ප්‍රතිසංවිධානය කිරීමේදී ස්ත්‍රීන් බොහෝ විට වෙනදාට වඩා වේලාසනින් අවදි වීම ප්‍රමිතියට වඩා වැඩි කාලයක් වැඩ කිරීම සහ විවේක කාලය සීමා කිරීම සිදු කරති. නියඟ කාලවලදී ජලය සෙවීම සඳහා වැඩි දුරක් ඇවිදීම,උෂ්ණ අධික කාලවලදී ලිප අසල සිටීම වළක්වා ගැනීමට උදෑසන සහ දහවල් ආහාරය වේලාසනින් පිළියෙළ කිරීම සහ ගංවතුර හෝ තද වැසි පවතින විට නිතර පිරිසිදු කිරීමට සිදු වීම මෙයට ඇතුළත් වේ. කාර්යයන් සඳහා ප්‍රමුඛතාවය ලබා දීම ද සැමවිටම සාධාරණ නොවන අතර එමගින් පෝෂණය, සනීපාරක්ෂාව, විවේකය සහ සුරැකුම් සේවාවේ ගුණාත්මකභාවය සම්බන්ධයෙන් යම් යම් අවාසිදායක තත්ත්වයන් ඇති වේ උදාහරණයක් ලෙස මොනරාගල දිස්ත්‍රික්කයේ එක් ස්ත්‍රියක් පැවසුවේ හිඟකම සහ අවදානම් සහගත තත්ත්වයන් පවතින විට තම පවුලේ අය පෝෂණය කිරීම සඳහා ඇය බොහෝ විට ආහාර වේලක් නොකා සිටින බවත් දිගුකාලීන නියඟ කාලවලදී මුළු පවුලටම දිනකට එක ආහාර වේලකින් සෑහීමට පත් වීමට සිදු වන බවත් ය.

මෙම ක්‍රමවේදයන් අවසානයේදී ශාරීරික තෙහෙට්ටුවට සහ චිත්තවේගීය පීඩනයට හේතු වේ. මෙයින් පෙනී යන්නේ මේවා හුදෙක් පවතින තත්ත්වයට මුහුණ දීමේ උපක්‍රම මිස සැබෑ සහනයක් නොවන බවයි. එමගින් අනුවර්තනය වීමේ බර මහජන යටිතල පහසුකම් හෝ සේවාවන් වෙත යොමු කරනවා වෙනුවට පුද්ගලයා මතම පටවනු ලබයි. මෙම සොයාග ැනීම්වලට අනුව දේශගුණික ව්‍යසනයන් පවතින විට සහ ඉන් පසුව ආයතනික හිඩැස් පියවීමේදී ස්ත්‍රීන් තීරණාත්මක නමුත් හඳුනා නොගත් කාර්යභාරයක් ඉටු කරයි. ව්‍යසන සූදානම සහ ප්‍රතිචාර දැක්වීමේ පද්ධතිමය අසාර්ථකත්වයන් මධ්‍යයේ වුවද පවුල්වලට සහ ප්‍රජාවන්ට අඛණ්ඩව පැවතීමට හැකි වී ඇත්තේ ස්ත්‍රීන් ගේ මෙම වැටුප් රහිත ශ්‍රමය නිසා ය. තවද ඔවුන්ගේ මෙම අනුවර්තන ක්‍රමවේදයන් පෞද්ගලික මෙන්ම සාමූහික මට්ටමින් යථා තත්ත්වයට පත්වීමට දායක වන අතර එමගින් ඔරොත්තු දීමේ හැකියාව පිළිබඳ කතිකාවන් ශක්තිමත් කරයි. කෙසේ වෙතත් අත්‍යවශ්‍යතාවය මත මෙම කාර්යයන් ඉටු කිරීම යනු ඔවුන්ගේ නිදහස ස්වාධීනත්වය සහ ස්වයංපෝෂිතභාවය වෙනුවෙන් විශාල පෞද්ගලික පිරිවැයක් දැරීමයි. එබැවින් වැටුප් රහිත ශ්‍රමය නොපෙනෙන ආරක්ෂක ජාලයක් ලෙස භාවිතා කිරීම වෙනුවට එම ශ්‍රමය අඩු කිරීම සහ නැවත බෙදාහැරීම කෙරෙහි සෘජුවම අවධානය යොමු කරන ක්‍රමවත් ව්‍යසන ප්‍රතිචාර යාන්ත්‍රණයන් සහ දේශගුණික ක්‍රියාකාරී රාමු සැකසීම අතිශයින්ම වැදගත් වේ.



කොටස

# 4 ආයතනික ආධාරක සේවාවන්


Gampaha, Sri Lanka
A woman's kitchen in a flood affected area

ආධාරක සේවාවන් සහ ඒවාට ප්‍රවේශ වීම පිළිබඳ කොටසක් මෙයට ඇතුළත් කිරීමේ පදනම වූයේ ආධාර සැපයීමේදී පවතින අඩුපාඩු සහ ගැටලු මොනවාද ? ආධාර යන්නෙන් සැබවින්ම අදහස් කරන්නේ කුමක්ද ? සහ එම ආධාර ලබා දෙන්නේ කවදාද ? සහ කාහටද? යන්න වටහා ගැනීමයි.

පෙර සඳහන් කළ පරිදි අර්බුද සහ කළමනාකරණ අවස්ථාවලදී ස්ත්‍රීන් බොහෝ විට මිතුරන් පවුලේ අය සහ ප්‍රජා ජාලයන් ඒකරාශී කර ගනිති. ආයතනික සහ විධිමත් ආධාර පද්ධතීන් ප්‍රමාණවත් නොවන අවස්ථාවලදී මෙම ආධාරක ජාලයන් ඥාති සබඳතා හෝ පවුල් සබඳතා මත පදනම්ව ක්‍රියාත්මක වෙමින් සහනයක් ලබා දීම සඳහා තාවකාලික පියවරක් ලෙස ක්‍රියා කරයි. දේශගුණික ව්‍යසනයකදී හෝ අහිතකර කාලගුණික තත්ත්වයකදී තමන්ට කිසියම් ආකාරයක ආධාර ලැබුණු බව ප්‍රතිචාර දැක්වූවන්ගෙන් 70% ක් වාර්තා කළද එම ආධාර වල ස්වභාවය මූලාශ්‍රය සහ කාලසීමාව මගින් පෙන්නුම් කරන්නේ පූර්ණ ආරක්ෂාවකට වඩා රාජ්‍ය සහ ආයතනික සුරැකුම්හි පවතින ව්‍යුහාත්මක හිඩැස් ය.

රූපසටහන 14

**ආධාර ලැබුණු මාර්ග -**
**ස්ත්‍රීන් 40 දෙනෙකුගෙන් ලැබුණු ප්‍රතිචාර**




තමන්ට ආධාර ලැබුණු බව වාර්තා කළ ප්‍රතිචාර දැක්වූවන් අතරින් වැඩි පිරිසකට එම ආධාර ලැබී තිබුණේ පවුලේ සාමාජිකයන්ගෙනි (47.7% පුද්ගලයන් 19ක්). ඉන්පසුව අසල්වාසීන් සහ ප්‍රජාවගෙන් (27.7% පුද්ගලයන් 12ක්) ආධාර ලැබී තිබූ අතර විධිමත් හෝ ආයතනික පාර්ශවයන්ගෙ න් ලැබී තිබුණේ අවම දායකත්වයකි (24.6% පුද්ගලයන් 9ක්). මෙම දත්ත බෙදීයාම මගින් ආධාරවල ප්‍රමාණවත් බව හෝ අප්‍රමාණවත් බව පිළිබඳව සෘජු නිගමනයකට එළඹීමට නොහැකි වුවද ඉන් වගකීම් පැහැර හැරීමක් සිදුවන බව මැනවින් පැහැදිලි වේ. වෙනත් වචනවලින් කිවහොත් අර්බුද සහ ඒවායේ බලපෑම් කළමනාකරණය කිරීමේ වගකීම රජයෙන් බැහැරව පවුල් ඒකක වෙත පැවරී ඇත. එමගින් ආයතනික දුර්වලතා පියවා ගැනීම සඳහා ඥාති සබඳතා සහ සමාජ ජාලයන් මත යැපීමට සිදු වන අතර මෙය අවසාන වශයෙන් ස්ත්‍රීන්මත අසමාන ලෙස බර පටවන රටාවක් නිර්මාණය කරයිග තවද ඥාති සහ පවුල් සබඳතා මගින් ව්‍යසනයකදී ක්ෂණික සහ හුරුපුරුදු සහයක් ලබා දිය හැකි වුවද, ඒවා ස්වභාවයෙන්ම අසමාන සහ සබඳතා මත පදනම් වූ ඒවා වේ. මේවා ස්ථාවර පවුල් සබඳතා ඇති අයට වාසිදායක වන අතර වැන්දඹු, වෙන්වූ, වයෝවෘද්ධ, ආබාධිත හෝ සමාජීය වශයෙන් හුදෙකලා වූ ස්ත්‍රීන් තවදුරටත් අසරණ තත්ත්වයට පත් කරයි.

සෑම ප්‍රතිචාර දැක්වූවෙකුගෙන්ම ආධාර ලැබුණු මාර්ග පිළිබඳව විශේෂ ප්‍රශ්න අසන ලදීග එම ප්‍රතිචාර පහතින් දැක්වේ:

වගුව 12

**අහිතකර කාලගුණික සිදුවීමකින් පසු ආධාර ලැබුණු ආයතනික සහ රාජ්‍ය නොවන මූලාශ්‍ර**


| | ප්‍රතිශතය |
|---|---|
| සමාජ සේවා අමාත්‍යාංශ | 0.6% |
| පළාත් පාලන ආයතන (මහ නගර සභාව/නගර සභාව/ප්‍රාදේශීය සභාව) | 2.4% |
| සමාජ ආරක්ෂණ සේවා | 1.2% |
| ග්‍රාම නිලධාරී | 17.6% |
| ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | 6.1% |
| සෞඛ්‍ය සේවකයින්/පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියන් | 6.7% |
| පොලිසිය/යුද හමුදාව/නාවික හමුදා සහාය | 11.5% |
| ප්‍රාදේශීය පාසල හෝ ආගමික ස්ථානය | 1.8% |
| පෞද්ගලික සමාගම් (සමාජ වගකීම්, ව්‍යාපෘති, පරිත්‍යාග ආදිය) | 0.6% |
| ප්‍රාදේශීය දේශපාලනඥයන් | 6.1% |
| රාජ්‍ය නොවන සංවිධාන (හඛධ) හෝ සිවිල් සංවිධාන | 10.9% |
| ආගමික පදනම් සහිත සංවිධාන | 7.9% |
| පුද්ගලික මට්ටමින් ලැබුණු ආධාර | 12.1% |
| කිසිදු ආධාරයක් නොලැබුණ | 9.7% |
| වෙනත් | 4.8% |
| නියදිය | 60 |

වඩාත් බහුලව වාර්තා වී ඇති ආයතනික හෝ විධිමත් ආධාර සේවාවන් අතරින්, ග්‍රාම නිලධාරී/පොලිසිය/යුද හමුදාව/නාවික හමුදාව සහ රාජ්‍ය නොවන සංවිධාන හෝ සිවිල් සංවිධාන, ප්‍රධාන වශයෙන් මතු වන්නේ ද්විතීයික සහ බොහෝ විට හදිසි අවස්ථාවකදී ක්‍රියාත්මක වන ආධාරක මූලාශ්‍ර ලෙසය. එබැවින් මෙම ආධාරවල ස්වභාවය මූලික වශයෙන් ක්ෂණික සහන සැලසීම සහ කෙටිකාලීන යථා තත්ත්වයට පත් කිරීම් මත පදනම් වේ.

මෙයට ඉවත් කිරීම්,ආහාර බෙදා හැරීම, පිරිසිදු පානීය ජලය ලබා දීම, නවාතැන් සහ මූලික වෛද්‍ය ආධාර ඇතුළත් වේ (නමුත් ඒවාට පමණක් සීමා නොවේ)ග ලැබුණු ආධාර වර්ග පිළිබඳ වැඩිදුර පැහැදිලි කිරීමක් පහත දැක්වේ:

රූපසටහන 15

**ලැබුණු ආධාර වර්ග**




මෙම දත්ත මගින් අර්බුදකාරී අවස්ථාවකදී ප්‍රමුඛතාවය හිමිවන්නේ කොතැනටද යන්න හෙළි කරයි; මෙම ස්ත්‍රීන් ගේ අත්දැකීම්වලට අනුව විධිමත් ආපදා ප්‍රතිචාර යාන්ත්‍රණයන් මූලික වශයෙන් යොමුවී ඇත්තේ තිරසාර ප්‍රකෘතිමත් වීමක් හෝ දිගුකාලීන රැකවරණයක් වෙනුවෙන් නොව අර්බුදය පාලනය කිරීම සඳහා පමණි. මෙහිදී ආහාර, ජලය සහ නවාතැන් මුල් තැන ගෙන ඇති අතර වෛද්‍ය ආධාර දෙවනුවට පැමිණේග මනෝවිද්‍යාත්මක/භාවාත්මක සහාය නිවාස අලුත්වැඩියාව සඳහා සහාය කාලීන තොරතුරු සහ පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධති සඳහා ඇති සීමිත ප්‍රවේශය මගින් පෙනී යන්නේ දේශගුණික අර්බුදයේ බරපතලකම මෙන්ම එහි සංකීර්ණ සහ පුළුල් ස්වභාවය අවබෝධ කර ගැනීමේ මූලික අඩුවක් පවතින බවයි. ඒ අනුව, මෙම දත්ත මගින් විධිමත් ආධාර යාන්ත්‍රණයන් ක්‍රියාත්මක වන සීමාව මෙන්ම සහන සහ ප්‍රකෘතිමත් වීමේ ක්‍රියාවලියේ ප්‍රමුඛතාවයන් හිමිවන කාලරාමුවද හෙළි වේ.

තවද දත්ත රැස්කිරීමේ කාලසීමාව තුළදී ක්ෂණික සහ මධ්‍යකාලීන සහන සඳහා පවතින සේවාවන් ලබාගැනීමේ ක්‍රියාවලිය පිළිබඳ වැදගත් තොරතුරු සාකච්ඡා කෙරිණි. කොළඹ සහ මොණරාගල ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන් හෙළි කළේ අර්බුදකාරී අවස්ථාවලදී මූල්‍ය වන්දි (සාමාන්‍යයෙන් අලුත්වැඩියාවන් සහ ප්‍රකෘතිමත් වීම් සඳහා වෙන් කර ඇති) ඇතුළු සීමිත සම්පත් ඉක්මවා යාමේ අවදානමක් පවතින බවයි. එබැවින් රාජ්‍ය පාර්ශවකරුවන්ට ප්‍රමුඛතාවය දීමේ සහ බැහැර කිරීමේ ක්‍රියාවලියකට අනුගත වීමට සිදු වන අතර වේගවත් අවශ්‍යතා පදනම් කරගත් ඇගයීම් මත සුදුසුකම් තීරණය කෙරේ. මෙම අවශ්‍යතා මූලික වශයෙන් තීරණය කරනු ලබන්නේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල සහ ග්‍රාම නිලධාරීන් ඇතුළු ප්‍රාදේශීය පරිපාලන ව්‍යුහයන් හරහා වන අතර ඔවුන්ගේ තක්සේරුව සහන ලැයිස්තු සහ වන්දි අනුමත කිරීම් සඳහා පදනම වේ - මෙය 2005 අංක 13 දරන ආපදා කළමනාකරණ පනතේ සහ 2017 ජාතික හදිසි මෙහෙයුම් සැලැස්ම වැනි අනෙකුත් මාර්ගෝපදේශවල දක්වා ඇත (ශ්‍රී ලංකා රජය 2005; ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය 2017) මීට අමතරව මුඛ පරම්පරාගත ක්‍රියාවලීන් සහ ඩිජිටල් ආපදා සහන වේදිකා වැනි අනෙකුත් අවිධිමත් හෝ තාවකාලික ජාලයන්ද අර්බුද අවස්ථාවලදී ස්ථාපිත වේ.

එසේ වුවද ප්‍රතිචාර දැක්වූවන්ගේ ප්‍රකාශයන්ට අනුව පෙනී යන්නේ මෙම අවශ්‍යතා පදනම් කරගත් තක්සේරු කිරීම් පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධති සහ සහන හෝ වන්දි සඳහා වන අයිතිවාසිකම් අපක්ෂපාතී හෝ සමානව ක්‍රියාත්මක නොවන බවයි. ආපදා ක්‍රියාවලීන්හි පවතින වෙනස්කම් කිරීම් අසංස්ථිතභාවය ප්‍රවේශ වීමට ඇති අපහසුව සහ පාරදෘශ්‍යභාවයක් නොමැතිකම පිළිබඳව ස්ත්‍රීන් වාර්තා කළහ. සහන බෙදාහරින නිලධාරීන් සමඟ පවතින සමාජීය සමීපතාවය මත සහන ලැබීම තීරණය වන බවටත් ඇතැම් අවස්ථාවලදී හානිය බාහිරට පෙනෙන ආකාරය වෙහෙසකර නිලධාරිවාදී ක්‍රියාවලීන් සමඟ නැවත නැවතත් සම්බන්ධ වීමේ හැකියාව සහ ප්‍රධාන පාරවල්වලට ඇති සමීපතාවය මත සහන ලැබීම රඳා පවතින බවටත් විශ්වාසයක් පවතී. මෙයින් අදහස් වන්නේ වගකිවයුතු නිලධාරීන් ප්‍රධාන මාර්ගවලින් බැහැරව ඇති නගර අභ්‍යන්තරයේ හෝ හුදකලා වූ නිවෙස්වලට නිතර නොපැමිණෙන බවයි.

විශේෂයෙන්ම කොළඹ සහ මොණරාගල දිස්ත්‍රික්කවල ස්ත්‍රීන් කිහිප දෙනෙකු වාර්තා කළේ 2024 වසරේ නැවත නැවතත් ඇති වූ ගංවතුරින් පසුව ඔවුන්ගේ ප්‍රදේශයට අනුයුක්ත ග්‍රාම නිලධාරීන් ඔවුන්ගේ නිවෙස්වලට පැමිණ නැති බවයි. ඒ පිළිබඳව විමසූ විට ප්‍රතිචාර දැක්වූවන් පැහැදිලි කළේ මෙම නිලධාරීන් බොහෝ විට ප්‍රධාන මාර්ගවලින් ඈත්ව පිහිටි නිවෙස් නොසලකා හරින බවයි. සහන බෙදා හැරීමේ පවතින මෙම අසමානතාවය දත්ත රැස් කිරීමේ කාලසීමාව පුරාම පැහැදිලි විය; ප්‍රධාන මාර්ග අසල ජීවත් වූ සමීක්ෂණයට ලක් වූ බොහෝ ස්ත්‍රීන් ට අවම වශයෙන් ආහාර පාර්සල් සහ පිරිසිදු පානීය ජලය හෝ මීට පෙර ලැබී තිබුණි. වඩාත් මෑතකදී 'ඩිට්වා' (Ditwah) සුළි කුණාටුවෙන් සිදු වූ විනාශයෙන් පසුව කොළඹ ප්‍රදේශයේ පදිංචි කාන්තාවක් (53) ප්‍රකාශ කළේ ඇය අසල පන්සලකින් මූලික වියළි සලාක ලබා ගත් බව දැනගත් පසු ප්‍රදේශයේ ග්‍රාම නිලධාරියා ඇයට අත්‍යවශ්‍ය සහ ක්ෂණික සහන ලබා දීම ප්‍රතික්ෂේප කළ බවය. මෙයට විවිධ සෞඛ්‍ය සංකූලතා සහ ආබාධිත තත්ත්වයන්ගෙන් පෙළෙන ඇගේ 15 හැවිරිදි පුතාට අවශ්‍ය ඖෂධ ද ඇතුළත් විය.

> "පසු ගිය වසරේ (2024) මගේ නිවස ගංවතුරට හසු වූ විට මම මගේ පවුලේ අය උස් බිමක පිහිටි මිතුරෙකුගේ නිවසක නැවැත්තුවාග මම මගේ පවුලට අවශ්‍ය ආහාර පාර්සල් ගෙන ඒමට දිනපතා දහවල් සහ රාත්‍රියේ පන්සලට පයින් ගියාග මේ කාලය තුළ අපි උදේ ආහාරය ගන්නේ නැහැ එහෙමත් නැතිනම් රාත්‍රී කෑමෙන් ඉතිරි වන දේ පසුදා උදේට ඉතුරු කර ගන්නවාග සමහර වෙලාවට කෑම ගේන්න ගංවතුර මැදින් ඇවිදින්න වෙනවාග නමුත් සමහර වෙලාවට මිනිස්සු මට උදවු කරනවා"

කාන්තාවක් - වයස - 52 කොළඹ.


මූලික සහාය සහ සහන ලබා ගැනීම සඳහා අවශ්‍ය වන නිලධාරිවාදී සහ සැපයුම් පූර්ව අවශ්‍යතාවයන් ද දැනටමත් අධික ලෙස වැඩ කරන ස්ත්‍රීන් ට අමතර බරක් පටවයි. නිල නිවාස සංචාර සිදු නොවන අවස්ථාවලදී ග්‍රාම නිලධාරීන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත ගොස් මෙම පහසුකම් ඉල්ලා සිටීමට ස්ත්‍රීන් ට බොහෝ විට සිදුවේ. මෙය කාලය වැයවන මෙන්ම වියදම් අධික ක්‍රියාවලියකිග විශේෂයෙන්ම කාලය හිඟ සහ මූලික සම්පත් අවම එහෙත් රැකවරණය සඳහා වැඩි ඉල්ලුමක්  පවතින අර්බුදකාරී කාලසීමාවකදී මෙය වඩාත් දැනේ.

එපමණක් නොව දිස්ත්‍රික් මට්ටමේ දත්ත විශ්ලේෂණය මගින් දේශගුණික ආපදාවකදී හෝ දරුණු කාලගුණික තත්ත්වයකදී සහන සහ සහාය ලබා ගැනීමේ තවත් අසමානතාවයක් ඉස්මතු කරයි. කොළඹ දිස්ත්‍රික්කයෙන් ප්‍රතිචාර දැක්වූවන් 15 දෙනෙකු සහ ගම්පහ දිස්ත්‍රික්කයෙන් ප්‍රතිචාර දැක්වූවන් 20 දෙනාම පසුගිය වසර 5 තුළ යම් ආකාරයක සහනයක් හෝ සහායක් ලබා ඇති අතර මොණරාගල දිස්ත්‍රික්කයෙන් එම කාලසීමාව තුළ කිසියම් සහායක් ලැබී ඇත්තේ ප්‍රතිචාර දැක්වූවන් 20 දෙනාගෙන් 9 දෙනෙකුට පමණි. මෙයට විවිධ හේතු තිබිය හැකි වුවද, 2005 වසරේ සිට ශ්‍රී ලංකාවේ මොණරාගල සහ ඌව පළාතට බලපාන වඩාත්ම නිරන්තර සෙමින් ආරම්භ වන නමුත් දීර්ඝ කාලීන දේශගුණික පීඩනයක් ලෙස නියඟය හඳුනාගෙන තිබියදීත් එය ආපදාවක් ලෙස සලකනු ලබන්නේ ඉතා කලාතුරකිනි. මෙය 'ආපදාවක්' හෝ 'හදිසි අවස්ථාවක්' යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද යන ප්‍රශ්නය මතු කරයි. මොණරාගල ස්ත්‍රීන් ද මෙය අවබෝධ කරගෙන සිටි අතර ඔවුන් පෙන්වා දුන්නේ දිගු වියළි කාලගුණයක් හෝ නියඟයකට වඩා මෝසම් කාලවලදී සහන බෙදා හැරීමට පියවර ගන්නා බවයි. නියඟයකදී ක්ෂණික සහන අදාළ නොවිය හැකි වුවද ජල ආරක්ෂණ මැදිහත්වීම් සහ ජීවනෝපාය ආරක්ෂා කිරීම වැනි තිරසාර සහ පූර්ව අනතුරු ඇඟවීමේ සහාය යාන්ත්‍රණයන් නොමැතිකම නිසා දීර්ඝ කාලීන අවදානම සහ අඛණ්ඩ අලාභයන් සිදුවේ.

මෙය 2017 ජාතික හදිසි මෙහෙයුම් සැලැස්ම (DMC 2017) තුළ ද සාක්ෂි සහිතව දැකගත හැකිය. එහි ගංවතුර (ගංගා සහ ජලාශවල ජල මට්ටම ඉහළ යාම) සහ සුළි කුණාටු (වෙරළ තීරයෙන් කිලෝමීටර් 550ක් දුරින් සුළි කුණාටු මාර්ග පිහිටීම) සම්බන්ධයෙන් පූර්ව අනතුරු ඇඟවීම් නිකුත් කිරීම සඳහා පැහැදිලි උපදෙස් දක්වා ඇත. කෙසේ වෙතත් නියඟය හඳුනා ගැනීම සම්බන්ධ භාෂාව අපැහැදිලි සහ මැනිය නොහැකි මට්ටමක පවතී: "දිගු කාලයක් සඳහා සැලකිය යුතු වර්ෂාපතන හිඟයක් පුරෝකථනය කර ඇති විට හෝ/සහ දිගු වියළි කාලගුණයක් නිරීක්ෂණය කිරීම සැලකිය යුතු පානීය/ගෘහස්ථ ජල හිඟයක් සැලකිය යුතු ආහාර අනාරක්ෂිත භාවයක් හෝ සැලකිය යුතු කෘෂිකාර්මික බලපෑමක්" (DMC 2019 පිටුව 28) එම සැලැස්මෙහි තවදුරටත් මෙසේ සඳහන් වේ: "සහන බෙදා හැරීමේ අරමුණ සඳහා, නියඟය යනු පිට පිට කන්න දෙකක කෘෂිකාර්මික නිෂ්පාදනය අහිමි වීම ලෙස අර්ථ දක්වා ඇත" (පිටුව 52) මෙම රාමුව අවසානයේදී ආපදාව හඳුනා ගැනීම සහ මැදිහත්වීම ප්‍රමාද කරන අතර අලාභයන් සම්පූර්ණයෙන්ම සිදු වන තෙක් සහන ලබා නොදෙයි. මෙහි ප්‍රතිඵලයක් ලෙස විශේෂයෙන්ම ස්ත්‍රීන්  මූලිකත්වය දෙන පවුල්වලට අර්බුදයේ මුල් සහ මධ්‍ය අවධීන්හිදී ලැබිය යුතු කාලීන සහාය අහිමි වන අතර මොණරාගල වැනි නියඟයට ගොදුරු වන දිස්ත්‍රික්කවල ස්ත්‍රීන් මත පැටවෙන වැටුප් රහිත රැකවරණ සහ සම්පත් කළමනාකරණ බර තවදුරටත් තීව්‍ර වේ.

රූපසටහන 16

**සහන සේවා මගින් තම සුරැකුම් වගකීම්  කළමනාකරණය කිරීමට හෝ අඩු කිරීමට සහයක් ලැබුණේද යන්න පිළිබඳව ස්ත්‍රීන් 51 දෙනෙකුගෙන් ලැබුණු ප්‍රතිචාර**



මෙහිදී සඳහන් කළ යුතු තවත් වැදගත් කරුණක් වන්නේ, තමන්ට ආධාර ලැබුණු අවස්ථාවලදී ඒමගින් සුරැකුම් බර කළමනාකරණය කර ගැනීමට උපකාර වූ ආකාරය ගැන විස්තර කිරීමේදී මෙවැනි අතිශය දරුණු සහ පෙර නොවූ විරූ විනාශයන් සහ බාධාවන් හමුවේ ඕනෑම ආකාරයකින් ලැබුණු උපකාරයක් අගය කරන බව බොහෝ ප්‍රතිචාර දැක්වූවන් ප්‍රකාශ කිරීමයි. ආධාර සහ සම්පත්වල පවතින හිඟකම පිළිබඳ අවබෝධය නිසා ඇතිවන මෙවැනි කෘතඥපූර්වක භාවයක් තේරුම් ගත හැකි වුවද ඒමගින් එම ආධාරවල ප්‍රමාණවත් බව සහ සාධාරණත්වය පිළිබඳ තීරණාත්මක ප්‍රශ්න යටපත් වීමේ අවදානමක් පවතී.

මෙම කොටසින් පෙන්නුම් කරන්නේ දේශගුණික ආපදා සහ දරුණු කාලගුණික තත්ත්වයන්ගෙන් පීඩාවට පත් සමහර ස්ත්‍රීන් වෙත ආධාර සහ සහන යාන්ත්‍රණයන් ලඟා වුවද ඒවාට ඇති ප්‍රවේශය අසමාන කෙටිකාලීන බලපෑමේ ස්වභාවය සහ ක්ෂණික බව මත දැඩි ලෙස රඳා පවතින අතර බොහෝ විට අවිධිමත් ජාල සහ නිලධාරීන්ගේ අභිමතය පරිදි සිදුවන පරිපාලන ක්‍රියාවලීන් මගින් මෙහෙයවන බවයි. ආයතනික ප්‍රතිචාර හඳුනා ගැනීම්, ඉලක්ක කිරීම් සහ පූර්ව ක්‍රියාමාර්ගවල පවතින අඩුපාඩු මඟහරවා ගැනීම සඳහා හදිසි සහන සැපයීමේ සිට ස්ත්‍රී, පුරුෂ සමාජභාවය සහ රැකවරණය පිළිබඳ සංවේදී ආපදා පාලන ක්‍රමවේදයක් කරා තීරණාත්මක වෙනසක් සිදු විය යුතුය. ඒමගින් ස්ත්‍රීන් මත පැටවෙන අසමාන බර හඳුනාගෙන එය සක්‍රීයව අඩු කළ යුතු අතර ඉහත දක්වා ඇති පරිදි එම බර බොහෝමයක් පද්ධතිමය අඩුපාඩු සඳහා විකල්ප ලෙස ක්‍රියා කරය.



5

## කොටස


# සෞඛ්‍ය බලපෑම් සහ සෞඛ්‍ය සේවා සඳහා ඇති ප්‍රවේශය

Monaragala, Sri Lanka
Subsistence crops dried up under the harsh sun

දේශගුණික විපර්යාස සහ වැටුප් රහිත සුරැකුම් වැඩ අතර පවතින සම්බන්ධතාවය තුළ සෞඛ්‍යය යනු අඛණ්ඩව පවතින තීරණාත්මක ගැටලුවකි. මෙම සමීක්ෂණයේ සොයාගැනීම් මගින් දේශගුණික ආපදාවලදී සෞඛ්‍ය සේවා ලබා ගැනීමේදී ඇතිවන අභියෝග මෙන්ම ස්ත්‍රීන් මෙම බලපෑම් දරා ගන්නා ආකාරය ද පැහැදිලි කරයි.

රූපසටහන 17

**කාලගුණික සිදුවීම් හේතුවෙන් තමන්ට හෝ තම නිවසේ කිසිවෙකුට සෞඛ්‍ය ගැටලු ඇති වුයේද නැතහොත් පවතින තත්ත්වයන් උත්සන්න වුයේද යන්න පිළිබඳව ස්ත්‍රීන් 59 දෙනෙකුගෙන් ලැබුණු ප්‍රතිචාර**




දිස්ත්‍රික්ක තුන පුරාම සිදුකළ අධ්‍යයනයේදී පැහැදිලිවම හෙළි වූ කරුණක් නම් වැඩිපුරම රෝගාතුර වී ඇත්තේ ස්ත්‍රීන් එනම් සමීක්ෂණයට ප්‍රතිචාර දැක්වූවන්ම බවයි. ඉන් අනතුරුව පිළිවෙළින් වයස අවුරුදු 18 ට අඩු දරුවන් සහ ආබාධිත පුද්ගලයන් හෝ නිදන්ගත රෝගවලින් පෙළෙන පුද්ගලයන් වැඩි වශයෙන් රෝගාතුර වී ඇත. (වගුව 13 බලන්න). මෙම දත්ත බෙදීයාම මගින් ආපදා තත්ත්වයන් තුළ සෞඛ්‍යමය අවදානමට ලක්වීමේ ස්ත්‍රී -පුරුෂ සමාජභාවීය ස්වභාවය මනාව පැහැදිලි කරයි; එනම් ස්ත්‍රීන් මූලික සුරැකුම් වගකීම් උරහිස දරාගෙන සිටින අතරතුරේදීම ඔවුන්ගේම සෞඛ්‍ය තත්ත්වය පිරිහීමට ලක්වන බව මෙයින් පෙනී යයි.

වගුව 13

**වැඩිපුරම රෝගාතුර වී ඇත්තේ කවුරුන්ද?**


| | ප්‍රතිශතය |
|---|---|
| **මම** | 32.7% |
| **දරුවන් (වයස අවුරුදු 18 ට අඩු)** | 26.5% |
| **වැඩිහිටියන් (වයස 18-59)** | 9.2% |
| **වැඩිහිටි පුද්ගලයන් (වයස 60 ට වැඩි)** | 11.2% |
| **ආබාධිත පුද්ගලයන් හෝ නිදන්ගත රෝගාබාධ සහිත පුද්ගලයන්** | 19.4% |
| **වෙනත්** | 1.0% |
| **නියැදිය** | 54 |

නියැදි ප්‍රමාණය 56ක් වන විට බහුලවම දක්නට ලැබුණු සෞඛ්‍ය ගැටලු වූයේ සමේ රෝග සහ ආසාදන වේ. (රූප සටහන 18 බලන්න). මෙය අත්විඳින ලද දේශගුණික විපර්යාස ආශ්‍රිත ආපදාවල ස්වභාවය සමඟ සමපාත වේ. මන්දයත් අධික තාපයේ සිට ගංවතුර දක්වා විවිධ තත්ත්වයන් යටතේ මෙවැනි රෝගී තත්ත්වයන් හටගන්නා බැවිනි. 2025 ජූලි මාසයේ දත්ත රැස් කරන අවස්ථාවේදී කොළඹ පදිංචි ස්ත්‍රියක් 2024 ගංවතුර කාලයේදී ඇයගේ පාදයේ හටගත් පළුදු වීම් පෙන්වා සිටියාය. 2024 වසරේ නැවත නැවතත් ගංවතුර ඇතිවීම හේතුවෙන් අපිරිසිදු ජලයට නිරන්තරයෙන් නිරාවරණය වීම නිසා එම පලුදුවීම මෙන්ම ඇයගේ පාදවල තිබූ තුවාල කිහිපයක් සුව නොවූ බව ඇය වැඩිදුරටත් පැහැදිලි කළාය. කෙසේ වෙතත් ඇයගේ ස්වාමිපුරුෂයා වෙනත් දිස්ත්‍රික්කයක රැකියාව කිරීම නිසාත් තම දෛනික රැකවරණ වගකීම් ඉටු කිරීමට වෙනත් සහායක් නොමැති වීම නිසාත් මූලික වෛද්‍ය ප්‍රතිකාරවලින් පසු වැඩිදුර වෛද්‍ය උපදෙස් ලබා ගැනීමට තමාට නොහැකි වූ බව ඇය පැවසුවා ය. අධික තාපය නිසා ඇතිවන සමේ පළුදු වීමක් ද නැවත නැවත ඇතිවන සෞඛ්‍ය ගැටලුවක් ලෙස ඉස්මතු වූ අතර මෙය විශේෂයෙන්ම කොළඹ සහ මොනරාගල දිස්ත්‍රික්කවලින් වාර්තා විය.

සමේ රෝග, ආසාදන සහ පළුදු වීම් වලට පසුව බහුලවම වාර්තා වූයේ උණ සහ ශ්වසන ආබාධයි මේවා සාමාන්‍යයෙන් තෙතමනය සහිත පරිසරයකට වැඩි කාලයක් නිරාවරණය වීම-අපිරිසිදු ජලය සහ අධික තාපය වැනි තත්ත්වයන් සමඟ සමීපව සම්බන්ධ වේ.


රූපසටහන 18

**අත්විඳින ලද සෞඛ්‍ය ගැටළු වර්ග**




රූපසටහන 19


**අත්විඳින ලද සෞඛ්‍ය ගැටලු වර්ග (දිස්ත්‍රික්ක අනුව වගුගත කිරීම)**



රෝගාබාධවල ව්‍යාප්තියට අමතරව දේශගුණික විපර්යාස ආශ්‍රිත ආපදාවලදී සහ ඉන් පසුව සෞඛ්‍ය සේවා ලබා ගැනීමේදී පවතින දැඩි බාධාවන් ද මෙම සොයාගැනීම් මගින් අනාවරණය විය. මුළු නියැදියෙන් 60% ක්ම සඳහන් කළේ තමන්ට සෞඛ්‍ය සේවා ලබා ගැනීමට හැකි වූ නමුත් එය ඉතා දුෂ්කර වූ බවයි. මෙම තත්ත්වය විශේෂයෙන්ම මොනරාගල සහ කොළඹ දිස්ත්‍රික්කවල බහුලව දක්නට ලැබුණි (රූප සටහන 20 බලන්න) ස්ත්‍රියකගෙන් 20%ක් වාර්තා කළේ තමන්ට කිසිසේත්ම සෞඛ්‍ය සේවා ලබා ගැනීමට නොහැකි වූ බවයි.

රූපසටහන 20

**සෞඛ්‍ය සේවා සඳහා ඇති ප්‍රවේශය (දිස්ත්‍රික්ක අනුව වගුගත කිරීම)**




සෞඛ්‍ය සේවා ලබා ගැනීමට ඇති බාධාවන්ට ප්‍රධාන වශයෙන් හේතු වූයේ ප්‍රවාහන සහ සංචලන දුෂ්කරතා වේග විශේෂයෙන්ම ගංවතුර කාලවලදී අවදානම් සහිත ප්‍රදේශවල ජීවත් වන ස්ත්‍රීන් පවසා සිටියේ ගංවතුරෙන් යටවූ ප්‍රදේශවලින් ඉවත් වීමට ප්‍රථමයෙන් නාවික හමුදා සහාය ලබා ගැනීමටත් ඉන් අනතුරුව පොදු ප්‍රවාහන සේවා වෙත මාරු වීමටත් සිදු වූ බවයිග මෙවැනි ගමන් බිමන් දෙපැත්ත කැපෙන අසීපතක් බඳුය; එනම් සෞඛ්‍ය ආධාර ලබා ගැනීම ප්‍රමාද වීම නිසා ප්‍රතිකාර අවශ්‍ය රෝගී තත්ත්වයන් තවදුරටත් උග්‍ර වන අතරම දැනටමත් ආපදා තත්ත්වයන් කළමනාකරණය කරමින් සිටින ස්ත්‍රීන් මත කායික, මානසික සහ මූල්‍යමය පීඩනයක් ද මෙයින් ඇති වේ.

කෙසේ වෙතත් මොණරාගල දිස්ත්‍රික්කයේ සංචලන බාධාවන් වෙනස් ආකාරයකින් දක්නට ලැබුණ ද ඒවායේ පවතින සීමාකාරී බව අඩු නොවීයග බලහරුව වැනි ප්‍රදේශවල පොදු ප්‍රවාහන සේවා හිඟකම හේතුවෙන් දිගු ගමන් බිමන්වලට මුහුණ දීමට සිදු වූ බව ප්‍රතිචාර දැක්වූවන් පැවසූහග මේ නිසා සෞඛ්‍ය සේවා ලබා ගැනීම මුළු දවසක්ම ගතවන කාර්යයක් බවට පත්වන අතර තම දෛනික කටයුතු අඛණ්ඩව කළ යුතු සහ කල් දැමිය නොහැකි  සුරැකුම් වැඩ මත පදනම් වී ඇති ස්ත්‍රීන්ට මෙය විශාල බාධාවක් වේ.

ප්‍රවාහන සහ සංචලන බාධාවන්ට පසුව ඇති තවත් ප්‍රධාන බාධාවක් වන්නේ කාලය කළමනාකරණය කර ගැනීමේ අපහසුවයි; එනම් නිවසේ පවතින වගකීම් සමූහය අතරතුර අවශ්‍ය සෞඛ්‍ය සේවා සඳහා කාලය වෙන් කිරීමේ අපහසුවයි. අහිතකර දේශගුණික තත්ත්වයකදී හෝ ආපදාවකදී සුරැකුම් කටයුතුවල නියැලීම යනු වැඩ බර සැලකිය යුතු ලෙස වැඩිවන සහ හදිසි කාර්යයක් බවට පත්වන අවස්ථාවකි. මේ නිසා ස්ත්‍රීන් වෛද්‍ය ප්‍රතිකාර සඳහා යෑමට ඇති ප්‍රමුඛතාවය අඩු කරන අතර සමහර අවස්ථාවලදී එය සම්පූර්ණයෙන්ම අතහැර දමයි. මෙයින් පිළිබිඹු වන්නේ රැකවරණය සහ ශ්‍රමය බෙදී යාමේදී පවතින ගැඹුරු ස්ත්‍රී -පුරුෂ සමාජභාවීය අසමානතාවයයි. එහිදී පවුලේ එදිනෙදා කටයුතු පවත්වාගෙන යාම වෙනුවෙන් ස්ත්‍රීන්ගේ සෞඛ්‍යය නිරන්තරයෙන්ම දෙවැනි තැනට පත් කෙරේ. පැවැත්ම උදෙසා කරනු ලබන ශ්‍රමය අතිශය හදිසි සහ අත්‍යවශ්‍ය වන මෙවැනි ආපදා කාලවලදී මෙවැනි කැපකිරීම් ප්‍රායෝගික සහ සාමාන්‍ය දෙයක් ලෙස සලකනු ලැබේ.

වගුව 14

**අහිතකර කාලගුණික තත්ත්වයන්හිදී සෞඛ්‍ය සේවා ලබා ගැනීමට බාධා පමුණුවන සාධක**

| | ප්‍රතිශතය |
|---|---|
| **රෝහල හෝ සායනය වෙත ප්‍රවේශ වීමට නොහැකි වීම** | 24.1% |
| **ප්‍රවාහන පහසුකම් නොමැතිකම** | 38.0% |
| **ප්‍රතිකාර හෝ ඖෂධ සඳහා අධික පිරිවැයක් දැරීමට සිදුවීම** | 10.1% |
| **නිවසේ වගකීම් සමඟ කාලය වෙන්කර ගැනීමේ අපහසුව** | 12.7% |
| **තොරතුරු හෝ දැනුවත්භාවය නොමැතිකම** | 3.8% |
| **වෙනත්** | 11.4% |
| **නියැදිය** | 60 |

සමස්තයක් ලෙස ගත් කල මූල්‍යමය බාධාවන් සහ සීමාවන් ද, සෞඛ්‍ය සේවා ලබා ගැනීමට බාධා පමුණුවන සාධක ලෙස සඳහන් විය. දේශගුණික විපර්යාසයක් හෝ ආපදාවක් සිදු වූ විට, විශේෂයෙන්ම ජීවනෝපායන්, දෛනික චර්යාවන් සහ නිවාස විනාශ වන අවස්ථාවල දී සෞඛ්‍ය මධ්‍යස්ථාන කරා යාම සහ රෝගී තත්ත්වයන්ට ප්‍රතිකාර ලබා ගැනීම් වැනි දෑ අවධානය යොමු කළ යුතු වඩාත් පුළුල් විනාශයන්ට සාපේක්ෂව ද්විතීයික කරුණු ලෙස සලකනු ලැබේ. 2016 ගංවතුරින් පසු රජයෙන් ලබාදුන් වන්දි මුදලක් තමාට ලැබුණු නමුත් ගංවතුරෙන් පසු තම පුතා දැඩි ලෙස රෝගාතුර වීම නිසා එම මුළු වන්දි මුදලම ඔහුගේ ඖෂධ සහ සුබසාධනය සඳහා වැය කිරීමට සිදු වූ බව කොළඹ පදිංචි ස්ත්‍රියක් පැවසුවා ය. 2016 ගංවතුරෙන් තම නිවසේ ජනේල බිඳී යාම සහ බිත්තිවලට සිදු වූ හානි ඇය පෙන්වා දුන් අතර ඒවා අලුත්වැඩියා කිරීමට තවමත් වත්කමක් නොමැති බව ඇය පැවසුවා ය. මෙයින් පැහැදිලි වන්නේ අවශ්‍යතාවයන් සහ අත්‍යවශ්‍යතාවයන්ගේ ප්‍රමුඛතාවය මත තීරණය වන අවදානම් සහගත බවේ විෂම චක්‍රයකි.

තවද සෞඛ්‍ය සේවා පවතින බවට දත්ත තිබුණද එම සේවාවන් අර්ථවත් ලෙස භාවිත කිරීමට ස්ත්‍රීන්ට ඇති හැකියාව අතර පැහැදිලි පරස්පරතාවක් පවතින බව දත්ත මගින් හෙළි වේ (විශේෂයෙන්ම දේශගුණික ආපදා සන්දර්භය තුළ). රජයේ රෝහල් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී සායන රජයේ බෙහෙත් ශාලා සහ ජංගම සායන පවා පුළුල් ලෙස පවතින බව වාර්තා වුව ද ප්‍රතිචාර දැක්වූවන් අතර ඒවා නිරන්තරයෙන් භාවිත කිරීම සීමිත මට්ටමක පවතී. විශේෂයෙන්ම පෞද්ගලික රෝහල් පිළිබඳ පහසුකම ප්‍රතිචාර දැක්වූවන්ගෙන් 60% කට තිබුණද ස්ත්‍රීන්ගේ 86%කට වඩා වැඩි පිරිසක් ඒවා ඉතා කලාතුරකින් භාවිත කරන හෝ කිසිසේත්ම භාවිත නොකරන බව වාර්තා විය. මෙයින් පෙනී යන්නේ දේශගුණික ආපදාවලින් පසුව පවතින අධික පිරිවැය සෞඛ්‍ය සේවා සඳහා ඇති ප්‍රධාන බාධාවක් බවයි (වගුව 15 බලන්න). එමෙන්ම ප්‍රතිචාර දැක්වූවන්ගෙන් 40%කට වඩා වැඩි පිරිසක් අහිතකර කාලගුණික තත්ත්වයන්හිදී කිසිදා ජංගම සායන භාවිත කර නොමැති බව පැවසූහ‍. මෙයින් ගම්‍ය වන්නේ එම සේවාවන් වෙත ප්‍රවේශ වීමේ සහ ව්‍යාප්ත වීමේ සීමාවන් පවතින බවත් විශේෂයෙන්ම වැඩිහිටියන් ආබාධිත පුද්ගලයන් සහ නිදන්ගත රෝගවලින් පෙළෙන්නන්ගේ සුවිශේෂී අවශ්‍යතා සමඟ එම සේවාවන් නිසි ලෙස නොගැලපෙන බවත් ය.

වගුව 15

**සෞඛ්‍ය සේවාවල පැවැත්ම සහ භාවිතය**

| | ඔබේ ප්‍රදේශයේ මෙම පහසුකම තිබේද? | | | ඔබේ ප්‍රදේශයේ මෙම පහසුකම තිබේද? | | | |
|---|---|---|---|---|---|---|---|
| | ඔව් | නැත | නොදනී | ඉතා නිතර | සමහර අවස්ථාවලදී | කලාතුරකින් | කිසිදාක නැත |
| **ඔබේ ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී සායනයක් හෝ රජයේ බෙහෙත් ශාලාවක් තිබේද?** | 81.7 | 15.0 | 3.3 | 10.2 | 16.3 | 38.8 | 34.7 |
| **ඔබේ ප්‍රදේශයේ රජයේ දිස්ත්‍රික් රෝහලක් -පළාත් ශික්ෂණ රෝහලක් හෝ ජාතික රෝහලක් තිබේද?** | 95.0 | 5.0 | 0 | 56.1 | 28.1 | 10.5 | 5.3 |
| **ඔබේ ප්‍රදේශයේ පෞද්ගලික රෝහල් තිබේද?** | 60.0 | 31.7 | 8.3 | 5.6 | 8.3 | 41.7 | 44.4 |
| **ඔබේ ප්‍රදේශයේ පෞද්ගලික බෙහෙත් ශාලාවක් තිබේද?** | 80.0 | 18.3 | 1.7 | 12.5 | 22.9 | 37.5 | 27.1 |
| **ආයුර්වේද වෛද්‍ය පහසුකම්** | 73.3 | 23.3 | 3.3 | 6.8 | 27.3 | 29.5 | 36.4 |
| **ඔබේ ප්‍රදේශයේ ජංගම සායනයක් තිබේද?** | 85.0 | 11.7 | 3.3 | 2.0 | 33.3 | 21.6 | 43.1 |



කොටස

# දේශගුණික විපර්යාස හමුවේ පවුලේ වියදම්

Colombo, Sri Lanka
Clogged drain prone to flooding during rainfall

අහිතකර කාලගුණික තත්ත්වයන් හේතුවෙන් පවුලේ අවශ්‍යතා සඳහා වැඩිපුර මුදලක් වැය කිරීමට සිදු වූයේ දැයි විමසූ විට ප්‍රතිචාර දැක්වූවන් 60 දෙනෙකුගෙන් 55 දෙනෙකුම එය ස්ථිර කරමින් (ඔව් යනුවෙන්) පිළිතුරු ලබා දුන්හ. එම මුදල් පහත සඳහන් අවශ්‍යතා සඳහා වැය කර ඇත:

**වගුව 16**

**දේශගුණික ආපදා කාලසීමාවන් තුළ සිදු වූ වියදම්**

| | ප්‍රතිශතය |
|---|---|
| **පානීය ජලය හෝ නිවසේ පරිභෝජනය සඳහා ජලය මිලදී ගැනීම** | 14.3% |
| **අමතර ආහාර ද්‍රව්‍ය** | 11.3% |
| **බෙහෙත් හෝ සෞඛ්‍ය වියදම්** | 22.6% |
| **ප්‍රවාහනය** | 14.3% |
| **නැතිවූ හෝ හානි වූ භාණ්ඩ වෙනුවට නව භාණ්ඩ ලබා ගැනීම** | 10.7% |
| **ආපදාව නිසා සිදු වූ හානි වෙනුවෙන් නිවස අළුත්වැඩියා කිරීම** | 10.1% |
| **ඉන්ධන -දර හෝ ගෑස් මිලදී ගැනීම** | 8.9% |
| **නිවසේ වැඩකටයුතු හෝ සුරැකුම් වැඩ වලට සහාය සඳහා යමෙකුට ගෙවීම් කිරීම** | 1.8% |
| **වෙනත්** | 6.0% |

ආපදාවෙන් පසු ලැබුණු වන්දි මුදල තම පුතාගේ ඖෂධ සඳහා වැය කිරීම නිසා  තවමත් ආපදාවෙන් සිදු වූ හානි සහිතව පවතින නිවසක් හිමි එම ස්ත්‍රියගේ උදාහරණයෙන් පැහැදිලි වන පරිදි දේශගුණික කම්පනයන් යනු හුදකලා සිදුවීම් නොවන බව නිගමනය කළ හැකිය. ඒවා එදිනෙදා ජීවිතයට විශේෂයෙන්ම සමාජ ප්‍රතිනිෂ්පාදනය සහ රැකවරණ ක්ෂේත්‍රයන්ට දැඩි ලෙස බලපාන  අඛණ්ඩව පවතින ආර්ථික පීඩනයන් වේ. පවතින අවදානම් ජාලයක් මත තවදුරටත් තීව්‍ර වන ආර්ථික අනාරක්ෂිතභාවය අසමානතා පද්ධතීන් තවදුරටත් ශක්තිමත් කරන අතර එමඟින් නිදහස සීමා කරයි. මොණරාගල වැනි කෘෂිකර්මාන්තය වැනි දේශගුණික තත්ත්වයන්ට සංවේදී අංශවල ජීවනෝපායන් අහිමි වූ විට හෝ විනාශ වූ විට පවුලේ පිරිමි සාමාජිකයන් විකල්ප රැකියා සහ ආදායම් මාර්ග සොයා නාගරික මධ්‍යස්ථාන කරා අභ්‍යන්තරව සංක්‍රමණය වෙති. මෙහිදී  දෛනික රැකවරණ වගකීම්වලට අමතරව ආපදා පසුකාලීන ප්‍රතිසංස්කරණ කටයුතු ඇතුළු විශාල වැටුප් රහිත ශ්‍රමයක නියැලීමට ස්ත්‍රීන්ට සිදු වේ (UNDP, 2024).

තවද මෙම දත්තවලින් ගම්‍ය වන්නේ දේශගුණික ආපදා යනු සහජයෙන්ම පවුල් මට්ටමින් සිදුවන ආර්ථික අවශෝෂණ යාන්ත්‍රණයක් බවයි.

මෙම වියදම් කළමනාකරණය කිරීමේදී ස්ත්‍රීන් සතු අසමාන වගකීම "එය බොහෝ විට යථා තත්ත්වයට පත්වීමේ ශ්‍රමය සහ පැවැත්ම සඳහා වන ශ්‍රමය යන දෙකම සමඟ බැඳී පවතී" පරිසරයට නිරාවරණය වීම මෙන්ම රැකවරණයේ ව්‍යුහාත්මක සංවිධානය සහ පරිභෝජනය මැදිහත් වීම හරහා දේශගුණික අවදානම නිර්මාණය වන ආකාරය හෙළිදරව් කරයි.

# පළාත් පාලන ආයතන නියෝජිතයන් සමඟ සම්මුඛ සාකච්ඡා:

ස්ත්‍රීන් 60 දෙනෙකුගෙන් රැස් කරන ලද දත්තවලින් ලද සොයාගැනීම් තහවුරු කර ගැනීමට සහ පහසුකම් සැලසීම සඳහා එක් දිස්ත්‍රික්කයකින් දෙදෙනෙකු බැගින් කොළඹ, ගම්පහ සහ මොණරාගල දිස්ත්‍රික්කවලින් පළාත් පාලන නියෝජිතයන් හය දෙනෙකු සම්මුඛ සාකච්ඡාවට ලක් කරන ලදී. දේශගුණික විපර්යාසයන්ට අදාළව පවතින ප්‍රතිපත්ති අයවැය ප්‍රතිපාදන, අනාගත වැඩසටහන් සහ සැලසුම් ආපදා කළමනාකරණය සහ ඇතුළත් කිරීමේ රාමුව ළිබඳව පළාත් පාලන නියෝජිතයන්ගෙන් විමසීම සඳහා විවෘත ප්‍රශ්නාවලියක් සකස් කරන ලදී. මෙම සම්මුඛ සාකච්ඡා 2025 ජූලි සිට සැප්තැම්බර් දක්වා දත්ත රැස් කිරීමට සමගාමීව පවත්වන ලද්දක් බව අවධාරණය කළ යුතුය. එබැවින් මෙහි ප්‍රකාශිත අදහස් 2025 නොවැම්බර් සහ දෙසැම්බර් මාසවල ඇති වූ ‘ඩිට්වා’ (Ditwah) සුළි කුණාටුවෙන් සිදු වූ විනාශය සහ විපත ඇතුළත් නොවේ.

සම්මුඛ සාකච්ඡාවට ලක් වූ පළාත් පාලන නියෝජිතයන් 6 දෙනාගෙන් 4 දෙනෙකු කාන්තාවන් වූ අතර 2 දෙනෙකු පිරිමි පුද්ගලයෝ වූහී නියෝජනය කළ දේශපාලන පක්ෂ:

- ජාතික ජන බලවේගය (NPP)፡ පළාත් පාලන නියෝජිතයන් 3 කි (කොළඹ සහ ගම්පහ)
- සමගි ජන බලවේගය (SJB)፡ පළාත් පාලන නියෝජිතයෙකු 1 කි (කොළඹ සහ ගම්පහ)
- ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ (SLPP)፡ පළාත් පාලන නියෝජිතයෙකු 1 කි (මොණරාගල)
- එක්සත් ජාතික පක්ෂය (UNP)፡ පළාත් පාලන නියෝජිතයෙකු 1 කි (මොණරාගල)

## තේමාත්මක විශ්ලේෂණය

### 1. දේශගුණික අවදානම දේශපාලනික නොවන කරුණක් ලෙස සැලකීම

කොළඹ සහ මොණරාගල දිස්ත්‍රික්කවල දේශගුණික විපර්යාසයන් ප්‍රධාන වශයෙන් දකිනු ලැබුවේ, ”සිදුවීම් පාදක කරගත් පාලන” දෘෂ්ටිකෝණයකිනි. එහිදී අහිතකර කාලගුණික තත්ත්වයන් හුදෙක් කලින් සිදුවූ වරින් වර සිදුවන සිදුවීම් ලෙස සලකන අතර පළාත් පාලන නියෝජිතයන් 6 දෙනාගෙ න් 3 දෙනෙකුම ගංවතුර සහ නියඟය “ස්වභාවික විපත්” ලෙස හැඳින්වූහ. මෙහිදී වගකීම බැහැර කිරීමේ ප්‍රවණතාවක් ද දක්නට ලැබුණි. විශේෂයෙන්ම කොළඹ නියෝජිතයන් පවසා සිටියේ ගංවතුර ඇතිවීමට හේතුව කාණු පද්ධති අවහිර කිරීම- නිසි ලෙස අපද්‍රව්‍ය බැහැර නොකිරීම වැනි මහජනතාවගේ පුද්ගලික ක්‍රියාකලාපයන් බවයි. මෙලෙස යටිතල පහසුකම් නොසලකා හැරීම සහ අසමතුලිත අවිධිමත් සංවර්ධනයේ බලපෑම වසා දමනු ලබයි. මෙය දේශගුණික සාක්ෂරතාවය සහ දැනුවත්භාවය නොමැතිකම වැනි විවිධ සාධක නිසා ඇති වූවක් වන අතර ‘සෘතුමය‘ සහ ‘ස්වභාවික විපත්‘ දේශගුණික ආපදා සමඟ පටලවා ගැනීමෙන් එය මනාව පැහැදිලි වේග

### 2. ප්‍රතික්‍රියාශීලී ආපදා කළමනාකරණය

දිස්ත්‍රික්ක තුනේම දේශීය දේශගුණික පාලනය ප්‍රධාන වශයෙන් සංලක්ෂිත වන්නේ ප්‍රතික්‍රියාශීලී ආපදා කළමනාකරණ ආකෘතියකිනිග එනම්, ආයතනික ධාරිතාව හෝ දේශපාලන අවධානය යොමු වන්නේ ආපදාවකට පෙර සූදානම් වීම හෝ එය අවම කිරීම කෙරෙහි නොව ආපදාවක් අතරතුර හෝ ඉන් පසුව කෙරෙන කළමනාකරණ කටයුතු කෙරෙහි පමණිග කොළඹ සහ ගම්පහ නියෝජිතයන් ඒකමතිකව ප්‍රකාශ කළේ ආපදාවකට පෙර ගත හැකි ක්‍රියාමාර්ග අනතුරු ඇඟවීමේ සහ තොරතුරු පද්ධතිවලට පමණක් සීමා වන බවයි.

සහන පියවරයන් ආහාර ආධාර (බත් පාර්සල්) සහ තාවකාලික නවාතැන් වලට සීමා වූ අතර කාණු පද්ධති වැඩිදියුණු කිරීම- තිරසාර යටිතල පහසුකම් වැනි අනුවර්තන ක්‍රියාමාර්ග හුදෙක් අපේක්ෂාවන් පමණක් බව හෝ ඒවා සිදු කළ හැක්කේ දරුණු ආපදා අවස්ථාවලදී පමණක් බව ප්‍රකාශ වියී එසේ වුවද තම කොට්ඨාස ආරක්ෂා කිරීමට මෙම ක්‍රියාවලීන් ප්‍රමාණවත් නොවන බව නියෝජිතයෝ පිළිගත්හග ඔවුන් මෙම ක්‍රමවේදයන්හි අසාර්ථකත්වය පටවනු ලැබුවේ අයවැය සීමාවන් සහ අතිශය නිලධාරිවාදී ක්‍රියාමාර්ග මතය.

### 3. විශ්වීය අවදානම් ආඛ්‍යාන

සම්මුඛ සාකච්ඡාවලදී මතු වූ ප්‍රධාන මතයක් වූයේ දේශගුණික ආපදා “සැමට එක හා සමානව” බලපාන බවයිග මේ හේතුවෙන් ස්ත්‍රීන් ළමුන්, වැඩිහිටියන් සහ ආබාධිත පුද්ගලයන් වැනි අතිශය අවදානමට ලක්විය හැකි පිරිස් සඳහා ඉලක්කගත ප්‍රතිපාදන වෙන් කිරීමක් සිදු නොවේග මෙම “ සැමට සමානයි” යන මතය නිසා එක් එක් පුද්ගල කණ්ඩායම් ආපදාවන්ට නිරාවරණය වන ආකාරයේ පවතින වෙනස්කම් සහ ඔවුන්ගේ ඔරොත්තු දීමේ හැකියාවන්හි පවතින වෙනස්කම් යටපත් වී යයි.

ගංවතුර ජලයේ ගමන් කළ හැක්කේ පිරිමි අයට සහ පිරිමි ළමයින්ට පමණක්ය යන අදහස වැනි (ගම්පහ නියෝජිතයෙකු පැවසූ පරිදි) ස්ත්‍රී පුරුෂ සමාජභාවීය පූර්ව නිගමනයන් මෙහිදී මතු වූ අතර, රැකවරණය ආශ්‍රිත අවදානම් පිළිබඳව සැලකිල්ලක් නොදැක්වුණි. නියඟය නිසා ඇතිවන රැකියා වියුක්තිය වැනි කරුණුවලදී ස්ත්‍රීන්ට වැඩි බලපෑමක් ඇති වන බව නියෝජිතයන් පිළිගත් අවස්ථාවලදී පවා එම අවබෝධය අයවැය හෝ ආපදා ප්‍රතිචාර වෙත ගෙන යාමට ඔවුන් අපොහොසත් වී ඇත.

**4. මූල්‍ය අනාරක්ෂිතභාවය සහ පළාත් පාලන ව්‍යුහයන්ගේ සීමාවන්**

පළාත් පාලන ආයතන සතු මූල්‍ය සහ පරිපාලනමය අනාරක්ෂිතභාවය තවත් ප්‍රධාන තේමාවකි. අයවැය ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවන බව නියෝජිතයෝ පැවසූහ. තවද කොළඹ නියෝජිතයන් පවසා සිටියේ අයවැය තීරණ ගැනීමේ ක්‍රියාවලියේ පවතින අපැහැදිලි බව සහ මුදල් වැය කිරීමේ සීමිත අධිකාරියක් තමන් සතු වන බවයි. මොණරාගල දිස්ත්‍රික්කයේ දී මෙම මූල්‍ය සීමාවන් ළමා සුරැකුම් මධ්‍යස්ථාන වැනි සමාජ යටිතල පහසුකම්වලට ප්‍රමුඛතාවය නොදීමට සෘජුවම බලපා ඇත. මෙය ස්ත්‍රීන්ට වැටුප් ලබන කෘෂිකාර්මික රැකියා සඳහා යොමු වීමට ඇති බාධාවක් බව නියෝජිතයෙකු පෙන්වා දුන්නේ ය. ස්ත්‍රීවාදී දේශපාලන ආර්ථික විද්‍යා දෘෂ්ටිකෝණයකින් බලන කල, පවුල්වල සහ ප්‍රජාවන්ගේ ඔරොත්තු දීමේ හැකියාවට රැකවරණ සේවා සහාය දෙන යටිතල පහසුකම් මධ්‍යගත කාර්යභාරයක් ඉටු කළ ද ඒවා ක්‍රමානුකූලව දේශගුණික අයවැයෙන් බැහැර කර ඇති ආකාරය මෙයින් හෙළි වේ.

**5. දේශපාලන පක්ෂග්‍රාහීත්වය සහ හිමිකම්වල අවිනිශ්චිතතාව**

මොණරාගල සහ ගම්පහ දිස්ත්‍රික්ක වල ආපදා සහන සහ සහයෝගය ලබා ගැනීමේදී දේශපාලන පක්ෂ සම්බන්ධතාවය බලපාන බවට පැහැදිලිවම පිළිගැනීමක් තිබුණි. සහන බෙදා හැරීම යම් දේශපාලන පක්ෂයකට හිතවත් පුද්ගලයන්ට සහ නිවෙස්වලට ප්‍රමුඛතාවය දෙමින් සිදු වන ආකාරය නියෝජිතයන් මෙන්ම දත්ත රැස් කිරීමේදී සහභාගී වූවන් ද පෙන්වා දුන්හ. මේ අනුව ආධාර බෙදා හැරීම අයිතිවාසිකම් මත පදනම් වූ ක්‍රියාවලියකට වඩා දේශපාලන ගනුදෙනුවක් බවට පත් වී ඇත. තාක්ෂණික වශයෙන් ගත් කල මෙය අවශ්‍යතා මත පදනම් වූ ඉලක්කගත කිරීම් දුර්වල කරන අතර සහන ලබා දීමේදී පද්ධතිමය පක්ෂග්‍රාහීත්වයක් ඇති කරයි.

# නිගමනය

මෙම අධ්‍යයනයේ සොයාගැනීම් මගින් පෙන්නුම් කරන්නේ උග්‍රවන දේශගුණික අර්බුද හමුවේ 'වැටුප් රහිත සුරැකුම් වැඩ' යනු අතුරු කරුණක් නොව දේශගුණික ක්‍රියාකාරකම් අනුවර්තනය සහ අවම කිරීම සම්බන්ධයෙන් පවතින ප්‍රවේශයන්හි සීමාවන් සහ අඩුපාඩු හෙළිදරව් කරන මූලික පදනමක් බවයි. දේශගුණික විපර්යාස සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී 'කිසිවෙකුත් මග නොහැරීම' යන මූලධර්මය සපුරා ගැනීමට නම්, වැටුප් රහිත සුරැකුම් වැඩ ශ්‍රමය කෙරෙහි අවධානය යොමු කිරීම සහ එය කේන්ද්‍රගත කර ගැනීම අත්‍යවශ්‍ය වේ. මෙම වාර්තාව පුරා පෙන්නුම් කළ පරිදි දේශගුණික බලපෑම් අවම කිරීම සහ අනුවර්තනය වීම දේශගුණික යුක්තිය සහ අර්ථවත් ඔරොත්තු දීමේ මූලධර්ම මත පදනම් විය යුතුය; එසේ නොවුවහොත් දේශගුණික ක්‍රියාමාර්ග මගින් පවතින සමාජ හානි සහ අසමානතාවයන් තවදුරටත් ශක්තිමත් වීමේ අවදානමක් පවතී.

නාගරික, අර්ධ නාගරික සහ ග්‍රාමීය සන්දර්භයන් තුළ පොදු යටිතල පහසුකම් විධිමත් සුරකුම් සේවා සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවී දේශගුණික ක්‍රියාමාර්ග ප්‍රමාණවත් නොවන තැන්වලදී ස්ත්‍රීන් තම කාලය, ශ්‍රමය සහ ශරීරය කැප කරමින් පවුල් සහ ප්‍රජාවන් ආරක්ෂා කරන "කම්පන අවශෝෂකයන්" ලෙස කටයුතු කරති. සායන වෙත ප්‍රවේශ වීමට නොහැකි වූ විට නිවසේදීම වෛද්‍ය ප්‍රතිකාර ලබා දීම හෝ වැඩි දුරක් ගොස් ජලය රැගෙන ඒම වැනි වගකීම් ඉටු කිරීම හරහා කාන්තාවන් දේශගුණික ආපදාවල පිරිවැය ප්‍රායෝගිකව සහනාධාරයක් ලෙස දරන බව මෙම අධ්‍යයනය පෙන්වා දෙයි. මෙම අදෘශ්‍යමාන ආරක්ෂක ජාලය නිසා රජයට ක්‍රියාශීලී ප්‍රවේශයකට වඩා ප්‍රතික්‍රියාශීලී ආපදා කළමනාකරණ ආකෘතියක් පවත්වාගෙන යාමට ඉඩ සැලසී ඇත. දේශගුණික කම්පනයන්ගේ වාර ගණන කාලසීමාව සහ බලපෑම තීව්‍ර වන විට ස්ත්‍රීන්ගේ වැටුප් රහිත සුරැකුම් ශ්‍රමය සඳහා ඇති ඉල්ලුම ද ඉහළ යන අතර එමඟින් බොහෝ ස්ත්‍රීන් දැඩි 'කාල දරිද්‍රතාවයකට' සහ ආර්ථික අනාරක්ෂිතභාවයකට ඇද දැමේ. දේශගුණික ආපදා යනු පවුල් මට්ටමින් සිදුවන ආර්ථික ශෝෂණ යාන්ත්‍රණයකි. ආපදා හේතුවෙන් ඇතිවන සෞඛ්‍ය වියදම් පියවීමට හෝ ගංවතුරෙන් විනාශ වූ මැටි රෝද වැනි උපකරණ ප්‍රතිස්ථාපනය කිරීමට කාන්තාවන්ට සිදු වූ විට ඔවුන් ඇත්ත වශයෙන්ම තම සීමිත ප්‍රාග්ධනයෙන් සහ කාලයෙන් 'දේශගුණික බද්දක' ගෙවමින් සිටිති. මෙම චක්‍රය ග්‍රාමීය ස්ත්‍රීන් අතර දැනටමත් පවතින 'ණය උගුල' තවදුරටත් ගැඹුරු කරයි.

සුරැකුම් සේවාව මෙතරම් වැදගත් වුව ද දේශගුණික අනුවර්තන සැලසුම්, ආපදා සූදානම කම්කරු ප්‍රතිපත්ති සහ ජාතික ගිණුම්කරණ රාමු තුළ එය ක්‍රමානුකූලව අදෘශ්‍යමාන මට්ටමක පවතී. මෙම අදෘශ්‍යමානභාවය හානිකර නොවන එකක් නොවේ; එය දේශගුණික බිඳවැටීමේ පිරිවැය ස්ත්‍රීන්ගේ වැටුප් රහිත ශ්‍රමය මතට පටවන අතර එමඟින් ස්ත්‍රී පුරුෂ අසමානතාවය නැවත ඇති කරමින් අනුවර්තන ප්‍රයත්නයන්ගේ තිරසාරභාවයට බාධා පමුණුවයි. වෙනත් වචනවලින් කිවහොත් ස්ත්‍රීන් හඳුනා නොගත් සහ සහනයක් නොලැබූ සුරැකුම් ශ්‍රමය මත රඳා පවතින දේශගුණික ප්‍රතිචාරයක් යනු යුක්තිසහගත හෝ ඔරොත්තු දෙන එකක් නොව එය අවශෝෂණාත්මක එකකි. "ආපදා සියලු පුරවැසියන්ට එක හා සමානව බලපායි" යන පළාත් පාලන ආයතනවල 'විශ්වීය' ආඛ්‍යානය ප්‍රතිපත්තිමය වශයෙන් පවතින දුර්වලතාවයකි. ගංවතුරක් මුළු ගම්මානයකටම බලපෑ හැකි වුවද ආබාධිත දරුවෙකු රැකබලා ගන්නා ස්ත්‍රියකට යථා තත්ත්වයට පත්වීමට ගතවන කාලය වැඩි බවත් නියඟය පවතින කාලවලදී පවුල පෝෂණය කිරීම සඳහා ආහාර නොගෙන සිටින මවකගේ පෝෂණ ඌනතාවය වැඩි බවත් දත්ත මගින් සනාථ වේ.

ස්ත්‍රීන් තමන්ට 'විවේකයක්' ඇති බව වාර්තා කරන විට පවා එය බොහෝ විට සුරැකුම් අවශ්‍ය අය වෙනුවෙන් නිරන්තරයෙන් සූදානමින් සිටිය යුතු අවස්ථාවකි. මෙම 'සෑම විටම සූදානමින් සිටින' තත්ත්වය නිසා ස්ත්‍රීන්ට කුසලතා වර්ධනය කර ගැනීමට හෝ දේශපාලනික සහභාගීත්වයට ඇති අවස්ථාව අහිමි වේ. එබැවින් දේශගුණික ප්‍රතිපත්ති මගින් කායික වැඩ බර පමණක් නොව පවුලේ පැවැත්ම කළමනාකරණය කිරීමේ මානසික සහ චිත්තවේගීය බර ද අඩු කළ යුතු බව පැහැදිලි ය.

වැදගත්ම කරුණ නම් දේශගුණික විපර්යාස පිළිබඳ ස්ත්‍රියකගේ අත්දැකීම් සහ සුරැකුම් වගකීම් ඒකාකාර නොවන බව මෙම වාර්තාව පෙන්වා දීමයි. කොළඹ සහ ගම්පහ ගංවතුර සහ නාගරික තාපය, මොණරාගල නියඟය සහ ජල හිඟය, ආබාධිතභාවය ආශ්‍රිත රැකවරණය අවිධිමත් ජීවනෝපායන් සහ විස්තීර්ණ පවුල් වගකීම් වැනි විවිධ සාධක එකිනෙක මුණගැසෙමින් විවිධාකාර සහ සංකීර්ණ අවදානම් නිර්මාණය කරයි. මෙම සොයාගැනීම් මගින් ස්ත්‍රීන්ගේ සැබෑ අත්දැකීම් පාදක කරගත් යුක්තිසහගත සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවී දේශගුණික ප්‍රතිපත්තිවල හදිසි අවශ්‍යතාවය මතු

කරයි. දේශගුණික විපර්යාස සන්දර්භය තුළ හුදෙක් හඳුනාග ැනීම පමණක් ප්‍රමාණවත් නොවේ. සුරැකුම් ශ්‍රමය අඩු කිරීමට සහ ප්‍රතිව්‍යාප්තියට, සුරැකුම් වැඩ සඳහා යටිතල පහසුකම් ව්‍යාප්ත කිරීමට සහ ප්‍රතිපත්ති සම්පාදනයේදී ස්ත්‍රීන්ට අර්ථවත් නියෝජනයක් ලබා දීමට නිශ්චිත පියවර නොගතහොත් මෙම පිළිගැනීම හුදු සංකේතාත්මක එකක් බවට පත්වනු ඇත.

එබැවින් මෙම අධ්‍යයනය තීරණාත්මක යෝජනාවක් ඉදිරිපත් කරයි: එනම් ශ්‍රී ලංකාවේ දේශගුණික අනුවර්තන සහ යුක්තිසහගත සංක්‍රාන්ති මාවත සාර්ථක වීමට නම් 'වැටුප් රහිත සුරැකුම් ශ්‍රමය' එහි කේන්ද්‍රයෙහි තැබිය යුතු බවයි. දේශගුණික ඔරොත්තු දෙන යටිතල පහසුකම්, නවීන තාක්ෂණය අනතුරු ඇඟවීමේ පද්ධති සහ ජීවනෝපාය විවිධාංගීකරණය සඳහා කෙරෙන ආයෝජනයන් සමඟින් පොදු රැකවරණ සේවා ආබාධිත, ඇතුළත් ආපදා කළමනාකරණය සහ අවිධිමත් සේවකයන් සඳහා වන සමාජ ආරක්ෂණය වෙනුවෙන් ද සමාන්තරව ආයෝජනය කළ යුතුය. රැකවරණය යනු ස්ත්‍රීන් විසින් දරනු ලබන පෞද්ගලික වගකීමක් ලෙස නොව දේශගුණික අවිනිශ්චිතතාවයක් පවතින යුගයක සාමූහික පැවැත්ම සඳහා අත්‍යවශ්‍ය 'පොදු යහපතක්' ලෙස අවබෝධ කර ගත යුතුය. මෙම නියමු ව්‍යාපෘතිය මගින් දේශගුණය සහ රැකවරණය අතර පවතින සබඳතාවය පිළිබඳව වඩාත් පුළුල් හා ජාතික මට්ටමේ පර්යේෂණවල අවශ්‍යතාවය වෙනුවෙන් ප්‍රබල සාක්ෂි සපයයි.

අවසාන වශයෙන් මෙම සොයාගැනීම් මගින් ස්ත්‍රීන්ගේ භූමිකාව හුදෙක් සංකේතාත්මකව පිළිගැනීමෙන් ඔබ්බට යාමට බල කරයි. සාමූහික ළමා සුරැකුම් මධ්‍යස්ථාන හෝ ප්‍රවේශ විය හැකි ජල පද්ධති වැනි දේශගුණික ඔරොත්තු දෙන රැකවරණ යටිතල පහසුකම් සඳහා රාජ්‍ය ආයෝජනයන් නොමැතිව ශ්‍රී ලංකාවේ දේශගුණික අනුවර්තන ක්‍රියාවලිය ස්ත්‍රීන්ගේ වැටුප් රහිත ශ්‍රමය මත පදනම් වූ අසමතුලිත ක්‍රියාවලියක් ලෙසම පවතිනු ඇත.

# සාමාන්‍ය නිර්දේශ

මෙම අධ්‍යයනයේ සොයාගැනීම් පාදක කරගනිමින් සහ ගෝලීය '5' රාමුවට අනුකූලව පහත සඳහන් නිර්දේශ ඉදිරිපත් කරනු ලැබේ:

### හඳුනා ගැනීම

- සුරැකුම් වැඩ වල අසමානතාවයන් දෘශ්‍යමාන කිරීම: ස්ත්‍රී පුරුෂ සමාජභාවී සම්මතයන් සහ සමාජ ප්‍රතිනිෂ්පාදන ක්‍රියාවලිය දෘශ්‍යමාන කළ යුතුය. එමගින් දේශගුණික විපර්යාස මැදිහත්වීම් හරහා රැකබලා ගන්නන්ගේ කාලය හෝ වගකීම් තවදුරටත් වැඩි වී අසමානතාවයන් උග්‍ර වීම වැළැක්විය හැකිය.
- ප්‍රතිපත්තිමය පිළිගැනීම: ජාතික අනුවර්තන සැලැස්ම (NAP) ජාතික මට්ටමින් තීරණය කරන ලද දායකත්වය (NDCs) සහ දේශගුණික විපර්යාස පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය තුළ 'වැටුප් රහිත සුරැකුම් වැඩ සහ ගෘහස්ථ වැඩ' යනු අත්‍යවශ්‍ය දේශගුණික ශ්‍රමයක් ලෙස නිල වශයෙන් පිළිගත යුතුය.
- පවතින රාමු සංශෝධනය කිරීම: 2005 අංක 13 දරන ආපදා කළමනාකරණ පනත ඇතුළු වත්මන් රාමු සංශෝධනය කරමින් ස්ත්‍රීන්, ළමුන් වැඩිහිටියන් සහ ආබාධිත පුද්ගලයන් සඳහා වූ නිශ්චිත සහ ක්‍රියාකාරී නිර්දේශ ඇතුළත් කළ යුතුය.
- පෙරමුණේ ක්‍රියාකාරීන් ලෙස පිළිගැනීම: ස්ත්‍රීන් දේශගුණික ආපදාවල 'අක්‍රිය වින්දිතයන්' ලෙස නොව දේශගුණික ප්‍රතිචාර දැක්වීමේ සහ අනුවර්තනය වීමේ පෙරමුණේ සිටින ක්‍රියාකාරීන් ලෙස හඳුනාගත යුතුය.
- පාරිසරික සුරැකුම් ශ්‍රමය අර්ථ දැක්වීම: පවුලේ සතුන් රැකබලා ගැනීම, ගෙවතු වගාව සහ දේශීය පරිසර පද්ධති රැකබලා ගැනීම සඳහා ස්ත්‍රීන් දරන වැටුප් රහිත සුරැකුම් ශ්‍රමය හඳුනා නොගත් ශ්‍රම කාණ්ඩයක් ලෙස නිල වශයෙන් අර්ථ දැක්විය යුතුය.
- චිත්තවේගීය බර පිළිගැනීම: දේශගුණික විපර්යාස නිසා ඇතිවන කාංසාව සහ ආපදා අවස්ථාවල පවුලේ පැවැත්ම කළමනාකරණය කිරීමේ මානසික පීඩනය සුරැකුම් බරෙහි කොටසක් ලෙස හඳුනාගත යුතුය.
- දත්ත පද්ධති ශක්තිමත් කිරීම: දේශගුණික ආපදා අතරතුර සහ ඉන් පසුව කාලය භාවිතය සෞඛ්‍ය බලපෑම් සහ ආබාධිත සුරැකුම් වැඩ පිළිබඳ ස්ත්‍රී පුරුෂ සමාජභාවය අනුව වෙන් කරන ලද දත්ත රැස් කිරීම ක්‍රමවත් කළ යුතුය.
- යටිතල පහසුකම් සංවර්ධනය, නාගරික සැලසුම්කරණය, බලශක්ති සංක්‍රාන්තිය සහ දේශගුණික මැදිහත්වීම් ව්‍යාපෘති සඳහා සිදුකරනු ලබන ඇගයීම් ද ඇතුළුව දේශගුණික අවදානම් සහ බලපෑම් ඇගයීම් සඳහා 'නොගෙවන සත්කාරක සේවාවන්' ඒකාබද්ධ කිරීම.

### අවම කිරීම

- ශ්‍රමය සහ කාලය ඉතිරි කරන තාක්ෂණය: පිරිසිදු බලශක්ති මුළුතැන්ගෙයි විසඳුම්, ජල සහ කාණු පද්ධති යටිතල පහසුකම් වැනි තාක්ෂණයන් ලබා දීම මගින් දේශගුණික බලපෑම් අවම කරන අතරම සුරැකුම් වැඩ බර ද අඩු කළ හැකිය.
- තොරතුරු ප්‍රවේශය පුළුල් කිරීම: රැකබලා ගන්නන්, අවිධිමත් සේවකයන් සහ යැපෙන්නන් සිටින නිවෙස් වෙත පහසුවෙන් ප්‍රවේශ විය හැකි දේශගුණික තොරතුරු සහ පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධති ස්ථාපිත කළ යුතුය.
- සංචලන සීමාවන්ට ගැළපෙන පද්ධති: පූර්ව අනතුරු ඇඟවීමේ සහ හදිසි මෙහෙයුම් පද්ධති සැලසුම් කිරීමේ දී රැකවරණ වගකීම් නිසා ඇතිවන කාල දරිද්‍රතාවය සහ සංචලන සීමාවන් සැලකිල්ලට ගත යුතුය.
- අනුවර්තන සමාජ ආරක්ෂණය: ආපදාවකදී ස්වයංක්‍රීයව සහ කාර්යක්ෂමව සහාය ලබා දීම සඳහා සුබසාධන දත්ත පද්ධති දේශගුණික දත්ත සමඟ සම්බන්ධ කළ යුතුයි මෙය මුදල් ආධාර, ආහාර සහ ඖෂධ ලබා දීමේදී ස්ත්‍රී පුරුෂ සමාජභාවී අවශ්‍යතාවලට සංවේදී විය යුතුය.
- පහසුකම්වල ප්‍රමුඛතාවය: ආපදාවලින් පසු ඇතිවන තත්ත්වයන් (අපිරිසිදු සනීපාරක්ෂාව, ප්‍රවේශ විය නොහැකි නවාතැන්) නිසා වැටුප් රහිත රැකවරණ බර තවදුරටත් වැඩි නොවන බවට වගබලා ගත යුතුය.
- අසමතුලිත සනීපාරක්ෂක පහසුකම්, ප්‍රවේශ විය නොහැකි ආරක්ෂිත මධ්‍යස්ථාන ප්‍රමාණවත් නොවන සමාජ ආරක්ෂණයන් හෝ ළමා සත්කාර සහ ආබාධිත සහාය නොමැතිකම හේතුවෙන් ආපදා පසුකාලීන තත්ත්වයන් තුළ 'වැටුප් රහිත සුරැකුම් බර' ඉහළ නොයන බව සහතික කරමින් ආපදා සූදානම සහ ප්‍රතිචාර සැලසුම් සඳහා සත්කාරක අවශ්‍යතාවයන් පිළිබඳ කරුණු ඒකාබද්ධ කිරීම.

- දේශගුණික විපර්යාස එහි ප්‍රවණතා සෞඛ්‍ය අවදානම් සම්පත් පරිහරණය සහ ප්‍රතිචාර දැක්වීමේ විකල්ප පිළිබඳ පැහැදිලි සහ අදාළ තොරතුරු සපයන ප්‍රවේශ විය හැකි සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවී අවශ්‍යතාවලට සංවේදී වූ 'දේශගුණික සාක්ෂරතා' වැඩසටහන් ප්‍රමුඛතා පදනමින් ක්‍රියාත්මක කිරීම; එමඟින් අවධිමත් දැනුම තාවකාලික තීරණ ගැනීම් අවශ්‍යතාවය මත පදනම් වූ අනුවර්තනයන් සහ වැටුප් රහිත පූර්ව සූදානම් ශ්‍රමය මත ස්ත්‍රීන් රඳා පැවතීම අවම කිරීම.

## ප්‍රතිව්‍යාප්තිය

- සමාජ සම්මතයන් වෙනස් කිරීම: සුරැකුම් වැඩ වගකීම ස්ත්‍රීන්ගේ පමණක් වගකීමක් ලෙස සලකන සංස්කෘතික ආකල්ප සහ සම්මතයන් අභියෝගයට ලක් කරන ප්‍රජා මට්ටමේ මැදිහත්වීම් සිදු කළ යුතුය.
- පිරිමි සහ පිරිමි ළමයින් සම්බන්ධ කර ගැනීම: සුරැකුම් වැඩ ශ්‍රමය බෙදාගත් වගකීමක් ලෙස ප්‍රවර්ධනය කිරීමට පිරිමි පාර්ශවය සම්බන්ධ කර ගත යුතුය.
- රජයේ සුරැකුම් සේවා ස්ථාපිත කිරීම: දේශගුණික අවදානම් සහිත දිස්ත්‍රික්කවල ආබාධිත අන්තර්කරණය සහ දේශගුණික ඔරොත්තු දෙන ළමා සුරැකුම් සහ වැඩිහිටි සුරැකුම් මධ්‍යස්ථාන රජය මැදිහත් වී ස්ථාපිත කළ යුතුය.
- සුරැකුම් මධ්‍යස්ථාන දේශගුණික විපර්යාසයන්ට ඔරොත්තු දෙන අයුරින් පවතින බව සහතික කිරීම, ආපදා අවස්ථාවලදී ඒවා වෙත ප්‍රවේශ වීමේ හැකියාව තහවුරු කිරීම සහ එම මධ්‍යස්ථාන ඉවත් කිරීමේ සහ සහන සැලසීමේ සැලසුම් සමඟ ඒකාබද්ධ කිරීම.
- දේශගුණික මූල්‍ය ප්‍රතිපාදන: දේශගුණික අරමුදල් මගින් සුරැකුම් වැඩ වලට යටිතල පහසුකම් සහ සමාජ සේවා සඳහා සෘජුවම ප්‍රතිපාදන වෙන් කළ යුතුය.
- මුදල් ආධාර සෘජුවම ලබා දීම: සමාජ ආරක්ෂණ ගෙවීම් (මුදල් හෝ වවුචර) සෘජුවම ස්ත්‍රීන් වෙත ලබා දිය යුතු අතර එය "ස්ත්‍රීන් පමණක් නිවසේ වියදම් කළමනාකරණය කළ යුතුය" යන මතය තහවුරු නොවන පරිදි ප්‍රජා වැඩසටහන් සමඟ ඒකාබද්ධ කළ යුතුය.

## නියෝජනය

- තීරණ ගැනීමේ අවකාශයන්හි නියෝජනය: අවිධිමත් සේවකයන්, වැටුප් රහිත සුරැකුම්කාරකවරයන් සහ ආබාධිත කාන්තාවන් දේශීය, දිස්ත්‍රික් සහ ජාතික මට්ටමේ දේශගුණික තීරණ ගැනීමේ මණ්ඩලවල අර්ථවත් ලෙස නියෝජනය වන බව සහතික කළ යුතුය.
- උපදේශන යාන්ත්‍රණ: සම්ප්‍රදායික ක්‍රමවලින් ඔබ්බට ගොස්, දේශගුණික ප්‍රමුඛතා, සම්පත් බෙදා හැරීම සහ ආර්ථික නොවන අවශ්‍යතා තක්සේරු කිරීමට ස්ත්‍රීන්ට අවස්ථාව සලසන උපදේශන යාන්ත්‍රණයන් ආයතනික ගත කළ යුතුය.

## ප්‍රතිචාර දැක්වීම

- ප්‍රවේශ විය හැකි නවාතැන්: ඉවත් කිරීමේ ක්‍රියාවලීන් සහ තාවකාලික නවාතැන් මධ්‍යස්ථාන ආබාධිත පුද්ගලයන්ට ප්‍රවේශ විය හැකි ස්ත්‍රී, පුරුෂ සමාජභාවයට සංවේදී සහ රැකවරණ අවශ්‍යතාවලට සහාය විය හැකි පහසුකම්වලින් සමන්විත විය යුතුය.
- තිරසාර යථා තත්ත්වයට පත් කිරීම: කෙටි කාලීන සහනවලින් ඔබ්බට ගොස් දිගුකාලීන සුරැකුම් වැඩ බර අඩු කරන සහ නැවත නැවතත් අවදානමට ලක්වීම වළක්වන තිරසාර ප්‍රතිසාධන යාන්ත්‍රණයන් හඳුන්වා දිය යුතුය.
- විශේෂ ප්‍රතිසාධන ප්‍රදාන: පවුලේ අධ්‍යාපන හෝ ආහාර අයවැය වැය නොකර ආපදාවෙන් විනාශ වූ සුරැකුම් වැඩ උපකරණ (උදා: ජල ලිං- මුළුතැන්ගෙයි උපකරණ හෝ ආබාධිත සහායක මෙවලම්) ප්‍රතිස්ථාපනය කිරීමට විශේෂ ප්‍රදානයන් හඳුන්වා දිය යුතුය.

# ප්‍රතිපත්තිමය නිර්දේශ

### 1. ආපදා කළමනාකරණය සහ පාලනය ශක්තිමත් කිරීම

- 2005 අංක 13 දරන ආපදා කළමනාකරණ පනත ප්‍රතිසංස්කරණය කිරීම: රැකබලා ගන්නන් සහ විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන් සඳහා වූ විධිවිධාන පැහැදිලිවම ඇතුළත් වන පරිදි නීති පද්ධතිය යාවත්කාලීන කළ යුතුය. එහිදී "අවශ්‍යතා මත පදනම් වූ තක්සේරු" යනු හුදෙක් ආපදාවකට ප්‍රතිචාර දැක්වීමක් පමණක් නොව ස්ත්‍රීන් දැනටමත් දරන රැකවරණ බර සැලකිල්ලට ගන්නා ක්‍රියාවලියක් බව සහතික කළ යුතුය.
- සුරැකුම් සංවේදී පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධති (EWS) ස්ථාපිත කිරීම: ප්‍රධාන මාර්ගවලින් ඔබ්බට හුදෙකලා වූ නිවෙස් කරා පවා තොරතුරු ගලා යන පද්ධති සැලසුම් කළ යුතුය මෙහිදී පවුල් සෞඛ්‍ය සේවා නිලධාරීනියන් සහ ප්‍රාදේශීය ජාල භාවිත කරමින් දරුවන් හෝ වැඩිහිටියන් රැකබලා ගන්නා "කාල දරිද්‍රතාවයෙන්" පෙළෙන ස්ත්‍රීන් වෙත තොරතුරු ලැබෙන බව සහතික කළ යුතුය.
- දේශගුණික ආයතන සඳහා අනිවාර්ය කෝටා ක්‍රමයක් හඳුන්වා දීම: ප්‍රාදේශීය සහ ජාතික මට්ටමේ දේශගුණික තීරණ ගැනීමේ මණ්ඩලවල ග්‍රාමීය සමුපකාර වතු වෘත්තීය සමිති සහ ආබාධිත පුද්ගලයන් රැකබලා ගන්නා ස්ත්‍රීන්ගේ නියෝජනය අනිවාර්ය කළ යුතුය.

### 2. දේශගුණික ඔරොත්තු දෙන යටිතල පහසුකම් සඳහා ආයෝජනය කිරීම

- ප්‍රාදේශීය ජල සහ බලශක්ති සුරක්ෂිතතාවයට ප්‍රමුඛතාවය: දීම විශේෂයෙන් මොණරාගල වැනි දිගුකාලීන නියඟයන්ට මුහුණ දෙන දිස්ත්‍රික්කවල සූර්ය බලයෙන් ක්‍රියා කරන ගම්මාන ළිං සහ නල ජල පද්ධති සඳහා ආයෝජනය කළ යුතුය එමඟින් ජලය සෙවීම සඳහා ස්ත්‍රීන් දිනකට වැය කරන පැය 1-3 ක කාලය ඉතිරි කර ගත හැකිය.
- ආබාධිත හිතකාමී සහන මධ්‍යස්ථාන ඉදිකිරීම: සියලුම තාවකාලික නවාතැන් සහ ඉවත් කිරීමේ මධ්‍යස්ථාන ප්‍රවේශ විය හැකි සනීපාරක්ෂක පහසුකම්, පෞද්ගලික රැකවරණ අවකාශයන් සහ නිදන්ගත රෝග සඳහා අවශ්‍ය ඖෂධවලින් සමන්විත විය යුතුය එමඟින් අනාරක්ෂිත නිවසක් හෝ පහසුකම් නොමැති නවාතැන්පලක් අතර තෝරා ගැනීමක් කිරීමට රැකබලා ගන්නන්ට සිදුවන පීඩනය වළක්වා ගත හැකිය.
- පොදු රැකවරණ පහසුකම් සංවර්ධනය කිරීම: දේශගුණික ඔරොත්තු දීමේ හැකියාව ඇති ළමා සුරැකුම් සහ වැඩිහිටි සුරැකුම් මධ්‍යස්ථාන ජාතික සංවර්ධන ප්‍රතිපත්තිවලට ඇතුළත් කළ යුතුය. එවිට ආපදා අවස්ථාවලදී වෘත්තීය සහාය ලබා දීම හරහා ස්ත්‍රීන්ට ඇති බර අඩු කළ හැකිය.

### 3. ආර්ථික සහ සමාජ ආරක්ෂණය

- අනුවර්තන සමාජ ආරක්ෂණ ක්‍රමවේද ක්‍රියාත්මක කිරීම :අධික තාපය හෝ ගංවතුර වැනි ආපදාවලදී ස්වයංක්‍රීයව ක්‍රියාත්මක වන "දේශගුණික රැකවරණ" මුදල් හුවමාරු ක්‍රමවේදයක් සකස් කළ යුතුය. එමඟින් ඖෂධ, පිරිසිදු ජලය සහ විනාශ වූ ජීවනෝපාය මෙවලම් අලුත්වැඩියා කිරීමට අවශ්‍ය අමතර වියදම් (දේශගුණික බද්ද) පියවා ගැනීමට ස්ත්‍රීන්ට සහාය විය හැකිය.
- අවිධිමත් අංශයේ සේවකයන් සඳහා ජීවනෝපාය ප්‍රතිසාධන ප්‍රදාන ආපදාවලදී අහිමි වන උපකරණ නැවත ලබා ගැනීමට අවිධිමත් අංශයේ නියැලෙන ස්ත්‍රීන්ට ණය වෙනුවට සෘජු ප්‍රදානයන් ලබා දිය යුතුය එමඟින් ඔවුන් අධික පොලී ණය උගුල්වලට හසු වීම වළක්වා ගත හැකිය.
- ජාතික සංඛ්‍යාලේඛනවලට රැකවරණ සේවාව ඇතුළත් කිරීම: දේශගුණික සිදුවීම්වලදී වැටුප් රහිත සුරැකුම් වැඩ ශ්‍රමය ඉහළ යන ආකාරය මැන බැලීම සඳහා නිතිපතා "කාල-භාවිත සමීක්ෂණ" පවත්වන ලෙස ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවට බලතල ලබා දිය යුතුය.

### 4. සෞඛ්‍යය සහ සාක්ෂරතාවය

- ගංවතුර අවදානම් සහිත සහ දුෂ්කර ප්‍රදේශවල ජංගම සෞඛ්‍ය සායන ව්‍යාප්ත කිරීමමෙහිදී "සුරැකුම් කටයුතු කරන්නන්ගේ සෞඛ්‍යය" කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් ස්ත්‍රීන් තම වගකීම් නිසා නොසලකා හරින චර්ම රෝග සහ ශ්වසන ආබාධ සඳහා ප්‍රතිකාර ලබා දිය යුතුය.
- ජාතික දේශගුණික සාක්ෂරතා වැඩසටහනක් දියත් කිරීම අධික උෂ්ණත්වය පාලනය කිරීම, ජල පිරිපහදුව සහ ආපදා සූදානම පිළිබඳ ප්‍රායෝගික දැනුම ලබා දෙන ස්ත්‍රී පුරුෂ සමාජභාවී වැඩසටහනක් හඳුන්වා දිය යුතුය එමඟින් පවුලේ පැවැත්ම කළමනාකරණය කිරීමේදී ඇතිවන මානසික බර අඩු කළ හැකිය.

# තොරතුරු මූලාශ්‍ර


- Abeywardhana, D. M. Y. (2024). Climate Change and Socio-economic Issues in Sri Lanka: An Assessment of Landslide-Induced Relocations in Aranayake. In Climate-Related Human Mobility in Asia and the Pacific: Interdisciplinary Rights-Based Approaches (pp. 241-260). Singapore: Springer Nature Singapore.
- Addati, L., Cattaneo, U., Esquivel, V., & Valarino, I. (2018). Care work and care jobs for the future of decent work. ILO.
- Alahakoon, N., & Edirisinghe, M. (2021). Spatial variability of rainfall trends in Sri Lanka from 1989 to 2019 as an indication of climate change. ISPRS International Journal of Geo-Information, 10(2), 84. https://doi.org/10.3390/ijgi10020084
- Alahakoon, N., Zubair, L., Samarasinghe, H., & Kulasooriya, D. (2022). Heat stress in Sri Lanka is on the rise to dangerous levels for larger share of population due to climate change. In AGU Fall Meeting Abstracts (Vol. 2022, pp. GH26A-03).
- Arambegedara, C., & Nwankwo, N. (2025). Application of GIS as a Sustainable Urban Planning Tool for Flood Management: A Case Study of Gampaha District, Sri Lanka (No. EGU25-2). Copernicus Meetings.
- Arambepola, C., & Romeshun, K. (2019). Debt at My Doorstep: Microfinance Practices and Effects on Women in Sri Lanka. https://www.cepa.lk/wp-content/uploads/2020/10/2019-Arambepola-and-Romeshun-Debt-at-My-Doorstep-WPS-30.pdf
- Arulingam, I., de Silva, S., Samarasekara, V., & Ravindranath, D. (2024). Climate change and a national economic crisis are overworking rural women in Sri Lanka. IWMI. https://www.iwmi.org/blogs/climate-change-and-a-national-economic-crisis-are-overworking-rural-women/
- Asian Development Bank. (2023). Country Partnership Strategy: Sri Lanka, 2024–2028. ADB. https://www.adb.org/sites/default/files/linked-documents/cps-sri-2024-2028-ccp.pdf
- Asian Development Bank & World Bank Group. (2020). Climate Change Risk: Country Profile. https://www.adb.org/publications/climate-risk-country-profile-sri-lanka
- Attanayake, D. (2024). Domestic violence is cost of climate change for Sri Lankan women. Context News. https://www.context.news/climate-risks/domestic-violence-is-cost-of-climate-change-for-sri-lankan-women
- Bradshaw, S., & Linneker, B. (2014). Gender and environmental change in the developing world (Working Paper). International Institute for Environment and Development (IIED). https://pubs.iied.org/14633IIED
- Carr, R., Kotz, M., Pichler, P. P., Weisz, H., Belmin, C., & Wenz, L. (2024). Climate change to exacerbate the burden of water collection on women's welfare globally. Nature Climate Change, 14(7), 700-706.
- Choden, T. (2024). Gender-Transformative Climate Literacy: A Policy Framework for a More Green and Resilient Bhutan. Policy Brief. Echidna Global Scholars Program. Center for Universal Education at The Brookings Institution.
- Connelly, R., & Kongar, E. (2017). Feminist approaches to time use. In Gender and time use in a global context: The economics of employment and unpaid labour (pp. 1-26). New York: Palgrave Macmillan US.
- De Alwis, D., & Noy, I. (2019). The cost of being under the weather: Droughts, floods, and health-care costs in Sri Lanka. Asian Development Review, 36(2), 185-214. https://doi.org/10.1162/adev_a_00134
- Department of Census and Statistics Sri Lanka. (2020). SRI LANKA TIME USE SURVEY FINAL REPORT - 2017. http://www.statistics.gov.lk/PressReleases/TUS_FinalReport_2017
- Department of Census and Statistics. (2024). Sri Lanka Labour Force Survey Annual Report - 2023. https://www.statistics.gov.lk/Resource/en/LabourForce/Annual_Reports/LFS2023.pdf

- Disaster Management Centre. (2017). National Emergency Operation Plan https://www.dmc.gov.lk/images/pdfs/NEOP/NEOP_English.pdf
- Dissanayaka, M. L. S., & Sangasumana, P. (2017). Issues and challenges of urban flood hazard management in North Colombo Region (A case study of 2016 Flood Affected Kolonnawa Urban Council). International Journal of Scientific and Research Publications, 7(10), 310.
- Eckstein, D., Hutfils, M. L., & Winges, M. (2018). Global climate risk index 2019: Who suffers most from extreme weather events? Germanwatch. https://www.germanwatch.org/en/cri
- Emmanuel, R., Jalal, M., Ogunfuyi, S., Maharoof, N., Zala, M., Perera, N., & Ratnayake, R. (2023). Urban heat risk: protocols for mapping and implications for Colombo, Sri Lanka. Atmosphere, 14(2), 343.
- Fernando, G. M. T. S. (2018). Identification of Urban Heat Islands &Its Relationship withVegetation Cover: A Case Study of Colombo & Gampaha Districts in Sri Lanka. Journal of Tropical Forestry and Environment, 8(2).
- FloodList. (2020). Sri Lanka – Storms Leave 3 Dead, Flooding in Gampaha h https://floodlist.com/asia/sri-lanka-floods-gampaha-september-2020 .
- GERMANWATCH. (2025). Who suffers most from extreme weather events? Published by germanwatch Climate Risk Index 2025. https://www.germanwatch.org/sites/default/files/2025-02/Climate%20Risk%20Index%202025.pdf
- Government of Sri Lanka. (2005). Disaster Management Act No. 13 of 2005.
- Gunawardena, M. (2024). 3 Reasons Why Sri Lanka Should Consider Gender in Climate Finance. Centre for A Smart Future. https://www.csf-asia.org/3-reasons-why-sri-lanka-should-consider-gender-in-climate-finance/
- Ho, E. W., Strohmeier-Breuning, S., Rossanese, M., Charron, D., Pennise, D., & Graham, J. P. (2021). Diverse Health, Gender and Economic Impacts from Domestic Transport of Water and Solid Fuel: A Systematic Review. International Journal of Environmental Research and Public Health, 18(19), 10355. https://doi.org/10.3390/ijerph181910355
- Igoor. (2024). Sri Lanka Climate Risks and Impacts: A Research Compendium. Centre for a Smart Future https://www.csf-asia.org/wp-content/uploads/2024/11/20241125_NCF_CERisks_Dataset_Final_Combined.pdf
- ILO & FAO. (2021). Extending social protection to rural populations, ILO and FAO, Geneva. Available at: Extending social protection to rural populations (fao.org)
- ILO.  (2020). World Social Protection Report 2020–2. Available at: https://www.ilo.org/wcmsp5/groups/public/@ed_protect/@soc_sec/documents/publication/wcms_817572.pdf
- International Labour Organization. (2022). Just Transition Policy Brief Key messages Gender equality, labour and a just transition for all. https://www.ilo.org/sites/default/files/wcmsp5/groups/public/@ed_emp/@emp_ent/documents/publication/wcms_860569.pdf
- International Labour Organization. (2023). The care economy and decent work in Sri Lanka: Opportunities, challenges and future trends International Labour Organization. ILO. https://www.ilo.org/publications/care-economy-and-decent-work-sri-lanka-opportunities-challenges-and-future
- International Labour Organization. (2024). The care economy and decent work in Sri Lanka: Opportunities, challenges and future trends. ISBN: 9789220402139 https://www.ilo.org/publications/care-economy-and-decent-work-sri-lanka-opportunities-challenges-and-future
- Institute for Policy Studies (IPS). (2019). Greater Social Protection for Sri Lankan Women through Better Jobs: Role of Technology and Innovation https://www.ips.lk/talkingeconomics/2019/03/08/3844/

- Intergovernmental Panel for Climate Change. (2022). Climate Change 2022: Impacts, Adaptation and Vulnerability - Working Group II Contribution to the Sixth Assessment Report of the Intergovernmental Panel on Climate Change. https://www.ipcc.ch/report/ar6/wg2/
- International Development Research Centre. (2024). Recognizing women's unpaid care work for food security and climate resilience https://idrc-crdi.ca/en/research-in-action/recognizing-womens-unpaid-care-work-food-security-and-climate-resilience
- International Labour Organisation. (2024). Climate change and financing a just transition. https://www.ilo.org/climate-change-and-financing-just-transition
- International Labour Organization. (2024). The care economy and decent work in Sri Lanka: Opportunities, challenges and future trends. International Labour Organization
- Jayasinghe, N. T., Dammalage, T. L. (2019). Land-Use Change and Its Impact on Urban Flooding: A Case Study on Colombo District Flood on May 2016. Engineering, Technology and Applied Science Research. 9(2), p. 3887-3891, https://doi.org/10.48084/etasr.2578
- Kottegoda, S., & Peiris, P. (2023). Recognising Unpaid Care Work in Sri Lanka: Key Research Findings from Six Districts. WORKING HOURS, 25.
- Krinner, M., Shongwe, C., Tebaldi, A. J., Weaver, C. P., & Wehner, M. (2013). Long-term climate change: Projections, commitments and irreversibility. In T. F. Stocker, D. Qin, G.-K. Plattner, M. Tignor, S. K. Allen, J. Boschung, A. Nauels, Y. Xia, V. Bex, & P. M. Midgley (Eds.), Climate change 2013: The physical science basis. Contribution of Working Group I to the Fifth Assessment Report of the Intergovernmental Panel on Climate Change (pp. 1111–1150). Cambridge University Press.
- Kwauk, C., Cooke, J., Hara, E., & Pegram, J. (2019). Girls' education in climate strategies. Opportunities for improved policy and enhanced action in nationally determined contributions (Tech. Rep.).
- Liyanarachchi, T. (2024). Building Flood Resilience in Sri Lanka's Fashion and Apparel Sector: Insights from Biyagama. SLYCAN Trust. https://www.slycantrust.org/post/building-flood-resilience-in-sri-lankas-fashion-and-apparel-sector-insights-from-biyagama#:~:text=The%20Kelani%20River%2C%20one%20of,Flood%20vulnerabilities%20surrounding%20Biyagama%20FTZ
- Macgregor, S., Arora-Jonsson, S., & Cohen, M. (2022). Caring in a changing climate Centering care work in climate action. Oxfam. https://webassets.oxfamamerica.org/media/documents/cc_and_care_final_updates_for_pub.pdf
- Ministry of Environment. (2020). National Drought Plan for Sri Lanka.
- Ministry of Environment. (2025). NATIONALLY DETERMINED CONTRIBUTIONS 3.0 (2026 -2035) SRI LANKA. Climate Change Secretariat.
- Mombeur, D., & Wijenayake, V. (2020). CLIMATE CHANGE and HUMAN MOBILITY in SRI LANKA Policies, Laws, and Processes. SLYCAN Trust. https://environmentalmigration.iom.int/sites/g/files/tmzbdl1411/files/documents/2023-11/policy-brief-climate-change-and-human-mobility-in-sri-lanka.pdf
- Muchhala, B. (2024). A Feminist Political Economy Lens Towards Equity and Justice in the Global South. Third World Network
- Munasinghe, V., & Wijesinghe, D. (2019). The Future Foreclosed Women trapped in endless indebtedness in Sri Lankan rural economy. Law and Society Trust. https://lst.lk/wp-content/uploads/2025/04/The-Future-Foreclosed-English.pdf
- Mustafa, M. (2025). Sri Lanka After Cyclone Ditwah: The Full Scale of the Disaster in Numbers. Daily Mirror https://www.dailymirror.lk/breaking-news/Sri-Lanka-After-Cyclone-Ditwah-The-Full-Scale-of-the-Disaster-in-Numbers/108-327523

- Nanayakkara, S., Wang, W., Cao, J., Wang, J., & Zhou, W. (2023). Analysis of urban heat island effect, heat stress and public health in Colombo, Sri Lanka and Shenzhen, China. Atmosphere, 14(5), 839.
- Notre Dame Global Adaptation Initiative. (2024). ND-GAIN Country Index. https://gain.nd.edu/our-work/country-index/rankings/
- OECD/ILO. (2019). Tackling vulnerability in the informal economy. Development Centre Studies, OECD Publishing. https://doi.org/10.1787/939b7bcd-en
- OXFAM. (2022). Caring in a changing climate: Centering care work in climate action.
- Parsons, E. S., Jowell, A., Veidis, E., Barry, M., & Israni, S. T. (2024). Climate change and inequality. Pediatric research, 1-8.
- Perera, I., & Perera, M. (2025). HEAT STRESS IN COLOMBO: UNDERSTANDING IMPACTS AND PLANNING FOR THE FUTURE. Colombo Urban Lab.
- Piratheeparajah, N., & Dhanushan, K. (2024). Climate Change in Sri Lanka's Central Province: A Comprehensive Analysis of Multiple Models Across Various Shared Socio-Economic Pathways.
- Ranagalage, M., Estoque, R. C., & Murayama, Y. (2017). An urban heat island study of the Colombo metropolitan area, Sri Lanka, based on Landsat data (1997–2017). ISPRS International Journal of Geo-Information, 6(7), 189.
- Ratwatte, L. (2023). Converging crises and the cost of exclusion: unveiling the invisible women of Sri Lanka's economy. Journal of International Women's Studies, 25(3), 3.
- ReliefWeb. (2024). Sri Lanka - Monsoon Flood 2024, DREF Operation MDRLK020. https://reliefweb.int/report/sri-lanka/sri-lanka-monsoon-flood-2024-dref-operation-mdrlk020.
- Rodgers, Y. V. D. M. (2023). TIME POVERTY: CONCEPTUALIZATION, GENDER DIFFERENCES, AND POLICY SOLUTIONS. Social Philosophy and Policy, 40(1), 79–102. doi:10.1017/S0265052523000389
- Rost, L., Bates, K., & Lombardini, S. (2015). Women's economic empowerment and care: Evidence from the WE-Care baseline survey (Oxfam Research Report). Oxfam GB. policy-practice.oxfam.org
- Samarasinghe, J. T., Makumbura, R. K., Wickramarachchi, C., Sirisena, J., Gunathilake, M. B., Muttil, N., Teo, F. Y., & Rathnayake, U. (2022). The Assessment of Climate Change Impacts and Land-use Changes on Flood Characteristics: The Case Study of the Kelani River Basin, Sri Lanka. Hydrology, 9(10), 177. https://doi.org/10.3390/hydrology9100177
- Sarker, M., & Puskur, R. (2022). Climate change and time poverty trap women in a vicious cycle. https://www.irri.org/news-and-events/news/climate-change-and-time-poverty-trap-women-vicious-cycle
- Sitko, N., Cavatassi, R., Stafferi, I., Heesemann, E., Rossi, J. M., Valbuena, L. B., Rajagopalan, P., Kluth, J., & Azzarri, C. (2024). The unjust climate: Measuring the impacts of climate change on rural poor, women and youth. Food and Agriculture Organization of the United Nations.
- SLYCAN Trust. (2020). Policy brief: Climate change and human mobility in Sri Lanka. Policies, laws and processes. International Organization for Migration. https://environmentalmigration.iom.int/sites/g/files/tmzbdl1411/files/documents/2023-11/policy-brief-climate-change-and-human-mobility-in-sri-lanka.pdf
- SLYCAN Trust. (n.d.). Understanding Provincial-Level Climate Vulnerabilities in Sri Lanka https://www.slycantrust.org/blog-posts-knowledge/understanding-provincial-level-climate-vulnerabilities-in-sri-lanka#:~:text=In%20summary%2C%20the%20major%20climate,annual%20and%20perennial%20crop%20cultivation.
- Sumaiya, M. S. P., Ruzaik, F., & Hasmath, M. J. J. (2025). Urban Heat Island phenomenon in Colombo: An analysis of its causes, impacts, and mitigation strategies. University of Colombo Review, 6(1).

- The Economist. (2025). "It is time for adaptation literacy": climate education must incorporate lived experience. https://impact.economist.com/energy-environment/it-is-time-for-adaptation-literacy-climate-education-must-incorporate-lived-experience
- The Intergovernmental Panel on Climate Change. (2014). Climate Change 2014 Synthesis Report. https://climateknowledgeportal.worldbank.org/country/sri-lanka/vulnerability#:~:text=The%20most%20frequent%20natural%20hazards,%2C%20cyclones%2C%20and%20coastal%20erosion.
- The Morning. (2025). Sri Lanka launches national plan to build fair and inclusive care system https://www.themorning.lk/articles/UiJFRqH7vgKaEhJ2s4R2
- Tschakert, P., Van Oort, B., St. Clair, A. L., & LaMadrid, A. (2013). Inequality and transformation analyses: a complementary lens for addressing vulnerability to climate change. Climate and Development, 5(4), 340-350.
- UNICEF. (2023). How Gender-responsive Age-sensitive Social Protection is Related to the Climate Crisis: A summary of the evidence https://www.unicef.org/innocenti/reports/how-gender-responsive-age-sensitive-social-protection-related-climate-crisis
- UN Women (2022). Explainer: How Gender Inequality and Climate Change are Interconnected. https://www.unwomen.org/en/newsstories/explainer/2022/02/explainer-how-gender-inequality-and-climate-change-areinterconnected#:~:text=As%20climate%20change%20drives%20conflict
- UN Women. (2017). Action not words: Time to shift the balance toward gender equality in disaster risk reduction. UN Women Asia and the Pacific. https://asiapacific.unwomen.org/sites/default/files/Field%20Office%20ESEAsia/Docs/Publications/2017/04/CCDRR_130317-s.pdf
- UN Women. (2025). Counting what truly counts: Valuing supervisory care as the invisible engine of inclusive economies https://data.unwomen.org/publications/counting-what-truly-counts-supervisory-care
- UN Women. (2023). THE CLIMATE-CARE NEXUS: ADDRESSING THE LINKAGES BETWEEN CLIMATE CHANGE AND WOMEN'S AND GIRLS' UNPAID CARE, DOMESTIC AND COMMUNAL WORK https://www.unwomen.org/en/digital-library/publications/2023/11/working-paper-the-climate-care-nexus-addressing-the-linkages-between-climate-change-and-womens-and-girls-unpaid-care-domestic-and-communal-work
- UNCCD. (2022). Study on the differentiated impacts of desertification, land degradation and drought on women and men. https://www.unccd.int/sites/default/files/2022-05/SDM_ENGLISH_webfile.pdf
- UNDP Sri Lanka. (2023). Understanding Multidimensional Vulnerabilities: Impact on People of Sri Lanka. https://www.undp.org/sites/g/files/zskgke326/files/2023-10/undp_multidimensional_vulnerability_report_sri_lanka.pdf
- UNDP. (2024). Climate Vulnerability Risk Assessment in Uva Province and Guidance for Capacity Development of Local Governments on Assessing Climate Change Vulnerability. https://www.undp.org/srilanka/publications/climate-vulnerability-risk-assessment-uva-province-and-guidance-capacity-development-local-governments-assessing-climate
- UNFPA, 2025. "Gendered Vulnerabilities to Climate Change in Sri Lanka in the Context of the Economic Crisis." Colombo: UNFPA
- United Nations Convention to Combat Desertification. (2022). THE DIFFERENTIATED IMPACTS OF DESERTIFICATION, LAND DEGRADATION AND DROUGHT ON WOMEN AND MEN. https://www.unccd.int/resources/publications/study-differentiated-impacts-desertification-land-degradation-and-drought

- United Nations Development Program - Independent Evaluation Office. (2022). FORMATIVE EVALUATION OF THE INTEGRATION BY UNDP OF THE PRINCIPLES OF LEAVING NO ONE BEHIND"
- United Nations Development Program. (2024). 15 Government Ministries come together to take stock of Sri Lanka's progress on Nationally Determined Contributions (NDCs) with UNDP support. https://www.undp.org/srilanka/press-releases/15-government-ministries-come-together-take-stock-sri-lankas-progress-nationally-determined-contributions-ndcs-undp-support
- United Nations Family Planning Association. (2024). Gender and Climate Change in Sri Lanka. https://srilanka.unfpa.org/en/publications/gender-and-climate-change-sri-lanka
- United Nations Sri Lanka. (2023). Fact sheet: Climate Change Impact in Sri Lanka. https://srilanka.un.org/en/254230-fact-sheet-climate-impact-sri-lanka
- Warakapitya, K. (2024). Half-built Kadawatha to Mirigama expressway landfill worsens flooding. Sunday Times https://www.sundaytimes.lk/241020/news/half-built-kadawatha-to-mirigama-expressway-landfill-worsens-flooding-574818.html
- Weerasinghe, T. (2025). Sri Lanka gears up to refine climate commitments with Nationally Determined Contributions. Sunday Times. https://www.sundaytimes.lk/250105/news/sri-lanka-gears-up-to-refine-climate-commitments-with-nationally-determined-contributions-583802.html
- Women, U. N. (2023). The Climate–Care Nexus: Addressing the Linkages Between Climate Change and Women's and Girls' Unpaid Care, Domestic and Communal Work. New York.
- World Bank. (2024). Sri Lanka's Economy Shows Signs of Stabilization, but Poverty to Remain Elevated. World Bank. https://www.worldbank.org/en/news/press-release/2024/04/01/sri-lanka-s-economy-shows-signs-of-stabilization-but-poverty-to-remain-elevated
- World Bank Group. (2023). Equalizing Opportunities: Women in Regional Trade in South Asia https://www.worldbank.org/en/events/2023/04/27/equalizing-opportunities-women-in-regional-trade-and-entrepreneurship-in-south-asia
- World Food Programme. (2021). Gender & Risk Finance: The transformative power of women. https://docs.wfp.org/api/documents/WFP-0000124690/download/?_ga=2.60147886.202029517.1645446172-70728959.1645446172
- World Health Organisation. (2024). Fair share for health and care: gender and the undervaluation of health and care work







WMC
කාන්තාව සහ මාධ්‍ය සාමූහිකය
பெண்கள் மற்றும் ஊடகக் கூட்டமைப்பு
Women and Media Collective
Established 1984


**කාන්තාව සහ මාධ්‍ය සාමූහිකය**

56/1, සරසවි පටුමග, කාසල් වීදිය,
කොළඹ 08, ශ්‍රී ලංකාව.

දුරකථන: + 94-11-2690201 / 5632045 / 5635900
ෆැක්ස්: +94-11-2690192
විද්‍යුත් ලිපිනය : wmcsrilanka@womenandmedia.org